# ප්‍රජාශක්ති

2024



ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා
පර්යේෂණ ආයතනය

*RDTRI*

# ප්‍රජාශක්ති

අර්ධ වාර්ෂික ප්‍රකාශනය

## 2024 දෙවන කලාපය


ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය
ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

අංක 24/4,
කාසල් විදිය,
කොළඹ 08

දුරකථන :- 011 269 5579
ෆැක්ස් :- 011 269 6592
වෙබ් :- www.rdtri.gov.lk


**උපදේශකත්වය**

**තිලිණි සුරංගිකා කරස්නාගොඩ**
අධ්‍යක්ෂ
ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

**ඩබ්ලිව්.කේ.එන්.එන්.කෞෂල්‍යා**
නියෝජ්‍ය අධ්‍යක්ෂ
ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

**එම්.එස්.එස්. නස්ලි**
නියෝජ්‍ය අධ්‍යක්ෂ
ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

**සංස්කරණය**

**ප්‍රියශාන්ත කාරියවසම්**
පුහුණු හා පර්යේෂණ නිලධාරි
**ඩී.ඒ.පී.දාස්වත්ත**
පුහුණු හා පර්යේෂණ නිලධාරි
**කේ.එම්.ජී.සමරසේන**
පුහුණු හා පර්යේෂණ නිලධාරි
**එස්.ඩී.අල්ගම**
පුහුණු හා පර්යේෂණ නිලධාරි
**ඒ.එන්.විතානගේ**
සංවර්ධන නිලධාරි
**එස්.බී.එන්.මල්ෂානි ආනන්ද**
සංවර්ධන නිලධාරි
ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

**විද්‍යුත් මාධ්‍යගත කිරීම**

**පී.ඒ. චිත්‍රා ජයසිංහ**
පුහුණු හා පර්යේෂණ නිලධාරි
ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

**පිටකවරය**

**ඒ.එන්.විතානගේ**
සංවර්ධන නිලධාරි

**ප්‍රකාශනය**


ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය
අංක 24/4,
කාසල් විදිය,
කොළඹ 08

## අධ්‍යක්ෂගේ පණිවිඩය

1970 දශකය වන විට ශ්‍රී ලංකාව මෙන් ම යටත් විජිත පාලනයෙන් මිදුණු බොහෝ ආසියාතික රටවල ප්‍රධාන ගැටලුවවී තිබුණේ දුප්පත්කම හා බැඳුණු අභියෝගයන්ය. යටත්විජිත වාණිජ කෘෂිකර්මාන්තය මත පදනම්වූ ශ්‍රී ලාංකීය ජන සමාජය තුළ දරිද්‍රතාව, අගහිඟකම හා සමාජ ආර්ථික විෂමතාව උපරිම මට්ටමට ලඟාවී පැවති අතර, ඒ සඳහා විසඳුම් ලෙස විවිධ ආර්ථික සාධනයට උපකාරී වන සමාජ සුබසාධන වැඩසටහන් හා යටිතල පහසුකම් රාජ්‍ය යාන්ත්‍රණය පෙරටුකරගත් ව්‍යුහයන් ඔස්සේ සපුරා තිබුණි. නමුත් සහනාධාර වෙනුවෙන් රජයට අඛණ්ඩව දැරීමට සිදු වූ අධික පිරිවැය, විදේශ ණය, ගෙවීම් ශේෂ ගැටලුව, දේශීය නිෂ්පාදනය පහළ මට්ටමක පැවතීම, දරිද්‍රතාව, අධික ජනගහන වර්ධනය, සේවා වියුක්තිය, තරුණ අසහනය සහ සමාජ කැළඹිලි උච්චස්ථානයට පැමිණ තිබුණි. මෙම තත්ත්වය ශ්‍රී ලංකාවට පමණක් සුවිශේෂ වූවක් නොව, දකුණු ආසියාව, ශාන්තිකර හා පැසිපික් කලාපයේ පොදු තත්ත්වයක් බැවින්, මීට විසඳුම් සෙවීමේ නව මානයක අවශ්‍යතාවය පැන නැගී තිබුණි.

එබැවින් බොහෝ ආසියාතික රටවල් හා සමාජ විද්‍යාඥයින් නව සංවර්ධන ප්‍රවේශයක් හඳුනා ගැනීමේ අත්හදාබැලීම් සිදුකරමින් සිටි අතර ස්වශක්තිය හා සහභාගිත්වය පදනම් කරගත් සහභාගිත්ව සංවර්ධන ක්‍රමවේදය සංවර්ධනය සඳහා සුදුසුම නව ක්‍රමවේදය බව හඳුනා ගන්නා ලදී. මෙම ක්‍රමවේදය භාවිතයට ගනිමින් 1978 අගෝස්තු 28 දින විපර්යකාරක වැඩසටහන (Change agent program) කාර්ය බද්ධ පර්යේෂණයක් ලෙස ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේදී ආරම්භ විය. මෙම වැඩසටහන හා සමගාමීව දකුණු ආසියාවේ රටවල් (ඉන්දියාව, බංග්ලාදේශය, තායිලන්තය) කිහිපයකම විවිධ පර්යේෂණාත්මක වැඩසටහන් දියත් කෙරිණි.

ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයෙන් ආරම්භ කරන ලද සහභාගිත්ව සංවර්ධන ක්‍රමවේදය වර්තමානය වනවිට ජනසවිය වැඩසටහන, සමෘද්ධි වැඩසටහන, සණස වැඩසටහන වැනි ප්‍රධාන රාජ්‍ය වැඩසටහන් මෙන්ම රාජ්‍ය නොවන සංවිධානයන්හි සංවර්ධන වැඩසටහන් සඳහාද ගලපාගෙන ක්‍රියාත්මක කරනු ලබයි.

2024 වසර වන විට ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය පිහිටුවා වසර 50 ක් ඉකුත් වී ඇති අතර විපර්යකාරක වැඩසටහන ක්‍රියාත්මක වී වසර 46 ක් ගත වී ඇත. ප්‍රකාශන අංශය විසින් එම දිනයද සිහිපත් කරමින් මෙවර අර්ධ වාර්ෂික ප්‍රජාශක්ති සඟරාව ප්‍රකාශනයට පත් කිරීමට ගත් උත්සාහය මා විසින් ඉතා අගයකොට සළකමි.

# සංස්කාරක සටහන

දිළිඳුකම පිටුදැකීම සඳහා ශක්තිමත් සුවිශේෂී නව සංවර්ධන ක්‍රමවේදයක් ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය විසින් 1978 වසරේදී හඳුන්වා දී ඇත. එය මෙරට සංවර්ධන ක්ෂේත්‍රයට හඳුන්වා දුන් සමාජ සජීවිකරණ වැඩසටහන හෙවත් සහභාගිත්ව සංවර්ධන ක්‍රමවේදය විය. මෙම ක්‍රමවේදය අඩු -වැඩි වශයෙන් භාවිතා කරමින් වසර 46 ක් පුරා අඩු ආදායම්ලාභී ප්‍රජාව සවිබලගන්වමින් දිළිඳුකම අවම කිරීමට ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය තුළින් බිහිවූ ප්‍රජාශක්ති සංවිධාන මෙන්ම රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන රැසක් සමත් වී ඇත.

මෙම ක්‍රමවේදය තුළින් තම පවුලෙත්, ගමෙත්, රටෙත් සංවර්ධනයට බාධා කරන අවාසිදායක සමාජ ආර්ථික බලවේගයන් ගැඹුරින් හඳුනාගෙන ඒවාට එරෙහිව සංවිධානය වී සාමූහික ක්‍රියාකාරකම් තුළින් විසඳුම් සෙවීමට කටයුතු කිරීම සිදු වේ. මෙය පහසු කටයුත්තක් නොවන අතර පරම්පරා ගණනාවක් පැවති සෘණ ආකල්පවල එල්බගෙන සිටින පිරිස් ධනාත්මක ආකල්පමය වෙනසක් ඇති කර සාමූහික ක්‍රියාදාමයකට යොමු කර ගැනීම අතිශය දුෂ්කර කටයුත්තකි. එය ඉටු කර ගත හැක්කේ සහභාගිත්ව සංවර්ධන ක්‍රමවේදය තුළිනි.

ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය මගින් සහභාගිත්ව සංවර්ධන ක්‍රමවේදය හැදෑරූ නිර්මාණශීලි, සුවිශේෂී ගති ලක්ෂණ ඇති මැදිහත්කරුවන් පුහුණු කර මෙම ක්‍රමවේදය ව්‍යාප්තකර සංවර්ධන අභිලාෂී ප්‍රජාව සවිබල ගන්වා දිළිඳුකම පිටු දැකීම ප්‍රධාන අරමුණ වේ. ඒ සඳහා ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය පුහුණු, පර්යේෂණ හා ප්‍රකාශන යන අංශ ඔස්සේ එම මෙහෙවර ඉටු කරනු ලබයි. ඒ අනුව මෙවර විපර්යකාරක දිනය හා මාර්තු 08 දිනට ආයතනයට වසර 50 ක් පිරීම හේතුකොටගෙන විපර්යකාරක දින සැමරුම සිහිපත් කරනු ලබයි. මෙහිදී සහභාගිත්ව සංවර්ධන ක්‍රමවේදය යොදා ගනිමින් දිළිඳුකම අවමකරගත් රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානවල අත්දැකීම් පිළිබඳ ලිපි ද ඇතුලත් කරමින් මෙවර කලාපයක් තුළින් සහභාගිත්ව සංවර්ධන ක්‍රමවේදය ජන ගත කිරීමට ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ ප්‍රකාශන අංශය අපේක්ෂා කරයි. මෙම කෘතියට ලිපි සපයමින් ඒ සඳහා දායකත්වය ලබාදුන් විද්වත් ලේඛකයින් පිරිස මෙම අවස්ථාවේ ප්‍රශංසනීයව අගය කරමි.

# .................. පෙළගැස්ම ..................

**01 - 10**
*ග්‍රාමසංවර්ධනය උදෙසා සමාජ සවිබල ගැන්වීම*
**සුභාෂිනී දිනූෂා අල්ගම**

**11 - 15**
*නව දැක්මක් සඳහා අත්දැකීම් හුවමාරුව: තුලනාත්මක ප්‍රවේශයක්*
**ජී. ආර්. එම්. ගම්ලත්**

**16 - 22**
*ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ ඉතිහාසය*
**පී. ඒ. චිත්‍රා ජයසිංහ**

**23 - 26**
*විපර්යකාරක වැඩසටහන*
**ඒ. එන්. විතානගේ**

**27 - 31**
*විපර්යකාරක වැඩසටහන තුලින් ගොඩනැගුණු ආසිරි මානව සංවිධානයේ ආරම්භය, විකාශය හා වර්තමාන තත්වය*
**අයි. එන්. වසන්තා ලාලනී වීරසිංහ**

**32 - 40**
*හික්කඩුව ප්‍රජාශක්ති සහභාගිත්ව සංවර්ධන පදනම*
**ටී. එච්ලින්ද සිල්වා**

**41 – 45**
*දුප්පත්කම හා පානීය ජලය*
**පියසේන වැල්ලක්කගේ**

**46 - 49**
*නූතන ලෝකයේ ග්‍රාමීය සංවර්ධනය සැලසුම් කිරීමේදී අවධානය යොමු කරන ප්‍රධාන අංශ....*
**කේ. බී. ධර්මප්‍රිය**

**50 - 53**
*ග්‍රාමීය සංවර්ධනය සහ ආහාර සුරක්ෂිතතාව ප්‍රවර්ධනය කිරීම*
**ප්‍රදීප් ලංකාපෙළ**

**54 - 60**
*ලංකාවේ ග්‍රාමීය පුනරුදය (Rural Renaissance)සඳහා කෘෂිකර්මාන්තය කෙසේ දායක කරගත හැකිද*
**එස්. එම්. යූ. බී. සමරකෝන්**

**61 – 65**
*ව්‍යවසායකත්වය මගින් ග්‍රාමීය දිළිඳුකම දුරලමු*
**කේ. එම්. ජී. සමරසේන**

**66 - 69**
*සහභාගිත්ව සංවර්ධන ක්‍රමවේදය හා එහි භාවිතය*
**ඩබ්. ආර්. එන්. පී. විජේවර්ධන**

**70 – 72**
*ග්‍රාමීය කුඩා පරිමාණ ව්‍යවසායකත්වය නඟා සිටුවීම සඳහා අත්දැකීම් හුවමාරුවේ වැදගත්කම*
**සුභානි පියසිංහ**

**73 – 77**
*පහළ බිලියනය*
*දුප්පත්ට රටවල් අසාර්ථක වන්නේ ඇයි සහ ඒ ගැන කළ හැක්කේ කුමක්ද*
**ආනන්ද ප්‍රේමසිරි**

# 01. ග්‍රාමසංවර්ධනය උදෙසා සමාජ සවිබල ගැන්වීම (ප්‍රජා සවිබල ගැන්වීම/ සහභාගීත්ව සංවර්ධනය)

**සුභාසිනී දිනූෂා අල්ගම**

මෙම ලිපියේ අරමුණ වන්නේ ප්‍රජා සංවර්ධනය උදෙසා සමාජ සවිබල ගැන්වීම නැතහොත් ප්‍රජා සවිබල ගැන්වීම වැදගත් වන්නේ කෙසේ ද? යන්න විමසා බැලීමටත් ප්‍රජා සංවර්ධන උපායමාර්ගයක් ලෙස සහභාගිත්ව සංවර්ධන ප්‍රවේශය ප්‍රජාවට අනුරූප වන පරිදි යොදා ගැනීමේ වැදගත්කම අවබෝධ කිරීම උදෙසා ඥාන සම්පාදනය කිරීම උදෙසා ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂ ආයතනයේ දායකත්වය පිළිබඳ දැනුවත් කිරීමටත්ය.



## සංවර්ධනය

සංවර්ධනය යන සංකල්පය කාලයෙන් කාලයට වෙනස් වන සංකල්පයක් වේ. ආර්ථික විද්‍යාඥ ජෝෂප් ස්ටිලිග් "සංවර්ධනය" යන්නෙන් සමාජ පරිණාමය වීමක් අදහස් වන බව ප්‍රකාශ කර ඇත්තේ එබැවිණි. ඒ අනුව සමාජයේ පරිණාමීය වෙනස තුලින් පෙන්නුම් කරන්නේ ඒ රටේ සංවර්ධනය බව අපට හඳුනාගත හැකිය.

අතීතයේ රටක ආදායම් වර්ධනය කිරීම තුළින් ඒකපුද්ගල ආදායම වර්ධනය කිරීමට හැකි බවත් එය සංවර්ධනය ලෙසත් විග්‍රහ කර ගන්නා ලදී. ඒ කාලවකවානුවේ සිට මේ දක්වා බිහි වූ විවිධාකාර සංවර්ධන සංකල්පය තුළින් සංවර්ධනය විග්‍රහ කර ගැනීමේ දී සිදුවූ වෙනස්කම් අධ්‍යයනය කිරීමේ දී සංවර්ධනය යන්න විග්‍රහකර ගැනීමේ ඇති බැරෑරුම් බව මනාව කියාපායි.

සැමදේ සැමදෙනා අතරම සමාන වූ බෙදී යාම සංවර්ධනයේ බලාපොරොත්තුවයි. එසේම ආදායම් විෂමතාවය අවම වීම පමණක් නොව සමාජයේ සෑම ක්ෂේත්‍රයක ම වර්ධනයක් අපේක්ෂා කරයි. සංවර්ධනය කිවු සැනින් එක වරම අපගේ සිතට එන අදහස වන්නේ මුදල් තිබෙන්නේ නම් (රටකනම් ඒකපුද්ගල ආදායම වැඩිවීම), භෞතික සම්පත් වැඩි දියුණු කර ඇත්නම් ඒ රට සංවර්ධිතයි යන අදහසයි. නමුත් අතීතයේ සිට මේ දක්වාම දළ දේශීය නිෂ්පාදිතය ඉහළ යාමෙන් ජාතික ආදායම කොතෙක් වැඩි වුව ද? එවැනි රටක සංවර්ධනයක් ඇති වී ඇති බව අපට ප්‍රකාශ කල නොහැක. ඒ බව යම් රටක දරිද්‍රතාව, විරැකියාව, ආදයම් විෂමතාවය, යන ගැටළු තුනම හෝ කීපයක් මතුවී තිබෙනම් ඒක පුද්ගල ජාතික ආදායම දෙගුණයක් වුවත් එහි දී එය සංවර්ධනය වශයෙන් හැඳින් විය නොහැකි බව ඩඩ්ලි සියර්ස් ප්‍රකාශ කර ඇත්තේ ද එබැවිනි. එවැනි රටක බහුතර ප්‍රජාවගේ ජීවන තත්ත්වයේ වර්ධනයක් සිදුවී නැත. රටක

පරිසරය ආරක්ෂා කර ගන්නේ නැත්නම්, නීතිය, සමාජයේ යටිතල පහසුකම් ආදී කරුණු වල ප්‍රශංසනීය වර්ධනයක් නොමැති නම් දළ දේශීය නිෂ්පාදිතය කොතෙක් වැඩි වුවද එතන සංවර්ධනයක් ඇති වී නොමැති බව ප්‍රකාශ කල හැක.

මේ අනුව සංවර්ධනය යන සංකල්පය කාලෙන් කාලයට වෙනස් වන පරිනාමීය සංකල්පයක් බව අපි දනිමු. වර්ථමානය වන විට සංවර්ධනය මැනීමේ නිර්නායක තවදුරටත් එලෙස ම වෙනස් වෙමින් පවතී. වර්තමානයේ රටවල් සංවර්ධනය මත ශ්‍රේණිගත කිරීම සඳහා මානව සංවර්ධන දර්ශකය (HDI) භාවිතාවේ. මෙම සංවර්ධන නිර්නායකය මානයන් තුනක් (ආයු අපේක්ෂාව, අධ්‍යාපන, ආර්ථික ධනය) මත රටවල්වල සංවර්ධනයේ ස්ථානය තීරණය කර ඇත.

එසේම මෑතක දී සහස්‍ර සංවර්ධන දර්ශකයට අනුව රටක සංවර්ධනය කරා මෙහෙයවීමට රටවල් කටයුතු කර ඇත. එම උත්සාහයේ දී හඳුනාගත් අඩුපාඩු නිවැරදි කර ගනිමින් තිරසාර සංවර්ධනයන් කරා ගමන් කිරීම උදෙසා තිරසර සංවර්ධන ඉලක්ක 17 ක් හඳුනා ගෙන ඇති අතර 2030 වන විට එම ඉලක්ක සපුරා ගනිමින් සංවර්ධනය කරා මෙහෙයවීමට රටවල් 193 අත්සන් තබා එකඟවී ඇත.

මේ ලෙස අතීතයේ සිට මේ දක්වාම විවිධාකාරයේ සාධක මත පදනම්ව විවිධාකරයට සංවර්ධනය විග්‍රහ කර ගැනීමට උත්සාහ කර ඇත. ඒ අනුව අපට සංවර්ධනය පරිනාමීය සංකීර්ණ සංකල්පයක් බව පැහැදි වෙයි.

## ප්‍රජා සංවර්ධනයේ ආරම්භය

රටක වෙසෙන එකම ජන කණ්ඩායමක් වුව ද ඔවුනොවුන් අතර සමානතා මෙන්ම විෂමතාද බහුල සංකීර්ණ බවක් පවතී. එබැවින් මෙම තත්ත්වය වටහා ගනිමින්, විධිමත් ක්‍රම ශිල්ප භාවිතා කරමින්, මඟ ගැන්වීම් තුළින් පවත්නා තත්ත්වය විග්‍රහකර ගනිමින් සමාජය ප්‍රගතියක් කරා මෙහෙයවීමේ ක්‍රියාවලියක් ප්‍රජා සංවර්ධනයේ දී අපේක්ෂා කෙරේ.

අපට ප්‍රජා සංවර්ධනය පිළිබඳ ලෝක ඉතිහාසයේ තොරතුරු සොයා බැලීමේ දී, 1945 වසරේ එංගලන්තයේ පවත්වනු ලැබූ කේම්බ්‍රිජ් සම්මේලනයේ දී ප්‍රථම වතාවට ප්‍රජා සංවර්ධනය පිළිබඳ අදහස් ඉදිරිපත් කර ඇති බවට කරුණු අනාවරණය වේ. ප්‍රංශය බ්‍රිතාන්‍ය ආදී රටවල සිදුවූ දේශපාලන විප්ලවය, ආර්ථික ප්‍රතිසංස්කරණ මෙන්ම දෙවන ලෝක යුද්ධය ආශ්‍රිත සිදුවීම් නිසා ප්‍රජා සංවර්ධනය පිළිබඳ ගෝලීය වශයෙන් කතිකාවතක් ඇතිවී තිබේ. එහි දී සමාජීය, ආර්ථික, සංස්කෘතික, දේශපාලන ආදී අංශ වල බිඳ වැටීම් හා ප්‍රජාව තුළ ඇති වූ සමාජ ප්‍රශ්න හේතු කොටගෙන ඇති වූ බලපෑම් අවම කිරීම සඳහා සංවර්ධන ක්ෂේත්‍රය හා සම්බන්ධ සමාජ විද්‍යාඥයන්, මානව විද්‍යාඥයින් මෙන්ම සමාජ වැඩකරුවන් ප්‍රජාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීමේ අරමුණින් ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති හඳුන්වා දීමට කටයුතු කර ඇත.

ප්‍රජා සංවර්ධනය පිළිබඳ අදහස් දක්වන එක්සත් ජාතික සංවිධානය (united nations organization) - "ප්‍රජාවගේ විභව ශක්තිය කෙරේ පූර්ණ විශ්වාසය තබමින් ඔවුන්ගේ පූර්ණ සහභාගිත්වයෙන් සමස්ත ප්‍රජාවගේ සමාජ ආර්ථික ප්‍රගතිය නිර්මාණය කිරීමේ ක්‍රියාවලිය ප්‍රජා සංවර්ධනයයි" ලෙස හඳුන්වා ඇත.

ප්‍රජා සංවර්ධන ක්‍රියාවලියේ දී ප්‍රජාවගේ ගැටලු සඳහා බාහිරින් ආනයනය කරන විසඳුම් තමාගේම විසඳුමම යැයි හිස් මුදුනින් පිළිගැනීමක් සිදුවන්නේ නැත. මෙහිදී ප්‍රජාව තමන්ට මුහුණ දීමට සිදු වී ඇති ප්‍රාදේශීය තත්ත්වය අනුව,

ඔවුන්ගේ දැවෙන අවශ්‍යතා අනුව පවතින තත්ත්වය ඔවුන් විසින්ම නියමාකාරයෙන් විග්‍රහකර ගනිමින්, ඔවුන් විසින්ම සිය ගැටළු සඳහා විසඳුම් ගොඩනගා ගන්නා වූ ක්‍රියාවලියකි. මෙන්න මේ ක්‍රියාවලියේ සෑම අවස්ථාවක දී ම ප්‍රජාවගේ සහභාගීත්වය ලබාගැනීම ප්‍රජාවගේ පූර්ණ සහභාගීත්වය ලෙස අපට හඳුනා ගත හැක.

එසේම ප්‍රජාවට විසඳීමට ගැටලු මෙන්ම සපුරා ගත යුතු අවශ්‍යතාවයන්ද නිරතුරුවම පැන නැගෙනු ඇත. බලයක් නොමැති බහුතරයක් ප්‍රජාවගේ එම ගැටලු හා දැවෙන අවශ්‍යතා තනි තනිව විසඳා ගැනීමට දරන උත්සාහයන් බොහෝ විට ඵලදායි නොවේ. එබැවින් බලයක් නැති ආන්තීකරණ වූ ප්‍රජාවක් සංවර්ධනය අරමුණු කරගෙන ක්‍රියා කිරීමේ දී වඩා වැදගත් වනුයේ තනි තනිව ක්‍රියා කිරීම වෙනුවට එක්ව, ශක්තිමත්ව, එක් රැස්වන සම්පත් කෙරේ විශ්වාසය තබා ක්‍රියා කරමින් අවශ්‍යතා ඉටුකර ගන්නා ක්‍රියාවලියක් තුළින් ඔවුන්ගේ ගැටලු, අරමුණු දිනා ගැනීමට අවශ්‍ය කටයුතු කිරීම කෙරෙහි විශ්වාසයෙන් මෙම කාර්යයන් ආරම්භ විය යුතු බවයි. මේ අනුව ප්‍රජාවගේ හැකියාවන් හා සම්පත් මත විශ්වාසය තබමින් එකට එකමුතුව ක්‍රියාකොට සිය ගැටලු විසඳා ගනිමින් අවශ්‍යතා තෘප්ත කර ගැනීම සඳහා වූ ප්‍රජා සංවර්ධනය ක්‍රියාවලිය ආරම්භ වී ඇත.

## ප්‍රජාව

ප්‍රජාව යනුවෙන් හඳුන්වනු ලබන්නේ යම් භූමි ප්‍රදේශයක අගනාකම්, විශ්වාස, සාරධර්ම, පොදු අවශ්‍යතා, සම්පත්, සමාජ සබඳතා, පොදු අරමුණු සහිතව ඒවා හවුලේ භුක්ති විඳින සමාජ කණ්ඩායමකි. ඒ අනුව මේ තුල තමාට අයත් යැයි හැඟීම, බෙදා හදා ගැනීම, පොදු හැඟීම නිතැතින් පවතී.

සමාජ විද්‍යාඥ ඩොනල්ඩ් ෆාස්ලර් (donald fessler), ටැල්කොට් පර්සන් (Talcott parsons) යන අයට අනුව ප්‍රජාව තුළ මූලික ලක්ෂණ දෙකක් පවතී

### ප්‍රාදේශීයත්වය (Lacality)

මෙහි දී භූගෝලීය කලාපයක් තුළ සීමාවක් හැගවෙන අතර ඒ තුළ භෞතික තත්ත්වයක් පිළිබඳ අදහසක් පෙන්නුම් කරයි. මේ තුළ ගහකොළ, පස, පමණක් නොව කාලගුණික දේශගුණික තත්ත්වයන් ආදී සියලු දේ ඇතුළත් වේ. මේ වන විට මෙම අදහස අන්තර්ජාතික ගුගෝලීය කලාපයක් දක්වා ම වෙනස් වී ඇත.

### ප්‍රජා හැඟීම (community)

ප්‍රජාවගේ හැඟීම් (තමා ප්‍රජාවේ සාමාජිකයකු යැයි දැනෙන හැඟීම) වලින් තොරව ප්‍රජාවගේ සත්‍ය ම ක්‍රියාකාරී ස්වරූපයක් නිර්මාණය නොවේ. මෙම තත්ත්වය සදාකාලික ප්‍රජාවේ එකතුවක් නොවුණ ද සාපේක්ෂව ස්ථිර වීම වැදගත් වේ. එසේම ප්‍රජාවේ සාමාජිකත්වයේ හිමිකම සැලසුම් සහගතව බල කිරීම් හෝ කැමැත්ත මත හිමිවන්නක් නොව උපතින් හෝ ස්වභාවිකව නිර්මාණය වී තිබිය යුතු බව සමාජ විද්‍යාඥයන්ගේ අදහසයි.

### ප්‍රජා සංවර්ධනයේ දී බලගැන්වීම

ප්‍රජා සංවර්ධනය සිදුකිරීමට නැතහොත් ප්‍රජා සංවර්ධනයක් සිදුවීමට නම් මිනිසුන්ට නැතහොත් ප්‍රජාවට ඒ සඳහා බලයක් තිබිය යුතුයි. බලය යන සංකල්පය මිනිසුන්ගේ හැකියාව නැතහොත් ශක්තිය හා බැඳී පවතින කරුණකි.

අඹ ඇටයක් තුල පැලවීමේ (ප්‍රරෝහනය වීමේ) ශක්තියක් පවතී. ඉතාම තද පොත්තකින් වට වී ඇති අඹ ඇටයක් තුල ඉතා විශාල අඹ ගසක් බවට පත් වී ඵල ලබා දීමේ ශක්තියක් නිදන් වී පවතී. නමුත් ඒ අඹ ඇටයම සිමෙන්ති පොලවක නැතහොත් මේසයක් මත තබා අවුරුදු ගණනක් බලා සිටියද එම ප්‍රතිපලය ලබා ගැනීමට ඔබට නොහැකිය. අඹ ඇටය තුල පවතින එම පැලවීමේ ශක්තිය (විභව ශක්තිය) බලගැන්වීමට නම් ඒ සඳහා ඇවැසි පෝෂණීය බිම (පස), ජලය, හිරුඑළිය ආදී අවශ්‍ය සියලු සාධක ලබා දිය යුතුවේ. එවැනි තත්ත්වයක් ලබා දුනහොත් ඉතා තද පොත්තකින් වටවී පැවතුනත් සැඟවුණු ශක්තිය බලගැන්වී ඉතා තද පොත්ත පලාගෙන පැළයක් බවට පත් වී මහා වනස්පතියක් වී ඵල දැරීමට අඹ ඇටයට හැකිවේ.

ප්‍රජාව ද එවැනි මහා විභව ශක්තියකින් හෙබි පිරිසකි. නමුත් අවශ්‍ය බලගැන්වීම නැති ප්‍රජාවගේ විභවශක්තිය ද එවැනි ම වේ. ඔවුන්ගේ විභව ශක්තිය බලගැන්වීමට ඇවැසි පසුබිම ලබාදීමට අපට නොහැකි නම් ඔවුන් ද මේසය මත තිබෙන්නා වූ අඹ ඇටයක් මෙනි. එබැවින් ප්‍රජා සංවර්ධනය පිළිබඳ කතා කරන අපට ප්‍රජාව බලගැන්වීම අමතකර, බලගැන්වීමේ ක්‍රමවේදයන් ගැන නොසලකා ප්‍රජා සංවර්ධනයක් පිළිබඳ කතා කිරීමට නොහැකිය.

ප්‍රජාව බල ගැන් වීම පිළිබඳ අදහස් දක්වන ඇරෙන්ඩිට් (Arendit) ප්‍රජාව බලගැන් වීම යන්න මිනිසුන්ගේ හැකියාව හා සම්බන්ධ වන බව පෙන්වා දී ඇත. එමෙන්ම ඇන්ටනි ගිඩින්ස් ද ප්‍රජාව බලගැන්වීම, මිනිස්සුන් තුළ පවතින පරිවර්තීනීය විභව ශක්තියක් ලෙස හඳුන්වා දී ඇත්තේ ද මෙම කරුණු අනුවයි.

එසේ නම් ප්‍රජා සංවර්ධනය පිළිබඳ කතා කරන අපට එම කාර්යයේ සාර්ථකත්වය අත්දකින්නට නම් මිනිසුන් තුළ පවතින කුසලතා, භෞතික සම්පත් යොදා ගනිමින් සාමූහික අරමුණු දිනා ගැනීම සඳහා ප්‍රජාවගේ පූර්ණ සහභාගිත්වයන් සිදුකෙරෙන බල ගැන්වීමේ ක්‍රියාවලියක් අවශ්‍ය වේ.

මේ නිසා ටැල්කොට් පර්සන් (Talcott parsons) “බලය වූකලි සමස්ථ සමාජ විෂයයෙහි සමාන්‍යකරණය කළ හැකි සංකල්පයක් වන අතර මිනිසුන් සමූහයක් වශයෙන් එක්ව පොදු අරමුණක් සාධනය කරගැනීමට ඔවුන්ගේ හැකියාවන් භාවිතා කිරීමෙන් ගොඩනගා ගන්නා සමාජ බලය“ යි ලෙස හඳුන්වා ඇත.



මේ කරුණු සියල්ල අනුව ප්‍රජාව බලගැන්වීමේ ක්‍රියාවලිය පිළිබඳ කතා කිරීමේ දී ඒ හා බැඳී ඇති මානවීය කරුණු කීපයක් අපට තහවුරු වෙයි. එනම් සෑම පුද්ගලයෙකු සතුව ම සංවර්ධනය කළ හැකි අන්දමේ හැකියාවක් හා ශක්තියක් නිධන්ගතව පවතී. නමුත් බලය පුද්ගලයෙකු සතුව උපතින් උරුම වූ කරුණක් නොවේ. එබැවින් ප්‍රජා සංවර්ධන කාර්යයේ දී බලය පුද්ගලයන් අතර හුවමාරු කර ගත හැකි, වර්ධනය කරගත හැකි දෙයකි. එබැවින් පුද්ගලයින් කණ්ඩායමක් වශයෙන් සිය අභ්‍යන්තරයේ පවත්නා ශක්තිය පිළිබඳව විශ්වාසය තබමින්, ධනාත්මක වෙනසක් සිදු කිරීම උදෙසා තීරණය ගැනීමට හා ඒවා ක්‍රියාත්මක කිරීමට පෙළඹවීමේ ක්‍රියාවලිය ප්‍රජා බලගැන්වීම ලෙස හඳුන්වා දිය හැක.

ජේ. රැපපෝටස් විසින් 1987 ලියා ඇති “terms of empowerment/ exempars of prevention: Toward atheory of community psychologe “ නම් ලිපියෙන් පුද්ගලයින්ට ස්වකීය ජීවිතය පිළිබඳ තීන්දු තීරණ ගැනීමට හා හැසිරවීමට

ඇති හැකියාවන් වර්ධනය කිරීම බලගැන්වීමේ ක්‍රියාවලිය තුළින් සිදුවන බව පවසා ඇත. එලෙස ප්‍රජාවගේ පවත්නා පහල ජීවන තත්ත්වය වෙනුවට පැවතිය යුතු ඉහළ ජීවන තත්ත්වය කරා ළඟාවීමට (ළඟා කර ගැනීමට) අවශ්‍ය දේ හඳුනාගැනීමටත්, ඒ වෙනුවෙන් හඬ නැගීමටත්, තමන් සතු සම්පත්වලින් ක්‍රියාකාරකම් ආරම්භ කිරීමත් සැලසුම් කිරීමත්, හැකියා වර්ධනය කර ගැනීමත්, භෞතික සම්පත් මෙන්ම ආකල්පමය වශයෙන් පවතින බාධක ඉවත් කිරීමත් මෙම බල ගැන්වීමේ ක්‍රියාවලිය හරහා සිදුවිය යුතුයි.

## ප්‍රජාව බලගැන්වීම සිදු විය යුත්තේ කෙසේද ?

ප්‍රජාව බලගැන්වීමේ දී තමා ජීවත් වන පරිසරය පිළිබඳ තොරතුරු ඉතාම වැදගත් කරුණක් වෙයි. ප්‍රජාවට තමන් ජීවත්වන පරිසරයේ පවත්නා තත්ත්වය පිළිබඳ නියමාකාරයේ අවබෝධයක් ලබා ගැනීමට මෙම තොරතුරු විග්‍රහ කරගැනීම ඉතාම වැදගත් වේ. ජේ.සී. නෙල්සන් "සන්නිවේදනය න්‍යාය හා සමාජ වැඩ" නම් ග්‍රන්ථයේදී පෙන්වා දී ඇත්තේ මෙන්න මේ කාරණයයි. ඉන් පෙන්වා දී ඇත්තේ පුද්ගලයින්ගේ හැසිරීම තමා ජීවත්වන පරිසර තත්ත්වය තුළින් ලබාගන්නා තොරතුරු පදනම් කොටගෙන නිර්මාණය වන අතර මෙම තොරතුරු එකිනෙකා අතර හුවමාරු වන විට සමාජ සම්බන්ධතා ගොඩනැගෙන බවයි. මෙහි දී ගොඩනැගෙන සමාජ සම්බන්ධතා හා එකිනෙකා අතර තොරතුරු හුවමාරු වීම ප්‍රජා සංවර්ධන ක්‍රියාවලියේ දී ඉතා ම වැදගත් ම කාර්යයක් ඉටුකරයි.

ප්‍රජාවගේ පොදු අරමුණු දිනාගැනීම උදෙසා ප්‍රජාව බලගැන්වීමට තමා ජීවත්වන සමාජ ආර්ථික වට පිටාව හා බැඳී ඇති ගැටලු පමණක් නොව තමා සතුව පවතින සම්පත් පිළිබඳ ව ද යථාර්ථවාදී අවබෝධයක් ලබා ගත යුතුවේ. බාහිර පාර්ශ්වයන්ට ප්‍රජාව වෙත එම අවබෝධය ලබා ගැනීම සඳහා මඟ පෙන්වීම කළ හැකි වන්නේ මේ විග්‍රහකරගත හැකි වන තොරතුරු හරහායි. පවත්නා තත්ත්වය පිළිබඳ මෙසේ ලබාගන්නා යථාර්ථවාදී අවබොධය නැතහොත් විඥන අවදි වීම හරහා ගොඩනැගෙන අවදි වීම ප්‍රජා සංවර්ධනයක දී ඉතාම වැදගත් වේ.

එබැවින් ප්‍රථමයෙන් ප්‍රජාව තුළ තම සමාජ, ආර්ථික වටපිටාව හා සැබෑ අවශ්‍යතා හා වුවමනාවන් පිළිබඳ කතිකාවතක් ආරම්භ කිරීම ට අවශ්‍ය සන්නිවේදන යාන්ත්‍රණයක් සකස් කළ යුතු බව අවධාරණය කර ඇත. මේ සියල්ලේ ම අවසාන අරමුණ විය යුත්තේ ප්‍රජාව තම වටපිටාව හා ඒ වටා බැඳී පවතින ගැටලු, තම සැබෑ අවශ්‍යතා පිළිබඳ සවිඥානික කරමින් පොදු අරමුණු දිනා ගැනීම සඳහා අවශ්‍ය බලගැන්වීමයි. මෙහි දී ප්‍රජාවගේ පොදු අරමුණ වෙනුවෙන් ක්‍රියාත්මක වන නිදහස් ස්වාධීන සන්නිවේදන ක්‍රමවේදයක් පැවතීම ඉතාම වැදගත් වේ. විවිධ සන්නිවේදන මාධ්‍යයන් වෙත පුළුල් ප්‍රවේශ පැවතීම හා ඒවායේ වගකීම් හා වග වීම් සහිත බව මෙන්ම ප්‍රජාවට සිය අවශ්‍යතා වෙනුවෙන් හඬ නැගීමේ දී පැවතිය යුතු භාෂණය හා ප්‍රකාශනයේ නිදහස තහවුරු කිරීම ඉතාම වැදගත් වේ. එබැවින් සහභාගීත්ව සංවර්ධන ක්‍රමවේදය තුළ ප්‍රජාව අවදිකිරීම හා බලගැන්වීමට ප්‍රමුකත්වයක් ලබාදෙන, ප්‍රජාවගේ නිදහස් අදහස් වලට ඉඩ සලසන නිරතුරු සාකච්ඡාවට ප්‍රධාන ස්ථානයක් ලබා දී ඇත.

එන් වොලර්ස්ටයින් පෙන්වා දෙන අකාරයට සමාජ බලගැන්වීමේ ක්‍රියාවලිය සමාජ සාධාරණත්වය, දේශපාලන ඵලදායිතාවය, ප්‍රජා පාලනය හා ප්‍රජාවගේ ජීවන තත්ත්වයයේ වර්ධනය ආදී අරමුණු දිනා ගැනීම සඳහා ප්‍රජාවගේ සහභාගිත්වය ප්‍රවර්ධනය කරන්නා වූ සමාජ ක්‍රියාකාරකම් පදනම් කරගත් ක්‍රියාදාමයක් වෙයි. එපමණක් නොව ප්‍රජාවගේ පවත්නා ගැටලු පිළිබඳ නියමාකාරයේ අවබෝධය ඇත්තේ ප්‍රජාවටයි. එබැවින් ප්‍රජා සංවර්ධන ක්‍රියාවලිය ජනතාව සමඟ අත්වැල් බැඳගත් ක්‍රියාවලියක් ම විය යුතුවේ.

සංවර්ධනය පිළිබඳ සංවාදය ආරම්භ වූ මුල් කාල වකවානුවේ දී සංවර්ධන විද්‍යාඥයන් ප්‍රජා සංවර්ධනය සඳහා සමාජ සැලසුම් න්‍යාය යොදා ගන ඇත. මෙහි දී ඉහළ මට්ටමේ දී සංවර්ධන විශේෂඥයින් හා ප්‍රතිපත්ති සම්පාදකයින් විසින් සකස්කරනු ලබන සැලසුම්, තීන්දු තීරණ හා යෝජනා බිම් මට්ටම දක්වා ගෙන එන ක්‍රමයක් අනුගමනය කර ඇත. එම ක්‍රමයේ ප්‍රතිඵලය වූයේ සංවර්ධනය ප්‍රජාවට ආගන්තුක ක්‍රියාවලියක් බවට පත්වීම හා ප්‍රජාව එම සංවර්ධන ක්‍රියාවලියෙන් බැහැර වීමයි. එබැවින් මේවන විට ප්‍රජා සංවර්ධනයේ දී ප්‍රජා සහභාගිත්වය ලබා ගැනීම අත්‍යාවශ්‍ය අංගයක් බවට පත් වී ඇත.

**ප්‍රජා සහභාගීත්වය**

ප්‍රජා සහභාගීත්වය යනු තීරණ ගැනීමේ දී, සැලසුම් කිරීමේ දී, ක්‍රියාත්මක කිරීමේදී, ප්‍රතිඵල භුක්ති විඳීමේ දී, හා ඇගයීමේ දී යන සියළුම අවස්ථාවන් හි දී ප්‍රජාවගේ සහභාගීත්වය ලබා ගැනිමයි. එබැවින් ප්‍රජා සංවර්ධන ක්‍රියාවලියේ දී ප්‍රජාවගේ ගැටලු හා අවශ්‍යතාවලට අදාල තීරණ ගැනීම සිදුකරනු ලබන්නේ බාහිර පුද්ගලයින් නම් ප්‍රජාවට ආගන්තුක වන එම සංවර්ධන ක්‍රියාවලියෙන් ඉවත්වීම නිරතුරුවම සිදුවන්නකි. එවැනි ප්‍රජා සංවර්ධන වැඩසටහන්වල ප්‍රතිඵලය වන්නේ ද එම සංවර්ධන ක්‍රියාවලිය ප්‍රජාවට ආගන්තුක දෙයක් බවට පත්වී ඵල රහිත වීමයි. එබැවින් ප්‍රජාවගේ සක්‍රීය දායකත්වය සංවර්ධන ක්‍රියාවලියට ලබා ගැනීමට නම් ඉහත සඳහන් කළ අවස්ථා සියල්ලේ දීම ජනතා සහභාගිත්වය ලබාගත යුතු වේ. ප්‍රජාව අදාළ සංවර්ධන කාර්යයන් තමන්ගේ ම දෙයක් බව අවබෝධ කර ගෙන සිය කැමැත්තෙන් සහාය දැක්වීම ප්‍රජා සංවර්ධනයේ දී අත්‍යාවශ්‍ය වේ.

සංවර්ධන ක්‍රියාවලියේ දී ප්‍රජාව සැලසුම් සහගත ලෙස සංවිධානය කිරීම තවත් වැදගත් ලක්ෂණයකි. එහි දී ප්‍රජාව මුල් වී ඔවුන්ගේ සැබෑ අවශ්‍යතාවයන් හඳුනාගෙන ගෙන පවතින තත්ත්වය විග්‍රහ කිරීමත්, ඔවුන්ගේ සම්පත් හඳුනාගෙන ඒවායින් උපරිම ප්‍රයෝජන ලැබෙන පරිදි හඳුනාගත් ගැටළු විසඳීම සඳහා සම්පත් භාවිතා කරන ආකාරය සැලසුම් කිරීමත්, ගැටලුවල තීව්‍රතාවය හා ගැඹුර මත පවතින සම්පත් ප්‍රමාණය ප්‍රමාණවත් නොවෙන්නේ නම් ඒ සඳහා සහාය සේවා හා ආයතන වල සහාය ලබා දීම ත් වැදගත් වේ.

1995 දී ක්‍රියාත්මක කළ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන්වල දී "සංවර්ධනය ජනතාව විසින් සිදු කළ යුතු අතර ජනතාව වෙනුවෙන් සිදු කරන්නක් නොවිය යුතුය" යනුවෙන් සඳහන් කර ඇත. එසේම සවිබලකරණ ක්‍රියාවලිය සෑම අයෙකුටම තම ස්ත්‍රී පුරුෂ සමාජ භාවය නොතකා පරිපූර්ණ පුද්ගලයකු බවට පත්වීමටත් සියල්ලන් සඳහා වඩාත් මානවීය සමාජයක් ගොඩනැගීම සඳහා තම පූර්ණ දායකත්වය ලබාදීමටත් මග පෙන්වන්නක් විය යුතුය බව බටුවිටගේ මහතා සඳහන් කර ඇත.

ප්‍රජාව සතු සම්පත් හිඟකම හා බල රහිතතාව නිසා ඔවුන් හට වරණයන් හා තීරණ ගැනීමේ නිදහස බොහෝ දුරට සීමා වී ඇත. ඒ අනුව ප්‍රජාවට ඔවුන්ගේ ජීවිත හා සම්බන්ධ වන කාරණාවල දී වගකිව යුතු ආයතන ව්‍යුහයක් සමඟ සම්බන්ධ වීමටත්, ඒවාට බලපෑම් කිරීමට හා ඒවා සමඟ ගනුදෙනු කිරීමටත් අවශ්‍ය වත්කම් (Assets) හා හැකියාවක් (Capabilities) ප්‍රවර්ධනය කිරීමත් ප්‍රජා බල ගැන්වීමේ දී සිදුවේ. මෙහි දී,

වත්කම් - යනුවෙන් හඳුන්වන්නේ භූමිය, නිවාස, පශු සම්පත්, ඉතිරි කිරීම් වැනි පුද්ගලයින්ගේ වරණයන් සඳහා වන හැකියාව වර්ධනය කරන්නා වූ භෞතික හා මූල්‍යමය සම්පත්ය.

හැකියාවන් - යනුවෙන් හඳුන්වන්නේ මෙම වත්කම් හා සම්පත් ප්‍රජා සුභසාධනය සඳහා විවිධ අයුරින් භාවිතා කිරීමට හැකිවන සක්‍යතාවයයි.

මනා සෞඛ්‍ය හා සනීපාරක්ෂක තත්ත්වයන්, ගුණාත්මක අධ්‍යාපනය, ජීවන කුසලතා ආදී මානව හැකියාවන් හා සම්බන්ධ වෙයි.

නායකත්වය, විශ්වාසය පිළිබඳ හැඟීම, පොදු බව, අනන්‍යතාවයන්, වටිනාකම් හා එක්රැස්වීමට හා සංවිධානය වීමට ඇති හැකියාව ආදිය සමාජය හැකියාවන් හා සම්බන්ධවේ.

තොරතුරු සඳහා වන ප්‍රවේශයට ඇති හැකියාව, සංවිධාන ගොඩනැගීමට, ප්‍රජාවේ හෝ රාජ්‍යයේ දේශපාලනට සහභාගී වීමට හා දේශපාලනික ජීවිතයක් ගත කිරීමට ඇති හැකියාව ආදිය වර්ධනය කිරීම දේශපාලනික හැකියාව වෙයි.

මේ අනුව ප්‍රජා සංවර්ධනයේදී ප්‍රජාව තුළ ඇති ශක්තීන් සංවර්ධනයට දායක කර ගැනීම නැතහොත් වෙනස් කිරීම ප්‍රජා සංවර්ධනයේ ප්‍රධානම සාධකයයි. එසේනම් ප්‍රජා සංවර්ධනය උදෙසා ප්‍රජාවගේ ශක්තිය මත විශ්වාසය තබා ඔවුන්ගේ හැකියාවන් වර්ධනය කරමින් ප්‍රජාව සංවිධානය ගත කිරීම හරහා ප්‍රජාවගේ ජීවිතවල සමාජ ආර්ථික දේශපාලනික අධ්‍යාත්මික වර්ධනයක් ඇති කිරීම ප්‍රජා සංවර්ධනයේ දී සිදුවන බවත් ඒ සඳහා ප්‍රජාව සවිබල ගැන්වීම අත්‍යවශ්‍ය බවත් අවධාරණයෙන් සඳහන් කරමු.

## ප්‍රජා සවිබල ගැන්වීමේ ක්‍රමවේදයේ ආරම්භක ආයතනය - ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

සංවර්ධනය උදෙසා ප්‍රජාව සවිබලගැන් වීම සඳහා වන මව් ආයතනය වන්නේ ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයයි. අප ආයතනයේ ප්‍රජාව සවිබලගැන්වීමේ ක්‍රමවේදය වන්නේ සහභාගීත්ව සංවර්ධන ප්‍රවේශයයි. කාර්යයබද්ධ පර්යේෂණයක් ලෙස මෙම ක්‍රමවේදය ශ්‍රී ලංකාව මෙන්ම ඉන්දියාව හා බංග්ලාදේශයේ (දකුණු ආසියාතික කලාපයේ) අත් හදා බලා ඇති අතර එම අත්හදා බලන ලද ප්‍රජාව සවිබල ගැන්වීමේ වැඩසටහන විපර්යකාරක වැඩසටහන (change agent program cap) ලෙස හැදින් වේ.

## මොකක්ද මේ විපර්ය කාරක වැඩසටහන(change agent program CAP) (වෙනස් කිරීමේ නියෝජිත වැඩසටහන)

මෙය දකුණු ආසියාතික ග්‍රාමසංවර්ධන ක්ෂේත්‍රයේ අත්හදා බැලූ නව සංවර්ධන ප්‍රවේශයයි. කාර්යබද්ධ පර්යේෂණයක් ලෙස 1978 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරන ලද මෙම කාර්ය බද්ධ පර්යේෂණය මගින් ප්‍රජාවගේ යහපත් වෙනසක් වීම අපේක්ෂා කරන බැවින් විපර්යකාරක වැඩසටහන් ලෙස අපට හඳුනාගත හැක.

## මෙවැන්නක් අවශ්‍ය වූයේ ඇයි?

දකුණු ආසියාතික රටවල සංවර්ධනය අරමුණු කර ගත් විවිධ වැඩසටහන් බොහෝ කාලයක් පුරා ක්‍රියාත්මක කර තිබුණ ද ප්‍රජාව සංවර්ධන ඉලක්ක කරා ගමන් නොකරන්නේ ඇයි ද? යන පැනයට පිළිතුරු සෙවීමටත් ප්‍රජාව සංවර්ධනයට දායක කර ගැනීමට අවශ්‍ය බවත්, ඒ කුමන ආකාරයෙන් දැයි සොයා බැලීමේ අවශ්‍යතාවයත් තේරුම්

ගත් විද්වතුන් ඒ ප්‍රශ්ණ සඳහා පළිතුරු සෙවීම උදෙසා මෙම කාර්ය බද්ධ පර්යේෂණය සිදුකර ඇත. එහි ප්‍රතිඵල මත සංවර්ධනයෙන් ගිලිහී යන ප්‍රජාව යලි සංවර්ධනයට දායක කරගත හැකි ආකාරයන් සොයා බැලීම ප්‍රායෝගිකව සිදු කරමින් මෙම කාර්යය බද්ධ පර්යේෂණය සිදුකර ඇත.

## ක්‍රියාත්මක වූයේ කෙසේද?

සහභාගිත්ව සංවර්ධන ප්‍රවේශය පදනම් කරගෙන මෙම කාර්යය බද්ධ පර්යේෂණය සිදුකර ඇත. සහභාගීත්ව සංවර්ධන ප්‍රවේශයේ දී සිදු වන්නේ විපර්කාරකයෙකු ගේ (සජීවී කාරයකයෙක්, මැදිහත්කරුවෙක් මේ කියන ඕනෑම නමකින් හඳුන්වන පුද්ගලයෙක්ගේ නැතහොත් ඔබට අවශ්‍ය වෙනස් නමක් වුවද භාවිතා කළ හැක) මැදිහත් වීම තුළින් ප්‍රජාවට මුහුණ දීමට සිදු වන අවාසිදායක තත්ත්වයන් ඔවුන් විසින්ම විග්‍රහ කර ගනිමින් තේරුම් ගැනීමටත් ඔවුන් විසින්ම විසඳුම් යෝජනා කරමින් ඔවුන් විසින්ම සැලසුම් කරමින්, ඔවුන්ම ක්‍රියාකාරී වෙමින්, ඔවුන්ම ප්‍රතිඵල ළඟා කර ගන්නා ක්‍රමවේදයකි. මෙහිදී ප්‍රජාව සතු ශක්තිය (විභව ශක්තිය, ස්ව ශක්තිය හා සහභාගීත්වය) කෙරෙහි පූර්ණ විශ්වාසය තබමින් ඔවුන් වෙත පවතිනා සම්පත්වලින් ආරම්භ වන, අවශ්‍ය අවස්ථාවන්වල දී බාහිර සහාය ලබා ගන්නා ක්‍රමවේදයකි. නැත හොත් සංවර්ධන ප්‍රවේශයකි.

## ප්‍රජාව කෙරේ පූර්ණ විශ්වාසය තබා ක්‍රියාත්මක වන විපර්යකාරක ක්‍රමවේදය යල්පැන ගිය ක්‍රමවේදයක් වන්නේ කෙසේද?

ප්‍රජාවගේ ජීවන තත්ත්වය කෙරේ බලපාන්නා වූ පවතින ප්‍රශ්න ගැටලු පිළිබඳ තත්ත්වය විග්‍රහ කර ගැනීමේ දී ඔවුන් විසින්ම ඔවුන් මුහුණ දෙන වාසි අවාසි විග්‍රහ කර ගැනීම, සුදුසු විකල්ප සොයා ගැනීම, සැලසුම් සකස්කර ගැනීම, විසඳුම් ක්‍රියාත්මක කිරීම් හා ප්‍රතිඵලය ළඟා කර ගැනීම සෑම විටම සිදු කරනු ලබන්නේ ප්‍රජාව විසින්ම යි. මැදිහත්කරුගේ කාර්යභාරය වන්නේ ඒ සඳහා ප්‍රජාව පෙලෙඹවීම, අවදි කරවීම නැතහොත් විපර්යාසයකට ලක් කිරීම සඳහා අවශ්‍ය බුද්ධි කලම්බන සිදුකිරීමයි. මෙම අවදි කිරීම සජීවීකරණය කිරීම ලෙස ද හැඳින්විය හැක.

මෙහි දී සංවර්ධනයේ තිරසර පැවැත්ම මෙන්ම සෑම අංශයක් පිළිබඳව ම මෙම අවදි කිරීම (සජීවීකරණය කිරීම) උදෙසා විපර්යකාරක මැදිහත් වීම සිදුකරයි. නැතහොත් ප්‍රජාවට බලපාන අවාසිදායක තත්ත්වයන් ඔවුන්ගේම දැවෙන ප්‍රශ්නයන් බවට පත්කිරීමෙන් ප්‍රජාවගේ ක්‍රියාකාරීත්වය අවදි කිරීම සිදුකරයි. ප්‍රජා සංවර්ධනයේ දී මෙම අවදි කිරීම සමස්තයම (ආර්ථික, සමාජය, දේශපාලන, සෞඛ්‍ය, අධ්‍යාපන ආදී සියලුම අංශ මෙන්ම සංවර්ධන ප්‍රවාහයෙන් ගිලිහී ගිය ප්‍රජාවගේ ස්ව ශක්තිය හා සහභාගීත්වය) ආවරණය වන ලෙස සිදුකරණු ලබයි. ඊට හේතුව වන්නේ ප්‍රජා සංවර්ධන කාර්යයේ දී එක් එක් අංශ හුදකලාව නොපවතින බවත් ඒවා සියල්ල ඒකාබද්ධවී ඇත්තා සේම පුද්ගලයාද හුදකලාව නොසිටින සමාජීය වශයෙන් එකිනෙකා සමග අන්තර් සබඳතා පවත්වා ගනිමින් යහපත් දිවි පැවැත්මත් අපේක්ෂාවෙන් කටයුතු කරන සමාජීය සත්වයෙක් වන බැවිණි.

නමුත් අවශ්‍ය නම් විවිධ ව්‍යාපෘති සඳහා ද මෙම ක්‍රමවේදය හුදකලාව ම වුවද භාවිතා කර ගනිමින් ඒ එක් එක් අංශ තුළින් ප්‍රජාවගේ යහපත් තත්ත්වයන් ලඟා කර දීම උදෙසා භාවිතා කිරීමට ද හැකියාව පවතී. උදාහරණ ලෙස

**ආර්ථික අංශය**

ඔබ ව්‍යවසායකයෙක් හෝ නිශ්පාදකයෙක් නම් ඔහුට ලැබිය යුතු ලාභය උපරිම කර ගැනීමට නොහැකි වීමට හේතු සොයා ගැනීමටත්, ඒ සඳහා විසඳුම් සෙවීමටත්, සැලසුම් සකස්කර ගැනීමටත්, සැලසුම් ක්‍රියාත්මක කිරීමටත්, ප්‍රතිඵල ලැබීමත් දක්වා මැදිහත් වීම තුළින් ආර්ථික වශයෙන් ගොඩ නැංවීම.

**අධ්‍යාපන ක්ෂේත්‍රය**

ඔබ ශිෂ්‍යයෙක් නම් ඉගෙන ගත යුත්තේ ඇයි?, ඒ සඳහා පවතින ගැටලු හා ඒවා සඳහා විසඳුම් මොනවාද?, විසඳුම් සඳහා සැලසුම් සකස් කරගන්නේ කෙසේ ද?, විසඳුම් ක්‍රියාත්මක කරන්නේ කෙසේද?, ප්‍රතිඵල ලබා ගත හැක්කේ කෙසේද? වශයෙන් ආකල්ප සංවර්ධනය කර ගැනීමට පෙලඹවීම.

**සෞඛ්‍යය ක්ෂේත්‍රය**

දරුවන්ට පෝෂ්‍යදායි ආහාර ලබාගන්නට නොහැකි වීමට හේතු වූ කරුණු. ඒවා විසඳාගත හැකි ආකාරය, විසඳුම් සඳහා සැලසුම් සකස් කර ගැනීම, සැලසුම් ක්‍රියාත්මක කිරීම හා ප්‍රතිඵල ලැබීම තුළින් සෞඛ්‍ය සම්පන්න පුද්ගලයෙක් නිර්මාණය කිරීම.



මේ ලෙස ප්‍රජාවගේ ජීවන තත්ත්වයට බලපෑම් ඇති කරන ඕනෑම අංශයක ඕනෑම උද්ගලයෙකුට මේ ක්‍රමවේද භාවිතා කිරීම තුළින් පවතින තත්ත්වයන් විග්‍රහ කර ගැනීමෙන් එක් එක් අංශවල කේවල ගැටලු සඳහා ද විසඳුම් සොයාගත හැකි වේ.

නමුත් විපර්යකාර ක්‍රමවේදය තුලින් සිදුකරන්නේ ප්‍රජාවගේ යහපත් වෙනසක් සඳහා අවශ්‍ය වන සමස්ත අංශයන් පිළිබඳවම ප්‍රජාව අවදි කිරීම නැත හොත් සජීවීකරණය කිරීම තුළින් ප්‍රජාවගේ සංවර්ධනය උදෙසා ප්‍රජාව සවිබල ගැන්වීමයි.

මේ සඳහා ප්‍රජාවගේ ශක්තිය (විභව ශක්තිය) කෙරෙහි දැඩිව විශ්වාසය තබමින් ඒ ඒ පුද්ගලයාගේ (ප්‍රජාවගේ) ගැටලුව දැනෙන, දැවෙන ගැටලුවක් බවට පත් කිරීමට හැකි විපර්යකාරක මැදිහත්වීමක් මත සහභාගීත්ව ක්‍රමවේදය පදනම් වූ ප්‍රජාව බලගැන් වීමේ ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම සිදු වෙයි.

කාර්ය බද්ධ පර්යේෂණයක් ලෙස ආරම්භ වූ මෙම ක්‍රමවේදය තුළින් ප්‍රජා සංවර්ධනයේ දී අපේක්ෂා කරන වෙනස සිදු කිරීම නැතහොත් ප්‍රජාව සවිබලගැන්වීමේ ක්‍රියාවලිය ජාතික සංවර්ධන වැඩසටහන් සඳහා ද ගලපා ගැනීමට විවිධාකාරයෙන් උත්සාහ දරා ඇත. ජනසවිය, සමෘද්ධිය, ගමනැගුම ආදී ජාතික සංවර්ධන වැඩසටහන් සඳහා මෙම ක්‍රමවේදය භාවිතයෙන් ප්‍රජාව සවිබල ගැන්වීම සඳහා උත්සාහ දරා ඇත. එම වැඩසටහන් සඳහා පත් කරන ලද නිලධාරියා මෙම භාරදූර කාර්යය සිදු කිරීමට තෝරාගන්නා ලද විපර්යකාරකයා (සජීවී කාරකයා) වේ. මෙම නිලධාරියා මැදිහත්කරුවා, සජීවිකාරකයා, නැතහොත් විපර්යකාරකයා ලෙස ක්‍රියාත්මක විය යුතු වුව ද ඔහුගේ කාර්යය භාරය සකස්කරන ලද සංවර්ධන සැලසුම් ප්‍රජාව වෙත ගෙනයන සම්ප්‍රධායික නිලධාරී ස්වරූපයටම නැවත

පත්වීම තුළ ප්‍රජා මූලිකව ආරම්භ කරන ලද මෙම ජාතික සංවර්ධන වැඩසටහන් ද සම්ප්‍රදායික සංවර්ධන වැඩසටහන්වල ස්වරූපයටම පරිවර්ථනය වී ඇත.

**නිලධාරියාට ද සජීවීකරුවෙක් විපරකාරකයෙක් විය නොහැකිද?**

නිලධාරියාටද සජීවීකරුවෙක් විපර්යකාරකයෙක් විය හැකි වේ. අවශ්‍ය වන්නේ තම ආකල්පමය වෙනසක් තුළින් ප්‍රජාවගේ ආකල්පමය වෙනසක් ඇති කිරීම සඳහා අවශ්‍ය වන වෙනස ඇතිකර ගැනීමයි. ඒ සඳහා සහභාගිත්ව සංවර්ධන ප්‍රවේශය පිළිබඳව ප්‍රායෝගික භාවිතය නැතහොත් හැදෑරීම අත්‍යවශ්‍යවේ.

ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය වන අපගේ ප්‍රධානම කාර්යය වන්නේ මෙයයි. අප ආයතනය විපර්යකාරක ක්‍රමවේදයේ මහ ගෙදරවේ. ඒ සඳහා අවශ්‍ය පුහුණුව ලබාදීම අප ආයතනයේ අනන්‍යතාවයයි. කොන්දේසි විරහිතව ප්‍රජාව බලගැන් වීමට කැපවුණු ඔබගේ සහායෙන් ප්‍රජාව සවිබල ගැන්වීමේ කාර්යයට අපගේ ආයතනයේ සහාය නොඅඩුව ලබා දීම අපගේ අභිප්‍රායයි. එන්න අපි කතාබහ කරමු. සංවාදයේ යෙදෙමු. ප්‍රජාවට යහපත් හෙට දවසට අවැසි සහාය ඔවුන් හට ලබා දී සතුටු වෙමු.

ආශ්‍රිත ග්‍රන්ථ

ශ්‍රී ලංකා පදනම් ආයතන - සහභාගිත්ව පුහුණු අත්පොත- -1994

ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ අභ්‍යාස කටයුතු සඳහා - ප්‍රජාසංවර්ධනය පුහුණු අත්පොත 1978කොන්රාඩ් - ආඩිනවුර් පදනමේ අනුග්‍රහයෙන්

පෙරේරා අයි. ආර් - පුහුණුක්‍රම වේදය -1996- -හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ ආයතනය

Hewage A. Impact assessment of the change agents programme (1987)

United nations development program (1995)

Chekki D.A. (1979) community Developmant theory and method New Delhi

**සුභාසිනී දිනූෂා අල්ගම**

**පුහුණු හා පර්යේෂණ නිලධාරි,**

**ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය.**

# 02. නව දැක්මක් සඳහා අත්දැකීම් හුවමාරුව: තුලනාත්මක ප්‍රවේශයක්

ජී. ආර්. එම්. ගම්ලත්

"නව දැක්මක් සඳහා අත්දැකීම් හුවමාරුව" යන මාතෘකාව අද නවීන ලෝකයේ රටක ජාතික සංවර්ධනයේ වඩාත් ප්‍රබලව සාකච්ඡාවට බඳුන්වූ සාර්ව-සමාජීය සහ ප්‍රායෝගික මට්ටමේ තේමාවකි. ආයතන, රටවල්, සහ පුද්ගලයන් කෙරෙහි ආරෝපණය වන නව අභියෝග හමුවේ, අත්දැකීම් හුවමාරුව පිළිබඳ විමසුමක් ඉතා වැදගත් වේ. නව අදහස් සහ ප්‍රතිපත්ති බිහි කිරීම පිලිබඳ කාරණය සමාජය තුළ දැඩි විවේචනාත්මක අවදියක පසුවන නිසාවෙන්, සහ තත්ත්වයක පසුවන නිසාවෙන් විශ්වාසනීයත්වය නිර්මාණය වන නිවැරදි තොරතුරු හුවමාරුවක අවශ්‍යතාවය දැඩිව පවතී. මෙවැනි හුවමාරුවක් ඔස්සේ පුද්ගලයින්ගේ සහ සංවිධානවල දැනුම් පදනම ප්‍රවර්ධනය කරමින් වඩාත් ශක්තිමත් හා ඉදිරි දැක්මක් ඇති ආර්ථික සහ සමාජ ක්‍රමවේදයන් තාක්ෂණය සහ සමාජීය අභියෝග හමුවේ සකස් කළ හැකිය. අත්දැකීම් හුවමාරුව යනු එක් පුද්ගලයෙකුට අත්විඳින්නට ලැබුණු දැනුම සහ ප්‍රායෝගික ගැටලු විසඳීමේ අත්දැකීම් වෙනත් පුද්ගලයින් හෝ සමූහයන් සමඟ හුවමාරු කිරීමයි. මේ මගින් නව දැක්මක් ඇතිවීමට පියවරක් ලෙස ප්‍රතිඵලදායකව හැදෑරිය හැකි ක්‍රමවේද සහ සඵලදායි  ප්‍රතිපත්ති බිහි කරයි. විවිධ ක්ෂේත්‍රයන්හි ආරම්භක අදහස්, නවීන තාක්ෂණ, සහ ප්‍රායෝගික ප්‍රවණතා ඔස්සේ ව්‍යාප්ත කරන අතරම සමීපව අරමුණු සඳහා සකස්කළ සංකල්ප සහ අභිරුචි යනුවෙන් ව්‍යාප්ත කරයි. අත්දැකීම් හුවමාරුවක් තුළින් එක් පුද්ගලයෙකුට තවකෙකුගේ දැනුමෙන් සෘජුවම සම්බන්ධ වී, නැවුම් අදහස් හා පරිවර්තන තුළින් අභියෝග සහ ජයග්‍රහණයන් උසස් කිරීමට ඉඩ සැලසෙයි. නව ව්‍යාපාර ආරම්භ කිරීමේදී , ජාත්‍යන්තර වශයෙන් වෙළෙඳාම් පැවැත්වීමේ දී සහ ව්‍යුහමය වෙනස්කම් පාලනයටත් මෙම අත්දැකීම් හුවමාරුව විශාල බලපෑමක් ඇති කරයි. අත්දැකීම් හුවමාරුව තුළින් ලැබෙන ප්‍රධාන වාසිය වන්නේ සාමාන්‍යයෙන් නව විශේෂිත තොරතුරු සමඟ, උපාංග සහ අභිරුචි අතර සෘජු හුවමාරුවක් ඇතිවීම ඔස්සේ ආර්ථික සංවර්ධනය සහ නව අදහස් ඇති කිරීම පිළිබඳව ප්‍රබල සහයකත්වයක් ලබා දීමයි. උදාහරණයක් ලෙස, ආයතන පරිපාලන ක්ෂේත්‍රයේ නව තාක්ෂණික මෙවලම් සහ ප්‍රමිතීන් භාවිතා කිරීමේ අත්දැකීම් හුවමාරුවක් සිදුවූ විට, මෙම ආයතන නව ප්‍රවණතා සහ විශේෂිත ගැටලු සම්බන්ධයෙන් දැනුවත් වන අතර, එමගින් සිය ආර්ථික කාර්යසාධනය වැඩිදියුණු කෙරෙයි. අධ්‍යාපන ක්ෂේත්‍රයේද විශේෂයෙන් අත්දැකීම් හුවමාරුව ප්‍රබල ලෙස නව දැක්මක් ඇති කරන ක්‍රමයකි. පර්යේෂණ කාර්යයන් සිදු කරන විශේෂඥයන් සහ අධ්‍යාපනික විද්වතුන් මෙවන් හුවමාරුවක් තුළින් සිය දැනුම විශ්වවිද්‍යාල, අධ්‍යාපනික ආයතන, සහ ප්‍රායෝගික කාර්යයන්හි විවිධ ප්‍රවණතා හා සංකල්ප සම්බන්ධයෙන් හුවමාරු කරති. අත්දැකීම් හුවමාරුවේදී සමහර අභියෝග පවතී. මුලින්ම, දැනුම සහ අත්දැකීම් හුවමාරු කිරීමේදී ප්‍රචණ්ඩතාවයකින් තොරව සහ එකිනෙකාගේ විශ්වාසය උපරිමය මට්ටමින් තබාගැනීම අත්‍යවශ්‍ය වේ. සමහර විට, අත්දැකීම් හුවමාරුව පවත්වන ව්‍යාපාරික හෝ සමාජීය සංවිධාන තම තොරතුරු සීඝ්‍රයෙන් හුවමාරු කිරීම පසුබෑමකට හේතු විය හැක. එහෙත්, එවැනි අවස්ථාවලදී තබාගැනීමට හා අනුගමනය කිරීමට ඇති පරිසරයන් සඳහා විශ්වාසනීය, සත්‍ය සම්ප්‍රේෂණයක් ඉතාම වැදගත් වේ. මන්ද, මෙහිදී ඉතාම වටිනා දෙය නම් මෙම අත්දැකීම් හුමවමාරුවෙදී සියලු පාර්ශවයන් මනාව විශ්වාසනීයත්වයකින් යුක්තව එකිනෙකාගේ උපයක්‍රමික

අරමුණු හා ඉලක්ක ජයගැනීම සිහියේ තබාගෙන අන්‍යෝන්‍ය බැදීමකින් යුක්තව කටයුතු කල යුතු වීමයි. "නව දැක්මක් සඳහා අත්දැකීම් හුවමාරුව" යන සංකල්පය පුද්ගලයින්, ආයතන, හා රටවල් කෙරෙහිම අතිශය සංවේදී සමාජීය හා ආර්ථික විපර්යාසයන්ට සූදානම් වීමට ශක්තියක් සපයයි. ඒ තුළින් අභියෝග හා අනාගත අවස්ථා හමුවේ, නව දැක්මක් ඇති කිරීමට හැකිවීම ඉහළ මට්ටමක සමාජීය සහ ආර්ථික ව්‍යාපාරික සාර්ථකත්වයට ඉවහල් වේ.

යථෝක්ත ප්‍රවේශය අනුව "නව දැක්මක් සඳහා අත්දැකීම් හුවමාරුව" නැමති සාකච්ඡාව වෙනුවෙන් තුලනාත්මක ප්‍රවේශයක් යොදාගැනීම මීළඟට කතා කලයුතු කාරණය වන අතර මෙම කරුණ හඳුන්වන්නේ ව්‍යාපාරික, සමාජීය සහ සංගත කර්මාන්ත තුළ දැනුම හුවමාරු කිරීමෙන් පසු ව නව අවස්ථා සහ ප්‍රවේශයන් නිර්මාණය කිරීමට අවශ්‍ය මූලිකතාවයක් ලෙසිනි. නව දැක්මක් ඇතිවීමට අත්දැකීම් හුවමාරුවේ තුලනාත්මක ප්‍රවේශයක් යොදාගැනීමෙන් පුද්ගලයින්ගේ සහ සංවිධානවල ගැටලු විසඳීමේ හැකියාව, ව්‍යාපාරික හා සමාජීය ප්‍රායෝගික ප්‍රවේශයන් පෝෂණය කිරීමට සහ ආර්ථික අතිරික්තතාවයක් සෑදීමට හැකියාව ඇත. අත්දැකීම් හුවමාරුව යනු එක් පුද්ගලයෙකු හෝ ආයතනයක දැනුම සහ ප්‍රායෝගික අත්විදීම් වෙනත් පුද්ගලයින් හෝ සමූහයන් සමඟ හුවමාරු කිරීමේ ක්‍රියාවලියක් වන අතර, එය විශේෂයෙන් ප්‍රතිඵලදායක වේ. මෙහිදී නව දැක්මක් ඇති කිරීම සඳහා දැනුම සංක්‍රමණය හා නිවැරදි ප්‍රවේශයන් භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ. තුලනාත්මක විශ්ලේෂණ ක්‍රමවේදයන් භාවිතා කරමින් අත්දැකීම් හුවමාරුව පැවැත්වීම, ප්‍රායෝගික පසුබැසීම්, ප්‍රතිසංස්කරණ අවශ්‍යතා, සහ නව අදහස් ආරම්භ කරනු ලැබූ ආර්ථික හා සමාජීය පසුබැසීම් හඳුනාගැනීම මගින් හුවමාරුවෙහි සාර්ථකත්වය වැඩි කරයි. තුලනාත්මක ප්‍රවේශයක් හඳුනාගැනීමේදී විවිධ අත්දැකීම් හා ප්‍රතිසංස්කරණ ක්‍රම වේදයන් සහිත මනාව සාමාන්‍ය ප්‍රවේශයක් සමග ඒකාබද්ධ කිරීමට හැකි වන අතර, නව දැක්මක් ඉදිරිපත් කිරීමට පෙර යෝජනා කරන ක්‍රමවේද සහ ප්‍රතිපත්ති මනාව විචාර කිරීමට හැකි වේ. සමහර අත්දැකීම් හුවමාරුවීම් තුළ, අලුත් අවස්ථාවන් සහිත සමාජීය අවබෝධ සහ නව ආර්ථික ප්‍රවේශයන් සමග අන්තර්ක්‍රියා කිරීමට අවස්ථාවක් ලැබෙන අතර, තුලනාත්මක ප්‍රවේශයක් භාවිතා කිරීමෙන් මෙම සම්බන්ධතාවය සහ අධ්‍යයනය වඩාත් සාර්ථක වේ. මේ අතර, තාක්ෂණික හා ආර්ථික සීඝ්‍ර වෙනස්කම් වල හමුවේ, අත්දැකීම් හුවමාරුව තුළින් එක් ආයතනයකට අමතරයෙකුගේ නිර්මාණාත්මක හා නවෝත්පාදන ප්‍රවණතා හඳුනා ගැනීමට සහ ඒවා සමඟ වැඩ කිරීමේ හැකියාව තිබේ. අත්දැකීම් හුවමාරුව තුළින් පසුගිය පළපුරුද්දක් සහිත පරිපාලන ප්‍රවේශයන් සම්බන්ධව අධ්‍යයන කිරීමට පමණක් නොව, එය නව ප්‍රවණතා සහ ප්‍රතිපත්ති සකස් කිරීමටත් ආශ්‍රය වන අවස්ථාවකි. ආයතන හෝ සමාජීය කර්මාන්ත තුළ තුලනාත්මක විමසුමක් ඔස්සේ අත්දැකීම් හුවමාරුවක් ඇතිවූ විට, එම අත්දැකීම් විවෘතව සහ භෞතික ආරක්ෂණය සහිතව ලබාදීම නිසා තොරතුරු හා සන්නිවේදන හුවමාරුව වඩාත්ම සාර්ථකයි. අත්දැකීම් හුවමාරුවේ තුලනාත්මක විමසුමක් යොදා ගැනීමෙන් ප්‍රමුඛත්වය සහ වර්ධනය ඇති කරගත හැකි අතර, සම්බන්ධිත කණ්ඩායම් හෝ පුද්ගලයන් අතර නිවැරදි සහ ව්‍යාපෘතික පසුබැසීම් සහිත දැනුම ලබාදීම සඳහා සුදුසු මාවත් සකස් කරයි. තවද, තුලනාත්මක විමසුමක් තුළින්, ප්‍රතිසංස්කරණ, යථාර්ථවාදී ආර්ථික ප්‍රවණතා, සහ තාක්ෂණය තුළ සාර්ථකව එකිනෙකට ගැලපෙන සුදුසු පරිපාලන මග පෙන්වීමට දායක වේ. වැරදි සහ විශ්වසනීය අත්දැකීම් හුවමාරුවක් තුළ ඇති තුලනාත්මක විමසුමක් යොදාගැනීම අනාගතයේ නව දැක්මක් ඇති කිරීමට, සාර්ථක නවෝත්පාදන, සහ සමූහ ක්ෂේත්‍රවල ශක්තිමත් ප්‍රතිඵලයක් ඇති කිරීමට අත්වැලක් වන්නේ ය.

මෙහිදී, අප විසින් සලකා බැලිය යුතු සුවිශේෂ දිගුකාලීන සහ  පොදුවේ පුද්ගලික මෙන්ම ජාතික මට්ටමෙන්ද අප රටෙහි දියුණුව උදෙසා ක්‍රියා කලයුතු අතර, ඒ වෙනුවෙන් "ජාතික සංවර්ධන චින්තනය සහ තිරසාරත්වය උදෙසා

නව දැක්මක් සඳහා අත්දැකීම් හුවමාරුව: තුලනාත්මක ප්‍රවේශයක් යොදාගැනීම" යන සංකල්පය වඩාත්ම අගයක් සහිත ආකල්පයක් ලෙස සැලකිය යුතු වේ. ජාතික සංවර්ධනය සඳහා නවීන අවශ්‍යතා, තිරසාර අනාගතයක් සහිතව ඉදිරිපත් කෙරෙන නව දෘෂ්ටියක් වර්ධනය කිරීමට විශේෂිත මගක් සොයාගැනීමට මේ තුලින් අපව මානුෂීය මෙන්ම විශ්වාසනීය බැදීමකින් යුතුව යොමු කරවයි. ජාතික සංවර්ධන චින්තනයක් සාර්ථකව ක්‍රියාත්මක වීම සඳහා, ප්‍රායෝගික ජාත්‍යන්තර හා දේශීය අත්දැකීම් හුවමාරුවක් තුළින් හඳුනාගත් නවෝත්පාදන ප්‍රවේශයන් සහ ප්‍රතිපත්ති දාමක් සකස් කිරීමට තුලනාත්මක ක්‍රමවේදයන් භාවිතය අත්‍යවශ්‍ය වේ. ජාතික සංවර්ධනයේ වඩාත් කේන්ද්‍රගත අභිමතාර්ථයන් හඳුනා ගැනීම හා එම අභිමතාර්ථයන් ඉලක්ක කරගනිමින් ක්‍රියාත්මක වන නව දැක්මක් සැලසුම් කිරීම ජාතික අභිමුඛව පැවැත්වීම අත්‍යවශ්‍ය වේ. මෙහිදී, අත්දැකීම් හුවමාරුවකින් හා තුලනාත්මක පදනමක් ඔස්සේ විවිධ සංවර්ධන ප්‍රවේශයන් හුවමාරු කරගැනීම මගින්, වර්ධනයට අත්වැලක් වන සාර්ථක ආකල්ප සහ ක්‍රමවේද හඳුනාගත හැකිය. ජාත්‍යන්තර අත්දැකීම් හා දේශීය සංවිධානවල ප්‍රතිපත්ති තුලනය කර, එහි තිබිය යුතු නව ප්‍රවේශයන් හඳුනා ගැනීම තුලනාත්මක ක්‍රමවේදයක් ලෙස සකස් කළ හැකි අතර, ජාතික සංවර්ධන කටයුතු වඩාත් ප්‍රායෝගික සහ තිරසාර බවක් ලබා ගැනීමට උදව් විය හැකිය. තිරසාර සංවර්ධනයට පෙරටම ප්‍රමුඛත්වයක් දී, සාර්ථක ජාත්‍යන්තර අත්දැකීම් හා දේශීය ක්‍රියාවලි හා කාර්ය සාධන ව්‍යුහයන් ඔස්සේ, ජාතික සංවර්ධන කටයුතු සඳහා අර්ථවත් වූ නව දැක්මක් බිහි කළ හැකිය. මෙයට අවශ්‍ය වන පරිදි, ජාතික මට්ටමෙන් නව අදහස් හුවමාරු කිරිම, පුරෝගාමී සංකල්ප හා ක්‍රියාවලියන් හඳුනා ගැනීම, හා නව ප්‍රවේශයන් නිර්මාණය කිරීම තුලනාත්මක පර්යේෂණ කාර්යයන් මඟින් වර්ධනය කළ හැකි වේ. අත්දැකීම් හුවමාරුවක් මගින් දැනුම හා අභිජනක බලපෑම් හුවමාරු කරගෙන, නව විකල්ප සහිතව සංවර්ධන කටයුතු යථාර්ථවාදීව සහ තිරසාර ලෙස ප්‍රායෝගික කරනු ඇත. ජාතික සංවර්ධනයේදී ප්‍රමුඛත්වයක් ඇති සංකල්ප හා කාර්ය සාධනවලදී, තුලනාත්මක විමසුමක් භාවිතා කිරීමෙන් පසුගිය කාලවල අත්දැකීම් හා පළපුරුද්දෙන් ඉගෙනීම හා නව ප්‍රවේශයක් ආරම්භ කිරීමේ හැකියාව ඇති වේ.

තවද, "ජාතික සංවර්ධන චින්තනය සහ තිරසාරත්වය උදෙසා මානව චර්යාත්මක ආකෘතියක අවශ්‍යතාවය" යන කාරණය වඩාත්ම වැදගත් හා අධික අරමුණක් සමඟ විචාර කළ යුතු වේ. ජාතික සංවර්ධන ගමනක් තුළ මානව චර්යාත්මක ආකෘතියක අවශ්‍යතාවය අවධාරණය කෙරෙන්නේ, ආර්ථික හා සමාජීය වාසිය හා ප්‍රායෝගික ප්‍රතිඵල ලබාදීමේදී අනිවාර්ය යෝජනාවක් ලෙසින්ය. මෙමගින් අදහස් කෙරෙන්නේ අද ලෝකයේ සෑම කටයුත්තක් වෙනුවෙන්ම මානව සම්පතේ ඇති විශිෂ්ට සම්බන්ධතාවය වන අතර එය මූල්‍යය සම්පත සමඟ අන්තර් සංයෝජනය වීමෙන් අනෙකුත් සියලුම භෞතික සම්පත් සියල්ල සමඟ සංයෝජනයවී නව්‍ය නිමැයුම් බවට පත්කිරීමේ ක්‍රියාවලියකි. එය අවසානයේදී රටක ජාතික සංවර්ධනයට දායකත්වය සැපයේ. තිරසාර සංවර්ධනයේ අරමුනක් වන්නේ දිගුකාලීනව පැවැත්ම සහිත සාර්ථක සමාජයක් විය යුතු අතර, එය ගොඩනැගීම සඳහා සමාජයේ සෑම අංශයකටම සාධාරණ සහභාගීත්වය අත්‍යවශ්‍ය වේ. මානව චර්යාත්මක ආකෘතියක්, සංවර්ධන සැලසුම් තුළ සම්බන්ධතා සහ ඵලදායී ක්‍රියාවලීන් ගොඩනැගීමට සහ වඩාත් ප්‍රායෝගික ලෙස සංවර්ධනයක් මඟින් තිරසාරත්වයට පත් කිරීමට අවශ්‍යය. එමෙන්ම, සමාජය තුළ ඇති විවිධ පුද්ගලයන්ගේ අවශ්‍යතා, බලාපොරොත්තු සහ සංස්කෘතික විවිධතාවයන් සහිත ප්‍රමාණවත් සංවර්ධන කටයුතුවල ප්‍රවේශයන් සමඟ, මානව චර්යාත්මක ආකෘතියක් උපායශීලීව යොදාගත හැකි වේ. ජාතික සංවර්ධනයේදී, අධ්‍යාපන, සෞඛ්‍ය, සහ පරිසර හුදෙක් ආර්ථික කටයුතුවලට පමණක් සීමා නොවී, සමාජීය සංවර්ධන කටයුතු සඳහාද එම ආකෘතිය අවශ්‍ය වේ. මෙම ආකෘතියක් තුළ පුද්ගලයින්ගේ සහ ප්‍රජා සමාජ සංවර්ධනය සඳහා ඉහළම ප්‍රමුඛතාවයන් ලබාදීමේ ප්‍රමුඛතා අවධාරණය වන අතර, එමගින් සෑම අංශයකටම මනාව වර්ධනය විය හැකිය. සමහර සංවර්ධන කාර්යයන්ගේ අරමුණු සඳහා නිවැරදි හා නවීනතම

තොරතුරු ලබා ගැනීම, නිවැරදි දැනුම ප්‍රසාරණය කිරීම, සහ ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම ආදියට මග සලසයි. මානව චර්යාත්මක ආකෘතියක් පවත්වාගැනීමෙන් පුද්ගලයන්ගේ සහ සංවිධානවල නිවැරදි අනුගමනය, වගකීම් සහ වගවීම සමඟ ක්‍රියාත්මක කිරිමට මග අවසර දේ. එය තිරසාර සංවර්ධන මාර්ගයක් ලෙසින් සලකා බලන විට, නව පරම්පරාව සඳහා නව සංකල්ප සහ ඉහළ ආදර්ශ සැලසුම් කෙරෙහි මනාව අවධානය යොමු කිරීමේ වැදගත්කම ඉහළ යන අතර, එය ජාතික සංවර්ධන පදනමක් වශයෙන් වැඩි කළ හැකි වේ.

එබැවින්, "නව දැක්මක් සඳහා අත්දැකීම් හුවමාරුව," "ජාතික සංවර්ධන චින්තනය සහ තිරසාරත්වය උදෙසා නව දැක්මක්," සහ "මානව චර්යාත්මක ආකෘතියක අවශ්‍යතාවය" යන තේමාවන් එකිනෙකා සමඟ අන්තර් සම්බන්ධතාවයක් ඇති කරයි. මෙය වඩාත්ම ක්‍රියාකාරී සහ කාර්යක්ෂම ජාතික සංවර්ධන මෙහෙවරක් සඳහා මූලික වූ නිවැරදි ආකල්ප, ප්‍රතිපත්ති සහ ප්‍රවේශ හඳුනාගැනීමේ හා ඒවා මනාව ක්‍රියාත්මක කිරීමේ ඉලක්කයක් සහිතයි. "අත්දැකීම් හුවමාරුව" තුල අලෙවිකරණය කරන ලද ප්‍රවේශය තුළින් ප්‍රායෝගික හා විද්‍යාත්මක පදනමකින් පැවති දේශීය සහ ජාත්‍යන්තර අත්දැකීම් එකට එකතු කර ගැනීමෙන්, නව දැක්මක් සඳහා වූ දැක්මක් සකස් කළ හැකිය. ජාතික සංවර්ධන කාර්යයන් ක්‍රියාත්මක කිරීමේදී අත්දැකීම් හුවමාරුවක් මඟින් ලබා ගන්නා ජාත්‍යන්තර හා දේශීය පදනම් සහ ප්‍රතිපත්ති වඩාත් ක්‍රියාත්මක වන අතර, එය තුලනාත්මක අභිමතාර්ථයකට පැවැත්වීමෙන් සංවර්ධන ප්‍රවේශයන් මනාව හැදෑරිය හැකිය. "ජාතික සංවර්ධන චින්තනය සහ තිරසාරත්වය උදෙසා නව දැක්මක්" නව දැනුම හා ප්‍රවේශයන් මඟින් දිගුකාලීනව සහ ආත්මය ශක්තිමත් වන සංවර්ධන අරමුනක් ලෙසින් සංවර්ධන කටයුතු සැලසුම් කිරීමට අවස්ථාව සැලසීමයි. සංවර්ධන ක්‍රියාදාමයන් සාර්ථකව ක්‍රියාත්මක වීම සඳහා අත්දැකීම් හුවමාරුවක් හා තුලනාත්මක ප්‍රවේශයක් සමග, ජාතික පද්ධතියේ අවශ්‍යතා හඳුනාගැනීම සහ පවත්නා අවස්ථා මනාව භාවිතා කිරීම අත්‍යවශ්‍ය වේ. එමෙන්ම, "මානව චර්යාත්මක ආකෘතියක අවශ්‍යතාවය" සලකා බලන විට, ජාතික සංවර්ධන කටයුතුවලදී මානව ප්‍රතිසංස්කරණය සඳහා දියුණු ආකල්ප හා නව දැක්මක් ඉදිරිපත් කිරීම වඩාත් කාර්යක්ෂමයි. සෑම පුද්ගලයෙකුටම සාධාරණ සහභාගීත්වය සැපයීම, සමාජයේ සියලුම අංශ සමානව සංවර්ධනය කිරීමට අවශ්‍ය වන මානව චර්යාත්මක ආකෘතියක්, සංවර්ධන ක්‍රියාවලීන්ට තිරසාරත්වයක් ලබාදීමට මනාව යොදා ගත හැකිය. මේ සියලුම මානව චර්යාත්මක ආකෘතියක්, අත්දැකීම් හුවමාරුවක්, හා තුලනාත්මක ප්‍රවේශයක් එකට ගැළපෙන අතර, එකිනෙකා සමඟ එකතුවී ජාතික සංවර්ධන චින්තනයට සහ තිරසාරත්වය වෙනුවෙන් නව දැක්මක් ඇති කිරීමට මාර්ගෝපදේශයක් ලෙස පවතියි.

ඉහතින් සාකච්ඡා කල සංකල්පීය සහ පරිවර්තීය කරුණු ප්‍රකාරව, නව දැනුම් විශ්වයට අත්දැකීම් හුවමාරු කිරීම යන පද පෙළ මූලික මට්ටම සහ ප්‍රායෝගික මට්ටම තුළ දැනුම් බෙදාගැනීම වැදගත් කරන අතර, ආයතන, රටවල් සහ පුද්ගලයන් සඳහා ඇතිවන නව අභියෝගවලට මුහුණ දීමේදී අත්දැකීම් හුවමාරු කිරීම ඉතාමත් වැදගත් වේ. විශ්වාසදායී තොරතුරු හුවමාරු කිරීම, විශ්වාසය ඇති කිරීම, නව අදහස් සහ ප්‍රතිපත්ති ප්‍රවර්ධනය කිරීම, සහ පුද්ගලයන්ගේ සහ ආයතනවල දැනුම් පදනම ශක්තිමත් කිරීම තුළින් තාක්ෂණික සහ සමාජීය වෙනස්කම් අතර සමාජයේ සහ ආර්ථිකයේ හැඩගැස්වීම් වැඩි කරයි. අත්දැකීම් හුවමාරුව පුද්ගලයන්ට දැනුම සහ විසඳුම් බෙදා ගැනීමට, කාර්යක්ෂම ඉගෙනීමේ ක්‍රම හා නව්‍ය යුක්තියේ ක්‍රම නිර්මාණය සඳහා අවස්ථාවක් සැපයීම තුළින් ක්ෂේත්‍ර හරහා නව්‍ය මෙහෙවරක් ඉටු කරයි. මෙම හුවමාරුව සෘජු සහභාගීත්වය සඳහා අවස්ථාව සලසන අතර, පුද්ගලයන්ට නව දැක්මක් ලබා ගැනීමට සහ අභියෝග නවීන යෝජනා මගින් විසඳීමට අවස්ථාවක් සලසයි. එය ගෝලීය වෙළඳාම, ව්‍යාපාර කළමනාකරණය, සහ ආයතන සංවර්ධනයට බලපෑමක් ලබා දෙන අතර, පරිපාලන සහ

අධ්‍යාපන ක්ෂේත්‍රවල ප්‍රවේශනයන් හරහා තොරතුරු හුවමාරුව ආර්ථික සංවර්ධනයට දායක වේ. කෙසේවෙතත්, විවෘත සහ ගරුසම්මත හුවමාරුවේ අවශ්‍යතාවය සහ තොරතුරු කාලෝචිතව බෙදාගැනීමට ආයතනික හේතු මත ඇති ප්‍රතිරෝධය වැනි අභියෝග මතුවේ. අත්දැකීම් හුවමාරුවේ සමානකරණ අභිවෘද්ධිය විසඳුම් සොයා ගැනීමේ ප්‍රවණතාවය වැඩි කරයි, ප්‍රායෝගික ව්‍යාපාරික විසඳුම් පෝෂණය කරයි, සහ විවිධ ආරංචි ආරංචි වලින් සාර්ථක ක්‍රම රැස් කිරීම හරහා ආර්ථික වර්ධනයට මග පෙන්වයි. ජාතික සංවර්ධනය සඳහා, ප්‍රායෝගික අවබෝධ හුවමාරුව තිරසාර ක්‍රමශීලී ව්‍යුහ රචනා කිරීම තුළ ප්‍රයෝජනවත් වේ, විනිවිද මනා විසඳුම් හරහා සංවර්ධනය උපාය මනින බවට බල කරයි. විශාල මට්ටමක, තිරසාර සංවර්ධනය සඳහා මිනිසුන් මධ්‍යස්ථ ආකෘතියක් වැදගත් වන අතර, ඒකී ආකෘත ක්‍රියාවලියක් තුළ අධ්‍යාපන, සෞඛ්‍ය සහ පාරිසරික තිරසාරභාවය ප්‍රමුඛ කර ඇති ආකෘතියක් අවශ්‍ය වේ. මෙම ආකෘතිය, සමාජයේ සියලුම මට්ටම්වල සාධාරණ වර්ධනය සහ විවිධ පුද්ගල සහ සංස්කෘතික අවශ්‍යතා සැලකිල්ලේදී ප්‍රතිචාරශීලී ප්‍රවේශයන් හරහා ඒකාබද්ධ දායකත්වයක් සපයයි. .

ජී. ආර්. එම්. ගම්ලත්

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,

ගණකාධිකරණ හා මූල්‍ය අධ්‍යයනාංශය,

ව්‍යාපාර අධ්‍යාපන පීඨය,

වවුනියා විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව.

# 03. ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ ඉතිහාසය

පී. ඒ. චිත්‍රා ජයසිංහ

ශ්‍රී ලංකාවේ ග්‍රාමසංවර්ධන ඉතිහාසය ලංකාවේ ඉතිහාසය මෙන්ම දීර්ඝ වුවත් ග්‍රාමසංවර්ධනය යන්න රාජ්‍ය පරිපාලන ආයතනික ව්‍යුහයට එකතුවන්නේ 1940 වානිජ හා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ශාඛාවක් හැටියටය. 1948 වර්ෂයේදී ග්‍රාමසංවර්ධනය සඳහා වෙනම දෙපාර්තමේන්තුවක් පිහිටවනු ලැබූ අතර එහි මූලික කාර්යභාරය වූයේ ග්‍රාමීය ජනතාවට සංවර්ධන ක්ෂේත්‍රයට සහභාගී වීමට හැකිවන පරිදි ග්‍රාමීය මට්ටමින් ජනතාව දැනුවත් කිරීම හා ඒ සඳහා ග්‍රාමසංවර්ධන සමිති පිහිටුවීමයි. මෙම කටයුතු වඩාත් විධිමත්ව පවත්වාගෙන යාම සඳහා පසු කාලීනව ග්‍රාමසංවර්ධන නිලධාරීන් හා ග්‍රාමීය නායකයින් පුහුණු කිරීම සඳහා පුහුණු මධ්‍යස්ථාන ආරම්භ කරන ලද අතර 1970 වන විට යාපනය, අනුරාධපුරය, පුත්තලම, කුරුණෑගල, මාතලේ, මහනුවර, රත්නපුර, බදුල්ල, මාතර හා මඩකලපුව යන දිස්ත්‍රික්කවල පුහුණු මධ්‍යස්ථාන 10 ක්‍රියාත්මකව පැවතුණි. මෙම දිස්ත්‍රික් මධ්‍යස්ථාන සම්බන්ධීකරණය සඳහා ප්‍රධාන මධ්‍යස්ථානයක් අගනුවර මූලික කරගෙන පිහිටුවීමේ අවශ්‍යතාවය පැන නැගුණි. ඒ අනුව 1974 වසරේදී බටහිර ජර්මනියේ කොන්රාඩ් ඇඩිනූර් පදනමේ අනුග්‍රහය ඇතුව දැනට බොරැල්ලේ ක්‍රියාත්මකවන ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය ආරම්භ කෙරුණි. 1974 මාර්තු 08 වන දින රාජ්‍ය පරිපාලන පළාත් පාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍ය පීfලික්ස් ආර්. ඩයස් බණ්ඩාරනායක මහතා සහ කොන්රාඩ් ඇඩිනෝර් පදනමේ ප්‍රධාන කළමණාකාර අධ්‍යක්ෂක ආචාර්ය එච්. ලෙම් බච්මන්ස් මැතිතුමා විසින් විවෘත කර ඇත.

1978 වසරේදී ග්‍රාමසංවර්ධනය සඳහා වෙනම අමාත්‍යාංශයක් පිහිටවනු ලැබුවද 1987 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය අනුව 1988 පළාත් සභා පිහිටුවීමත් සමඟම ග්‍රාමසංවර්ධන විෂය පළාත් සභාවලට පැවරීම සිදුවිය. ඒ අනුව පළාත් මට්ටමේ පුහුණු ආයතන ඒ ඒ පළාත් වලට පැවරුණද ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය තවදුරටත් මධ්‍යම රජය යටතේ පැවතුණි. ඊට හේතුවක් වූයේ එය පුහුණු ආයතනයකට වඩා පුහුණු හා පර්යේෂණ ආයතනයක් වශයෙන් ජාතික මට්ටමෙන් පැවතීමය.

70 දශකය වන විට දකුණු ආසියාතික රටවල කෘෂිකර්ම ක්ෂේත්‍රය නවීකරණය වීමත් සමඟම විශේෂයෙන් යන්ත්‍ර සූත්‍ර භාවිතය, රසායනික පොහොර සහ කෘමිනාශක භාවිතය හේතු කරගෙන කෘෂි නිෂ්පාදන ක්ෂේත්‍රයේ සැළකියයුතු වර්ධනයක් දක්නට ලැබුණද පොදුවේ බලනවිට එම වර්ධනයේ ප්‍රතිලාභ ග්‍රාමීය දුප්පත් ජන කොටස්වලට කාන්දු නොවූ බැවින් පවත්නා සංවර්ධන ප්‍රවාහයේ ප්‍රතිලාභ ග්‍රාමීය දිළිඳු ජන කොටස්වලට අත් කර ගත හැකි සංවර්ධන ප්‍රවේශ පිළිබඳව ආසියානු රටවල සමාජ ආර්ථික විද්‍යාඥයින්ගේ අවධානය යොමු වන්නට පටන් ගැනුණි. 1930 දශකයේ සිට 1948 වර්ෂය දක්වා වූ දශක දෙකක යටත් විජිත පාලන කාලය තුළ ආහාර, පෝෂණය, ඉඩම් හිඟය, කෘෂිකර්මාන්තය හා කර්මාන්ත සංවර්ධනය, අධ්‍යාපනය, සෞඛ්‍ය, යටිතල පහසුකම් ආදී සමාජ ආර්ථික සංවර්ධනයට අදාළ විවිධ සංවර්ධන වැඩසටහන් රාජ්‍ය මැදිහත්වීම මත ලංකාවේද සිදු කර ඇත. එසේම 1948 වර්ෂයේ ශ්‍රී ලංකාව, බ්‍රිතාන්‍ය යටත් විජිත පාලනයෙන් නිදහස් වූ දා පටන් අද වන තෙක්, ග්‍රාම සංවර්ධනය හා දිළිඳුකම පිටුදැකීම සඳහා විවිධ උත්සාහයන් දරා ඇත.

1970 දශකය වන විට ශ්‍රී ලංකාව මෙන් ම යටත් විජිත පාලනයෙන් මිදුණු බොහෝ ආසියාතික රටවල ප්‍රධාන ගැටලුව වී තිබුණේ දුප්පත්කම හා බැඳුණු අභියෝගයන්ය. යටත්විජිත වාණිජ කෘෂිකර්මාන්තය මත පදනම්වූ ශ්‍රී ලාංකීය ජන සමාජය තුළ දරිද්‍රතාව, අගහිඟකම හා සමාජ ආර්ථික විෂමතාව උපරිම මට්ටමට ළඟාවී පැවති අතර, ඒ සඳහා විසඳුම් ලෙස විවිධ ආර්ථික සාධනයට උපකාරී වන සමාජ සුබසාධන වැඩසටහන් හා යටිතල පහසුකම් රාජ්‍ය යාන්ත්‍රණය පෙරටුකරගත් ව්‍යුහයන් ඔස්සේ සපුරා තිබුණි. නමුත් සහනාධාර වෙනුවෙන් රජයට අඛණ්ඩව දැරීමට සිදු වූ අධික පිරිවැය, විදේශ ණය, ගෙවීම් ශේෂ ගැටලුව, දේශීය නිෂ්පාදනය පහළ මට්ටමක පැවතීම, දරිද්‍රතාව, අධික ජනගහන වර්ධනය, සේවා වියුක්තිය, තරුණ අසහනය සහ සමාජ කැළඹිලි උච්ඡස්ථානයට පැමිණ තිබුණි. මෙවැනි බොහෝ තත්ත්වයන්ට ප්‍රධාන වශයෙන් හේතු වූයේ වැරදි හා නොගැලපෙන රාජ්‍ය ප්‍රතිපත්ති සහ රාජ්‍ය කළමනාකරණ පිළිවෙත්ය. මෙම තත්ත්වය ශ්‍රී ලංකාවට පමණක් සුවිශේෂ වූවක් නොව, දකුණු ආසියාව, ශාන්තිකර හා පැසිපික් කලාපයේ පොදු තත්ත්වයක් බැවින්, මීට විසඳුම් සෙවීමේ නව මානයක අවශ්‍යතාවය පැන නැඟී තිබුණි.

එසේම 1974 වර්ෂයේ දී එක්සත් ජාතීන්ගේ ආසියානු සංවර්ධන ආයතනය (United Nations Asian Development Institute) (UNADI) ග්‍රාමසංවර්ධන ප්‍රවේශයන් සාකච්ඡාවට භාජන කරන ලදී. මෙහි අවසාන නිගමනය වූයේ දකුණු ආසියාවේ පවත්නා ග්‍රාමසංවර්ධන ප්‍රවේශයන් තවදුරටත් වර්ධනය හා පෝෂණය කරමින් භාවිතා කිරීම පිළිබඳ අදහසක් හා ග්‍රාමසංවර්ධනය සඳහා ‘අලුතින් නව රාමුවක්’ සකස් විය යුතු බවත් නැතහොත් නව ග්‍රාමසංවර්ධන ප්‍රවේශයක අවශ්‍යතාවයක් ඇති බවයි.

මේ අනුව, 1976 වසරේ දකුණු ආසියාවෙන් තෝරාගත් විශේෂඥ කණ්ඩායමට ජී.වී.එස්.ද. සිල්වා හා ආචාර්ය පොන්නා විග්නරාජා - ශ්‍රී ලංකාව, ආචාර්ය වහිදුල් හක් හා ආචාර්ය අන්සූර් රහමන් - බංගලාදේශය, ආචාර්ය නිරංජන් මේතා - ඉන්දියාව යනරටවල්වල විද්වතුන් ඇතුලත් විය. මොවුන් ග්‍රාමසංවර්ධනය පිළිබඳ ගැඹුරින් විශ්ලේෂණයක් කරන ලදී. ඔවුන් විසින් ඒකාබද්ධව සිදුකරන ලද අධ්‍යයන කිහිපයක් මගින් ග්‍රාමසංවර්ධනය පිළිබඳව විකල්ප ක්‍රමෝපායන් සැළකිල්ලට ලක් කරන ලදී. මෙහි ප්‍රතිඵලයක් ලෙස මේ සම්බන්ධ කරුණු හෙළිදරව් කෙරෙන පොත්පත් කිහිපයක් එළ කෙරිණි. ඉන් මුල් කෘතිය වූයේ "Towards A Theory of Rural Development" (ග්‍රාමසංවර්ධනය පිළිබඳ න්‍යායක් කරා) නැමති කෘතියයි. දෙවැනි කෘතිය වූයේ "Micro Level Development Design and Evaluations of Rural Development" යන ග්‍රන්ථයයි.

මෙයට අමතරව ඉන්දියාවේ මහාරාෂ්ට්‍ර ප්‍රාන්තයේ ‘භූමිසේනා’ ව්‍යාපාරය පිළිබඳ කෙරුණු විග්‍රහය ග්‍රාමසංවර්ධනය පිළිබඳ නව ප්‍රවේශයකට මඟ හෙළිකරවන්නක් විය. ‘භූමිසේනා’ යනු දුප්පතුන් සිය බලය සඳහා ගෙන ගිය අරගලය විස්තර වන විෂය අධ්‍යයනයකි. (Bhoomi - Sena Case study struggle for people’s power)

ග්‍රාමසංවර්ධනය සඳහා නව ප්‍රවේශයන් සොයා යන ගමනේ දී දකුණු ආසියාවේ සමාජ විද්‍යාඥයින්ගේ එම අධ්‍යයන හා නිරීක්ෂණයන්ට අමතරව ඩැග් හැමර්ෂල්ඩ් පදනම විසින් 1975 දී තවත් සංවර්ධනයක් (Another Development) පිළිබඳ අදහස් පළ කරන ලදී. එමඟින් ග්‍රාමසංවර්ධනය සඳහා නව මානයක අවශ්‍යතාවය නව සංවර්ධන ප්‍රවේශයක් හා නව ක්‍රමවේදයක් අවශ්‍ය බව අවධාරණය කරන ලදී. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන්වලද නව ප්‍රතිසංස්කරණයක් ඇතිවිය යුතු බව පෙන්වා දෙන ලදී. මේ අනුව 1977 වන විට දකුණු ආසියාවට අමතරව බටහිර රටවලින් ද ග්‍රාමසංවර්ධනය පිළිබඳ නව ප්‍රවේශයක් සම්බන්ධ අදහස් පලකර තිබුණි. එසේම 1977-1978 වන විට

ඉන්දියාවේ සහ බංගලාදේශයේ විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කර අත්දැකීම් ලබා තිබූ උගතුන් කිහිප දෙනෙකු ශ්‍රී ලංකාවේ ග්‍රාමසංවර්ධනයේ නව දිශානතියක් පිළිබඳ උනන්දු වීම මහත් වාසියක් විය. ඉන්දියාවේ බැංකු කළමනාකරණය පිළිබඳ ජාතික ආයතන (NIBM) මගින් බෙංගාල ප්‍රාන්තයේ ඉතා දුගී ගම්මාන කේන්ද්‍රකරගෙන නව වැඩපිළිවෙලක් ආරම්භ කර තිබුණි. පසුව මෙම වැඩසටහන පීඩීත් (PIDT) නමින් බිහි වූ රාජ්‍ය නොවන සංවිධානය විසින් බාරගන්නා ලදී. බංගලාදේශයේ කොමිල්ලා ප්‍රදේශයේ ඉඩම් අහිමි දුප්පත් කම්කරුවන් කේන්ද්‍රකරගෙන ආරම්භ කළ වැඩසටහන ප්‍රොසිකා නමින් හැදින්විණ. මෙය ඉතා සුවිශේෂී අත්දැකීමක් විය. කිසිදිනක සංවර්ධන ක්‍රියාවලිය හා එක් නොවූ ඉන් ඈත්ව සිටි පිරිස් මෙම වැඩසටහනේ ඉලක්ක කණ්ඩායම් විය.

මේ අනුව ඉන්දියාවේ සහ බංග්ලාදේශයේ නව අත්දැකීම් ශ්‍රී ලංකාවේ මෙවැනි ක්‍රමයක් ආරම්භ කිරීම සඳහා වූ ප්‍රභල උත්තේජනයක් විය. ශ්‍රී ලංකාවේ ග්‍රාමසංවර්ධන පර්යේෂණ මණ්ඩලයේ සාමාජිකයින් කිහිපදෙනෙකු බංග්ලාදේශය හා ඉන්දියාවේ නව ග්‍රාමසංවර්ධන වැඩසටහන් පිළිබඳ අත්දැකීම් ලබා තිබුණි. ජී.වී.එස්. ද සිල්වා මහතා සහ ආචාර්ය පොන්න විග්නරාජා මහතා ශ්‍රී ලංකාවට පැමිණියේ මෙම සියලු අත්දැකීම් පිළිබඳ අවබෝධයකින් යුක්තව ය.

1970 දශකයෙන් පසු දකුණු ආසියාවේ සංවර්ධනය පිළිබඳව කථා කිරීමේදී සහභාගිත්ව සංවර්ධන ක්‍රමවේදය භාවිතයට සුවිශේෂී ස්ථානයක් හිමිවේ. සහභාගිත්ව සංවර්ධන ක්‍රමවේදය හා එහි භාවිතය පිළිබඳව සොයා බැලීමේදී විපර්යකාරක වැඩසටහනට හිමි වන්නේ වැදගත් ස්ථානයකි. ශ්‍රී ලංකාවේ මෙන්ම දකුණු ආසියාවේ විසූ සුවිශේෂී විද්වතුන් කිහිප දෙනෙකුම මෙම විපර්යකාරක වැඩසටහන (Change agent programme) හා බද්ධ වී පර්යේෂණ කටයුතු සිදුකරන ලදී. එලෙසම මෙම වැඩසටහන හා සමගාමීව දකුණු ආසියාවේ රටවල් (ඉන්දියාව, බංග්ලාදේශය, තායිලන්තය) කිහිපයකම විවිධ පර්යේෂණාත්මක වැඩසටහන් දියත් කෙරිණි. එලෙස අත්දැකීම් ලත් හා විවිධ ක්ෂේත්‍ර පිළිබඳ පෘථුල දැනුමකින් හෙබි විද්වතුන් පිරිසක් මෙම විපර්යකාරක වැඩසටහන සඳහා ද තම දායකත්වය සපයන ලදි. ඒ අතර ඉන්දීය ජාතික ආචාර්යය නිරන්ජන් මේතා (Dr.niranjan metha), බංගලාදේශ ජාතික මහාචාර්යය අන්සූර් රහමාන් (Prof. Anisur Rahman), පාකිස්තාන් ජාතික ආචාර්යය වහුඩුල් හක් (Dr.Wahudul Hak), ශ්‍රී ලාංකික විද්වතුන් දෙදෙනකු වූ අචාර්යය පොන්නා විග්න රාජා (Dr.PonnaVignaraja) සහ ජී. වී.එස්ද, සිල්වා (G.V.S. De. Silva) ආදීන් මෙහිදී ප්‍රධාන විය.

මෙම පසුබිම තුල ජර්මනියේ කොන්රාඩ් ඇඩ්නෝර් පදනම, එක්සත් ජාතින්ගේ සංවිධානය, ග්‍රාමසංවර්ධන පර්යේෂණ මණ්ඩලය, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතන සමඟ කරන ලද සාකච්ඡාවන්ගේ ප්‍රතිඵලයක් වශයෙන් ග්‍රාමසංවර්ධනය පිළිබඳ කාර්යබද්ධ පර්යේෂණ ක්‍රියාදාමය ආරම්භ කිරීමට සැලසුම් කරන ලදී. මේවන විට ග්‍රාමසංවර්ධන දෙපාර්තමේන්තුව අයත්ව තිබූ රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින් මේ සඳහා වන පරිපාලන කටයුතු සියල්ල භාර ගත් අතර මූල්‍ය පහසුකම් හා සම්පත්දායක සේවාව කොන්රාඩ් ඇඩ්නෝර් පදනම සහ එක්සත් ජාතින්ගේ සංවිධානය මඟින් ලබා දෙන ලදී.

ඒ අනුව මෙම පර්යේෂණ කාර්යය සඳහා ඉතාම සූක්ෂම අයුරින් සුදුසු පර්යේෂණ කණ්ඩායමක් හඳුනාගත් අතර එයින් පහලොස් දෙනෙකු රාජ්‍ය නිලධාරීන් වූහ. ඊට අමතරව මාධ්‍යවේදීන් එක් අයෙකු සහ ස්වේච්ඡා ක්‍රියාකාරීන් එක් අයෙක් ද මෙම පිරිසට අයත් වූහ. මෙම වැඩසටහන ආරම්භ කිරීම සඳහා තවත් ප්‍රභල සාධකයක් වූයේ රාජ්‍ය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වලින් ලැබුණු සහයෝගයයි. ඒ සඳහා පුරෝගාමී වූයේ ග්‍රාමසංවර්ධන පර්යේෂණ මණ්ඩලයේ සභාපති හා රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම් ලෙස කටයුතු කළ

වී.ඩී.බී. උනන්තැන්න මහතා ය. මෙම සියලු කාර්යයන් ඉටුවීමෙන් පසු 1978 අගෝස්තු මස 28 දින බොරැල්ලේ ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ දී විපර්යකාරක වැඩසටහන ආරම්භ විය.

එක්සත්ජාතීන්ගේ සංවර්ධන ආයතනයේ උපදේශකයන් මූලික පුහුණුකරු කණ්ඩායමේ සම්පත්දායක මණ්ඩලය ලෙස කටයුතු කල අතර පුහුණු කටයුතු පිළිබඳ විමර්ශනය හා ඇගයීම පර්යේෂණ මණ්ඩලය විසින් සිදුකරන ලදී. මෙම පර්යේෂණ මණ්ඩලය රාජ්‍ය පරිපාලන, කර්මාන්ත, සෞඛ්‍ය යන අමාත්‍යංශවල ලේකම්වරුන් සමඟ තවත් විද්වතුන් කණ්ඩායමකින් සමන්විත විය. මහාචාර්ය නන්දාස කෝදාගොඩ, ආචාර්ය කරුණාසේන කොඩිතුවක්කු, වෛද්‍ය තිලක් ගුණසිංහ, ලාල් විජේපාල ආදි විද්වත්හු ඒ අතර විය.

මූලික පර්යේෂණ කණ්ඩායමේ පුහුණු කාලය මාස 15 ක් විය. ඒ සඳහා ශ්‍රී ලංකාවේ පළාත් හතරකින් එකිනෙකට වෙනස් වූ ආර්ථික ක්‍රියාකාරකම් වල නිරත ගම්මාන හතරක් හඳුනා ගන්නා ලදී. ඒ අනුව වැලිගම - මිරිස්ස ගම්මානය, මිනුවන්ගොඩ - මැටිකොටමුල්ල ගම්මානය, අවිස්සාවේල්ල - පින්නවල ගම්මානය සහ උඩුනුවර - මාන්ගමුව ගම්මානය තෝරා ගන්නා ලදී. මෙම පර්යේෂණ කණ්ඩායම් අදාළ ගම්මානයන් හි උත්ප්‍රේරක මැදිහත්වීමකින් යුතුව පර්යේෂණ කාර්යෙහි නිරත වෙමින් හෙළි කරගත් කරුණු ජනතාව සමඟ සාකච්ඡා කරමින් විග්‍රහ කරගනිමින් සංවර්ධනයේ බාධාවන් බිඳ හෙලීමට ගතයුතු ක්‍රියාමාර්ග ජනතාව තුළින්ම හඳුනා ගැනීමේ කාර්යයෙහි නිරත වූහ. මෙම පර්යේෂණාත්මක ක්‍රියාවලිය තුල හඳුනාගත් විපර්යකාරක ක්‍රමවේදයේ විශේෂත්වය වන්නේ විමර්ශනය, විග්‍රහය හා යථාර්ථය හඳුනාගැනීම යන සියලු කරුණු ක්‍රියාවලියක් බවට පත්කරලීමයි. මේ තුල පුද්ගලයාගේ දැනුවත් වීම හා විඥානය පිබිදවීම සිදුකරනු ලබයි. විපර්යකාරක වැඩසටහන තුල අවධාරණය කෙරෙන මෙම යටපත් වූ විභව ශක්තීන් උද්දීපනය 1990 දශකයේ දී සමාජ සජීවිකරණය ලෙස ප්‍රචලිත විය.

ඒ අනුව ශ්‍රී ලංකාවේ ද ස්ව ශක්තිය හා සහභාගීත්වය මත පිහිටා ක්‍රියාත්මක වීම තුළ ග්‍රාමීය දිළිඳු ජනතාවට තම ජීවිතවල සැලකිය යුතු වෙනසක් ඇතිකර ගත හැකිය යන උපකල්පනය මත පිහිටා 1978 වර්ෂයේදී නියාමක ව්‍යාපෘතියක් ලෙස පර්යේෂණ මට්ටමින් ආරම්භ කරනු ලැබූ විපර්කාරක වැඩසටහන නමින් එවකට හඳුන්වනු ලැබූ සහභාගිත්ව සංවර්ධන ප්‍රවේශය අද ශ්‍රී ලංකාවේ ග්‍රාමසංවර්ධන ක්ෂේත්‍රයේ විශාල වෙනසක් ඇති කිරීමට සමත්ව සිටී. රජය මේ සංවර්ධන ප්‍රවේශය සමෘද්ධි වැඩසටහන, ගැමිදිරිය වැඩසටහන, ජනසවිය වැඩසටහන වැනි දිළිඳුකම දුරලීමේ ජාතික මට්ටමේ සංවර්ධිත වැඩසටහන්වල ක්‍රමවේදය ලෙස යොදාගෙන ඇති අතර, රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානද ජනතාව දැනුවත් කිරීමේ හා සංවිධානය කිරීමේ ක්‍රියාවලියේදී මෙම ක්‍රමවේදය සාර්ථකව යොදා ගනිමින් සිටිති. 1978 වසරේ ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ කාර්යබද්ධ පර්යේෂණයක් ලෙස ආරම්භ වූ මෙම නියාමන වැඩසටහන ග්‍රාමීය ජනතාව ස්වශක්තිය හා සහභාගිත්ව යන මූලධර්ම මත දැනුවත් කිරීමේ හා සංවිධානය කිරීමේ සාර්ථක ක්‍රමවේදයක් බිහිකිරීමට සමත් විය. ඊට අමතරව මෙම ක්‍රමවේදය භාවිතා කරමින් තෝරාගත් ගම්මාන කිහිපයක දිළිඳුකම දුරලීමේ සංවර්ධන වැඩසටහන ලෙසද ක්‍රියාත්මක වෙමින් පවතී.

1978 සිට 1998 දක්වා මෙම පුහුණු හා පර්යේෂණ ක්‍රමවේදය ගොඩනැගීම හා දිළිඳුකම දුරලීමේ වැඩසටහනක් ලෙස තෝරාගත් ගම්මානවල විපර්යකාරක වැඩසටහන ක්‍රියාත්මක වීම මූලික වශයෙන් සිදු වූයේ විදේශ ආධාර මතය. මුල්ම අදියරේදී කොන්රාඩ් ඇඩිනෝර් පදනමද ඊට පසු කෙයාර් සංවිධානයද මෙම වැඩසටහන සඳහා ආධාර සැපයූ අතර 1987-1997 දක්වා දීර්ඝ කාලයක් සීඩා ආයතනය (SIDA) විසින් වැඩසටහන පවත්වාගෙන යාම සඳහා මූල්‍ය ආධාර සපයන ලදී.

1997 දක්වා කාලය තුළ වැඩසටහන පවත්වාගෙන යාමේදී දක්නට ලැබූ සුවිශේෂීතාවයක් වූයේ

වැඩසටහන පර්යේෂණ මට්ටමින් ක්‍රියාත්මක වීම

වැඩසටහන් සඳහා අඛණ්ඩව විදේශ ආධාර ලැබීම

ආයතනයේ අධ්‍යක්ෂවරයා ඇතුළු කාර්ය මණ්ඩලයට උපදේශක මණ්ඩලයක හෝ මෙහෙයුම් මණ්ඩලයක සහාය ලැබීම

වැඩසටහන පවත්වාගෙන යාමේදී එක්තරා ස්වාධීනත්වයකින් සහ නම්‍යතාවයකින් යුතුව කටයුතු කිරීමට හැකිවීම.

මුල් අවධියේදී මෙම ආයතනයට ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොවූවත් විදේශ ආධාර භාවිතා කර රාජ්‍ය නොවන පුහුණුකරුවන් යොදා ගැනීමටද අවශ්‍ය අවස්ථාවල බාහිර පුහුණුකරුවන් හා පර්යේෂකයින් ඇතුළු බාහිර සම්පත්දායකයින් යොදවා ගැනීමටද හැකි වීම සහ තීරණ ගැනීමේදී උපදේශක මණ්ඩලයේ මඟ පෙන්වීම හා මෙහෙයුම් කමිටුවේ නම්‍යශීලී භාවය ද ආයතනයේ කටයුතුවල ප්‍රගතිය කෙරෙහි මහත් බලපෑමක් ඇති කළේය.

එසේම 90 දශකය මුල් භාගයේ සිට ආයතනය තුළ පර්යේෂණ හා ප්‍රකාශන අංශයක් බිහිකිරීමද, පිළිමතලාව පුහුණු මධ්‍යස්ථානය වැඩිදියුණු කර ආයතනයේ පුහුණු කටයුතු පුළුල් කිරීමටද එම විදේශ ආධාර යොදා ගැනීමට ඉඩ ප්‍රස්ථාව ලැබුණි.

ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය අගනුවර පිහිටි ජාතික මට්ටමේ ආයතනයක් වුවත් නිරන්තර අමාත්‍යාංශවල ශාඛාවක් ලෙස ක්‍රියාත්මක විය. 1990 දශකය මුල් භාගය වනතුරු ඊට අනුමත කාර්ය මණ්ඩලයක් පවා තිබුණේ නැත. අමාත්‍යාංශය වෙනස්වීම් අනුව කාර්ය මණ්ඩල පවා අතීතයේදී වෙනස්වීම්වලට භාජනය වී ඇත. 1986 වන විට ග්‍රාමසංවර්ධන අමාත්‍යාංශයක් තිබුණද ග්‍රාමසංවර්ධන හා අභ්‍යාස පර්යේෂණ ආයතනය ක්‍රියාත්මක වූයේ සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය යටතේය. එක් අවස්ථාවක ග්‍රාමසංවර්ධන අමාත්‍යාංශයෙන් ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයට මුදාහැර තිබූ ග්‍රාමසංවර්ධන නිලධාරීන් ආපසු කැඳවීම නිසා එම ආයතනයට සිය වැඩසටහන් සඳහා තාවකාලිකව රාජ්‍ය නොවන නිලධාරීන් පිරිසක් බඳවා ගැනීමට සිදුවිය. 1994 වර්ෂය වන විට ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය පැවතුණේ රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු භාර අමාත්‍යාංශය යටතේය. 1994 වසරේ නව රජයක ආරම්භයත් සමගම ආයතනය සමෘද්ධි හා යෞවන කටයුතු භාර අමාත්‍යාංශයේ විෂය පථයට පැවරුණි. ඉන් පසුව ආයතනයේ මූලික කාර්යභාරය වූයේ සමෘද්ධි වැඩසටහන සාර්ථක කර ගැනීමට අවශ්‍ය පුහුණු වැඩසටහන් පවත්වාගෙන යාමය. ජාතිය ගොඩනැගීමේ හා වතු යටිතල පහසුකම් අමාත්‍යාංශය යටතේද පැවැති අතර වරින් වර අමාත්‍යාංශ මාරුවීම් සමගම ආයතනයේ අධ්‍යක්ෂවරු මාරුවීම, ක්‍රියාත්මක වූ වැඩසටහන්වල ස්වරූපය හා ප්‍රමුඛතාවය මාරුවීම ආදී කරුණු සිදුවිය. වර්තමානය වන විට ආයතනයේ අධ්‍යක්ෂවරුන් 23 දෙනෙකු සේවය කර ඇති අතර ඔවුන්ගේ නාමලේඛණය පහත පරිදි දැක්විය හැක.

| අනු අංකය | අධ්‍යක්ෂකගේ නම | සේවය කළ වර්ෂ |
|---|---|---|
| 1 | මනෝපෙරේරා මහතා | 1980-1990 වසරවල, වසර නිෂ්චිත නැත. |
| 2 | සී.අබේගුණවර්ධන මහතා | 1980-1990 වසරවල, වසර නිෂ්චිත නැත. |
| 3 | ඒ.පී.ඩයිනීස් මහතා | 1991,1992,1993,1994 |
| 4 | යූ.ඒ.සෙනෙවිරත්න මහතා | 1995,1996,1997,1998,1999,2000 |
| 5 | ආර්.ආර්.එම්. අමරතුංග මහතා | 2000,2001,2002 |
| 6 | ලයනල් විජේරාම මහතා | 2002,2003 |
| 7 | රවින්ද්‍ර හේවාවිතාරණ මහතා | 2004,2005 |
| 8 | බර්නාඩ් වසන්ත මහතා | 2006,2007,2008 |
| 9 | එච්.එම්.සුනිල් පද්මශාන්ත මහතා | 2009,2010 |
| 10 | තිලක් හෙට්ටිආරච්චි මහතා | 2011,2012 |
| 11 | අනුෂා ගෝකුල ප්‍රනාන්දු මිය | 2012 |
| 12 | රවින්ද්‍ර පද්මප්‍රිය මහතා | 2012,2013 |
| 13 | සාරන්කන් මහතා | 2013,2014 |
| 14 | සමන් ඩී වඩුගේ මහතා | 2015 |
| 15 | ජී.කේ.එස්. චන්ද්‍රලතා මිය | 2016 |
| 16 | සුජීවා තිසේරා මිය | 2016 |
| 17 | චතුර උමගිලිය මහතා | 2017 |
| 18 | ක්‍රිශාන්ති කාරියවසම් මිය | 2017 |
| 19 | අයි.සී.ජේ.ගුණරත්න මහතා | 2018 |
| 20 | කේ.ඒ.ජී. ප්‍රේමලාල් මහතා | 2019 |
| 21 | ටී.ඒ. රණසිංහ මහතා | 2020,2021,2022 |
| 22 | ආර්.කේ.සමන් අනුර මහතා | 2023 |
| 23 | තිලිණි සුරංගිකා කරස්නාගොඩ මිය | 2023,2024 |

1998 වසරේ දී විදේශ ආධාර අත්හිටුවීමෙන් පසු මේ දක්වා ආයතනයේ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන්නේ මූලික වශයෙන් භාණ්ඩාගාරයෙන් ලැබෙන අරමුදල් මගිනි. 1974 වසරේදි ග්‍රාමසංවර්ධන දෙපාර්තමේන්තුවේ අංශයක් ලෙස ආරම්භ කරන ලද ග්‍රාමසංවර්ධන පුහුණු හා පර්යේෂණ ආයතනයට 2024 වසරේ මාර්තු 08 දිනට වසර 50 ක් ගත වී ඇති අතර ආයතනයේ විපර්යකාරක වැඩසටහන ආරම්භකර 2024.08.28 දිනට වසර 46 ක් ගතවන මෙම මොහොතේ ආයතනය කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වෙමින් පවතී.

පී.ඒ. චිත්‍රා ජයසිංහ

පුහුණු හා පර්යේෂණ නිලධාරි,

ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය.

# 04. විපර්යකාරක වැඩසටහන

ඒ. එන්. විතානගේ

ශ්‍රී ලංකාව යටත් විජිත පාලන සමයෙන් අත්මිදෙත්ම, එදා මෙදා තුර ගෙවුණු කාල වකවානුව සංවර්ධනය නම් බහුමානික සංකල්පය යථාර්ථයක් බවට පත්කරගනුවස් ක්‍රියාත්මක කරනු ලැබූ විවිධ ප්‍රයත්නයනගේ සංකලනයක් දක්නට ලැබෙයි. ඒ අනුව දිළිඳුකම පිටුදැකීම සඳහා එදා මෙදාතුර බලයට පත් වූ සැම රජයක්ම පාහේ නොයෙකුත් සංවර්ධන ව්‍යාපෘතීන් ජනගතකර තිබේ. මෙහි දී සාකච්ඡාවට බඳුන් කරන විපර්යකාරක වැඩසටහන දිළිඳුකම පිටුදැකීම උදෙසා වැදගත්වන්නේ සහභාගීත්ව සංවර්ධන ප්‍රවේශය භාවිතා කරමින්, දිළිඳු ප්‍රජාව ඉලක්ක කරගනිමින්, දිළිඳුකම පිටුදැකීම අරමුණු කරගනිමින් රජය විසින් හඳුන්වා දෙන ලද ප්‍රථම සහභාගීත්ව සංවර්ධන වැඩසටහන විපර්යකාරක වැඩසටහන වන නිසාවෙනි.

මෙම වැඩසටහනෙහි ආරම්භය හා විකාශනය මෙන්ම එහි වර්තමාන භාවිතය කෙබඳු දැයි යන්න විමසා බැලීම තුළින් විපර්යකාරක වැඩසටහනෙහි ප්‍රායෝගික භාවය පිළිබඳව අවබෝධයක් ලබාගත හැකි වේ. වර්තමානයේ කාන්තා ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය මගින් 1978 වර්ෂයේ දී ආරම්භ කරන ලද කාර්යබද්ධ ග්‍රාම සංවර්ධන පුහුණු හා පර්යේෂණ ව්‍යාපෘතියේ ප්‍රතිඵලයක් වශයෙන් බිහි වූ වැඩසටහන විපර්යකාරක වැඩසටහන නමින් හඳුන්වා ඇත. යටත්විජිතකරණයේ අසමතුලිත සංවර්ධන භාවිතයන් හේතුකරගෙන ඇතිවූ ග්‍රාමීය නාගරික සමාජ විෂමතාව නොයෙකුත් සමාජ අර්බුදයන් නිර්මාණය කරන්නට විය. මේ නිසා නව සංවර්ධන ප්‍රවේශයක අවශ්‍යතාව 70 දශකය තුළ ඉස්මතු වන්නට විය.

විපර්යකාරක වැඩසටහන පදනම් වූ කාර්යබද්ධ පර්යේෂණ ක්‍රියාවලිය ආරම්භයට බලපෑ දේශීය හේතූන් එසේ වුවද තුන්වන ලෝකයේ රටවල්වල දශක ගණනාවක ක්‍රියාත්මක වූ සම්ප්‍රදායික සංවර්ධන ක්‍රමෝපායන් මගින් ද ග්‍රාමීය සංවර්ධන ඉලක්කයන් මුදුන්පැමිණුනාදැයි යන්න ප්‍රශ්නාර්ථයකි. සාම්ප්‍රදායික සංවර්ධන ක්‍රමවේදයේ දී සිදු වන්නේ රජය විසින් සංවර්ධන සැලසුම් සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ඇගයීම සිදු කරනු ලබන අතර ප්‍රජාවට සිදුවුයේ ඉලක්කගත ප්‍රතිලාභීන් බවට පත්වීමට ය. එබැවින් මෙම අභියෝගය ජය ගැනීම සඳහා දිළිඳු ප්‍රජාව උදෙසා විශේෂ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව මතු විය. සීමිත සම්පත්වලින් වැඩි පිරිසකට ප්‍රතිලාභ සැලසීමට හැකිවන පරිදි විකල්ප සංවර්ධන ප්‍රවේශයන් සොයා බැලීමට සංවර්ධනවේදීන් උත්සුක විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස 1970 දශකයෙ සහභාගීත්ව සංවර්ධන ක්‍රමවේදය තුන්වන ලෝකයේ රටවල්වල අනුගමනය කිරීමට පෙළඹුණි.

1970 දී ශ්‍රී ලංකා රජය ජර්මනියේ කොන්රාඩ් ඇඩිනොර් පදනම සමඟ ඇතිකර ගන්නා ලද ගිවිසුම විපර්යකාරක වැඩසටහන මෙරට ආරම්භවීමට බලපෑ ප්‍රධාන හේතුවක් ලෙස විශ්ලේෂකයෝ හඳුන්වති. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් 1977 ග්‍රාම සංවර්ධන සමිති නිලධාරීන් පුහුණුව ඇගයීමට ලක් කරන ලද අතර එම පුහුණුව අපේක්ෂිත අරමුණ ඉටුකර ගැනීමට අපොහොසත් වූ බව පැහැදිලිවී ඇත. 1974 වර්ෂයේ දී ආසියා පැසිෆික් සංවර්ධන ආයතනය හා ග්‍රාම සංවර්ධනය සම්බන්ධයෙන් ක්‍රියාකාරී කටයුතුවල නිරත විශේෂඥයින් පිරිසක් (ආචාර්ය මහිදූර් හක්, ආචාර්ය අන්සූර්

රහමන්, ආචාර්ය නිරන්ජන් මේතා, ආචාර්ය පොන්න විග්නරාජා සහ ජී.වී.එස්. ද සිල්වා) අතර ඇතිවූ සාකච්ඡාවකින් අනතුරුව නිගමනය වූයේ දකුණු ආසියාවේ සංවර්ධනය උදෙසා නව ග්‍රාම සංවර්ධන ප්‍රවේශයක අවශ්‍යතාවයයි. ග්‍රාම සංවර්ධනය සඳහා නව මානයක් සොයා යන ගමනේ දී දකුණු ආසියානු සමාජ විද්‍යාඥයින්ට සමගාමීව ඩැක් හැමර්සල් පදනම විසින් ද 1975 දී සංවර්ධනය පිළිබඳව තවදුරටත් අදහස් ඉදිරිපත් වූ අතර එමගින් ද අවධාරණය කරනු ලැබ ඇත්තේ ග්‍රාම සංවර්ධනය පිළිබඳව නව ප්‍රවේශයක අවශ්‍යතාවයයි. එමෙන්ම 1978 වර්ෂයවන විට ඉන්දියාවේ හා බංගලාදේශයේ අත්දැකීම් ලබා තිබූ උගතුන් කිහිපදෙනෙකුද ශ්‍රී ලංකාවේ ග්‍රාම සංවර්ධනය පිළිබඳව අවධානය යොමු කිරීම නව දිශානතියක හැරවුම් ලක්ෂයක් විය.

මෙවැනි පසුබිමක් තුළ ජර්මනියේ කොන්රාඩ් ඇඩිනොර් පදනම, එක්සත් ජාතීන්ගේ සංවිධානය, ග්‍රාම සංවර්ධන පර්යේෂණ මණ්ඩලය, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය සමග කරන ලද සාකච්ඡාවක ප්‍රතිඵලයක් වශයෙන් ග්‍රාම සංවර්ධනය පිළිබඳ කාර්යබද්ධ පර්යේෂණ ක්‍රියාදාමය ආරම්භ කිරීමට සැලසුම් කරන ලදී. ඒ අනුව පර්යේෂණ කාර්යය සඳහා සුදුසු කණ්ඩායමක් තෝරාගෙන එක්සත් ජාතීන්ගේ සංවර්ධන ආයතනයේ ජාත්‍යන්තර උපදේශකවරුන්ගේ සම්පත් දායකත්වයෙන් සහ අධීක්ෂණය හා ඇගයීම පර්යේෂණ මණ්ඩලයක් (මහාචාර්ය නන්දදාස කෝදාගොඩ, ආචාර්ය කරුණාසේන කොඩිතුවක්කු, වෛද්‍ය තිලක් ගුණසිංහ, ලාල් විජේපාල) විසින් සිදුකරන ලදී.

පුහුණු කාලය මාස 15ක් වූ මූලික පර්යේෂණ කණ්ඩායම ශ්‍රී ලංකාවේ පළාත් 4කින් එකිනෙකට වෙනස් වූ ආර්ථික ක්‍රියාකාරකම්වල නිරත ගම්මාන 4ක් (වැලිගම - මිරිස්ස, මිනුවන්ගොඩ - මැටිකොටමුල්ල, අවිස්සාවේල්ල - පින්නවල, උඩුනුවර - මාන්ගමුව) තෝරාගන්නා ලදී. මෙම ගම්මානවල කණ්ඩායම් වශයෙන් නේවාසික වෙමින් දිළිඳු ප්‍රජාව අතර වෙසෙමින් ඔවුන් සමග සාකච්ඡා කරමින් ගැටළු හඳුනාගෙන ඒවා විග්‍රහ කරගනිමින් එම ගැටළු සඳහා විසඳුම් ප්‍රජාව තුළින්ම මතුකරගෙන සංවර්ධනයේ ඌණතාවයන් පූර්ණයකර ගැනීමට අදාළව ගතයුතු ක්‍රියාමාර්ග ජනතාව තුළින්ම හඳුනාගැනීමේ කාර්යයේ නිරත විය. ගැඹුරු විමර්ශන ක්‍රියාවලියක් මගින් සිදුකරනු ලබන මෙම අධ්‍යනය මැදිහත්කරුගේ උත්ප්‍රේරණය මත පුද්ගලයාගේ විඥණය පිබිදවීමක් සිදුකරනු ලබන අතර එමගින් සැඟවුණ විභව ශක්තීන් උද්දීපනය කර සමාජය සජීවී කරණයට ලක් කරනු ලබයි. එසේම මෙහි දී මැදිහත්කරු ඉහළ සිට පහළට ගලායන සිරස් සබඳතාවල අවාසිදායක තත්ත්වය සහ ප්‍රජාව සමග සමානව කරනු ලබන තිරස් සන්නිවේදනයේ



අර්ථවත් භාවය මතින් ගොඩනගා ගන්නා සංවිධානාත්මක ගමන් මගක අශ්‍යතාවය හඳුනාගනියි. සමාජ, ආර්ථික, දේශපාලන යන සැම අංශයකම භෞතිකව, අභෞතිකව සිදුවන්නා වූ වර්ධනය ස්වශක්තිය හා සහභාගිත්වය මත පදනම්ව ගොඩනැගෙන ආකාරය මෙම විපර්යකාරක වැඩසටහන තුළ පුළුල්ව විග්‍රහවන බව හඳුනාගත හැකිය. මෙම ක්‍රියාවලිය කුඩා කණ්ඩායම් තුළින් ආරම්භවී තීරණ ගැනීම, ක්‍රියාත්මක කිරීම සහ ඇගයුම හා මෙහෙයුම ප්‍රජාවගේ දායකත්වය මත සිදුකරනු ලබන අතර මෙකී සාධනීය ලක්ෂණ හේතුකොටගෙන දිළිඳුකම පිටු දැකීම සඳහා විපර්යකාරක වැඩසටහන සක්‍රියව දායක කරගත හැකි මූලාශ්‍ර අධ්‍යයනයේ දී පැහැදිලි වේ.

විපර්යකාරක වැඩසටහනෙහි ආරම්භක අවදිය එනම් 1978-1984 දක්වා කාල පරාසය පර්යේෂණාත්මක අවධිය ලෙස පර්යේෂකයෝ විසින් හඳුනා ගැනෙති. 1985-1989 කාල වකවානුව විපර්යකාරක වැඩසටහනෙහි විකාශය සම්බන්ධයෙන් සාකච්ඡා කරන විට වැදගත් වේ. ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ කළමනාකාරිත්වය හා මූලික පර්යේෂණ කණ්ඩායමේ ඇතැම් පුහුණුකරුවන් අතර ඇතිවූ අහිතකර තත්ත්වයන් විපර්යකාරක වැඩසටහනෙහි ව්‍යාප්තිය කෙරෙහි බලපෑම්කර ඇත. එමෙන්ම 1989 කාල වකවානුව තුල ඇතිවූ සමාජ ව්‍යාකූලත්වය ද මෙම වැඩසටහනෙහි ව්‍යාප්තිය කෙරෙහි නිශේධනාත්මක ලෙස බලපා ඇත. එසේ වුවද 1987 වන විට දිවයිනේ දිස්ත්‍රික්ක 13ක ගම වළලු 73ක වැඩසටහන ක්‍රියාත්මකව පැවතිබව වාර්තාවේ. එසේම ඒකාබද්ධ ග්‍රාමසංවර්ධන ව්‍යාපෘති සඳහා සමාජ සජීවිකරණය බද්ධකර ගැනීම ආරම්භවී ඇත්තේ ද මෙම කාලපරිච්ඡේදය තුළ දී වේ.

1990-1995 කාල වකවානුව විපර්යකාරක වැඩසටහනෙහි සංවර්ධනාත්මක අවධිය ලෙස විද්වතුන් විසින් හඳුනාගනු ලැබෙති. රජයේ වැඩසටහනක් ලෙස ක්‍රියාත්මක වූ ජනසවිය වැඩසටහන විපර්යකාරක ක්‍රමවේදය තුළින් හඳුන්වා දුන් සහභාගීත්ව සංවර්ධන ප්‍රවේශය ජාතික මට්ටමින් භාවිතයට ලක්වූ අවස්ථාවක් ලෙස හඳුනාගත හැකිය. එමඟින් අපේක්ෂාකර ඇත්තේ සෑම ගමකම සජීවීකරුවන් පිරිසක් බිහිකර ගැනීම, සහාය පද්ධතීන් දිළිඳුකම පිටුදැකීමේ අරමුණට සංවේදීව නැඹුරුකර ගැනීම සහ දුප්පතුන් නිෂ්පාදන ක්‍රියාවලියට දායකකර ගැනීම ආදියයි. 1992 වන විට විපර්යකාරක වැඩසටහන තුළ ගොඩනැගුණ සංවිධාන ජාලය පුළුල් වීමත් සමඟ ප්‍රාදේශීය සංවිධාන ගොඩනැගී ඇත. මෙහි දී අඩු ආදායම්ලාභී සාමාජික පිරිස් තම නිෂ්පාදන, අලෙවි පාරිභෝගික අවශ්‍යතා සපුරා ගැනීම සඳහා ඵලදායිව යොදාගෙන ඇති අතර සාමාජික ප්‍රජාවගේ මූල්‍යමය අවශ්‍යතා සපුරාලන ක්ෂුද්‍ර මූල්‍ය ආයතන පද්ධතියක් ලෙස ක්‍රියාත්මකවී ඇත. 1996න් පසු විපර්යකාරක වැඩසටහනෙහි ගමන් මඟ වෙනස්වී ඇත. එනම් සියලු ප්‍රාදේශීය සංවිධාන සූක්ෂම මූල්‍ය ආයතන පද්ධතියක් බවට පත්වීම හේතුවෙන් සුළු පරිමාණ මූල්‍ය ක්‍රියාවලිය දිළිඳුකම පිටුදැකීමේ ප්‍රබල උපායමාර්ගයක් ලෙස ජනප්‍රියවී ඇත. සාමාජික ඉතුරුම්, පොදු අරමුදල, කුඩා පරිමාණ මූල්‍ය පහසුකම් සැපයීමේ ක්‍රියාවලිය පිළිබඳ අත්දැකීම් විපර්යකාරක කුඩා කණ්ඩායම් ක්‍රියාවලිය තුළ ගොඩනැගී ඇත.

1997 ප්‍රාදේශීය මට්ටමේ ප්‍රජා මූල සංවිධාන ඒකාබද්ධ කරමින් ප්‍රජා ශක්ති මහා සංගමය බිහිවී ඇත. ප්‍රජා ශක්ති සංවිධාන පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා කළමනාකරණය, ආයතනික හා මූල්‍යමය ශක්තීන් වර්ධනය කිරීම මෙහි මූලික අරමුණවී ඇති අතර සම්පත්, දැනුම හා අත්දැකීම් හුවමාරුව, විපර්යකාරක ක්‍රමවේදය ප්‍රචලිත කිරීම, සංවර්ධන වැඩසටහන් සඳහා සහභාගීත්ව සංවර්ධන ප්‍රවේශය යොදාගැනීමට පෙළඹවීම සෙසු අරමුණුවී ඇත.



කෙසේ වෙතුදු විපර්යකාරක වැඩසටහන දෙස නැවත හරි බැලීමේ දී පැහැදිලි වන්නේ දිළිඳු ප්‍රජාව සවිබල ගැන්වීමේ දී ඔවුන් මුහුණ දෙන්නා වූ සමාජ ආර්ථික වපසරියන් පිළිබඳව ගැඹුරු විග්‍රහයක යෙදීම අත්‍යාවශ්‍ය බවයි. තවදුරටත් ඔවුන් එල්බගෙනසිටින යැපුම් මානසිකත්වයෙන් මුදවා ගැනීමට නම් ස්වශක්තිය හා සහභාගීත්වය මත ගොඩනැගුණ සමාජ සජීවිකරණ ක්‍රියාවලියක අවශ්‍යතාවය ද වැදගත්වන බව පැහැදිලි වේ. එමෙන්ම විපර්යකාරක වැඩසටහන තුළින් අවධාරණය කරන සාමූහිකත්වය, එකිනෙකාට ගරු කිරීම, අන්‍යෝන්‍ය සුහදත්වය, නායකත්වයට

හුරු කිරීම, අසාධාරණත්වයට විරුද්ධව නැඟී සිටීම, අයිතිවාසිකම් වෙනුවෙන් ඉදිරිපත් වීම සහ ඒවා දිනා ගැනීම, එකිනෙකාගේ දියුණුව වෙනුවෙන් කැපවීම, අභිමානය හා ගෞරවය තුළින් සමාජ තත්ත්වයේ සාධනීය වෙනසක් ඇති කිරීම යනාදී සාධකයන් සංවර්ධන ඉලක්කයන් සපුරා ගැනීමේ දී උපයෝගීකර ගැනීම වැදගත් වේ.

විපර්යකාරක වැඩසටහනෙහි වර්තමාන තත්ත්වය විමසීමේ දී එහි ප්‍රායෝගික භාවිතය පිළිබඳව යම් ගැටලු සහගත ස්වභාවයක් පවතිනබව පැහැදිලි වේ. එයට හේතුව වන්නේ මානව සමාජය තුළ පරිණාමයත් සමඟ සිදුවී ඇති වෙනස්කම්ය. මිනිසා තාක්ෂණික මිනිසෙකු බවට පරිවර්තනයවී ඇති අතර අතීතයේ සිටි ස්වභාවික මානවයා කෘත්‍රිම මිනිසෙකු බවට පත්වී ඇත. සමාජ සංස්ථා බිඳ වැටී ඇති අතර එහි කෘත්‍යයන් ද කණ්ඩනයවී ගොස්ය. මිනිසා හුදෙකලා සත්ත්වයෙකු බවට පත්වී ඇති අතර මානව සබඳතා දුරස්ථ ය. සමාජයේ කුඩාම ඒකකයවන පවුල තුළ ද එදා පැවති එකමුතුකම අද බිඳවැටී ගොස්ය. අවිශ්වාසය, අයුක්ති, අසාධාරණත්වය සමාජයේ මුල් බිජුවට බවට පත්ව ඇත. සමාජයේ තීරණාත්මක සාධක බවට ධනය හා බලය පත්වී ඇත. ආගමික, දේශපාලන, අධ්‍යාපන ආදී සෑම සමාජ සංස්ථාවකම මෙකී ලක්ෂණයන් විද්‍යමාන වේ. උක්ත සමාජ විපරිණාමය නොයෙකුත් අර්බුදයන් ගේ නිර්මාපකයාවී හමාරය. එබැවින් විපර්යකාරක වැඩසටහනෙහි සැබෑ අවශ්‍යතාවය අවැසි වන්නේ වර්තමානයටය. එය නිර්මාණශිලිව හා කාලෝචිතව වත්මන් සමාජයට ගලපාගැනිමට හැකිනම් ගරාවැටෙමින් තිබෙන සමාජ ස්ථම්භයන් පිළිසකර කර ගැනීමට අවකාශය උදාවෙනු ඇත.

නව මාධ්‍ය සමාජ ගාමක බලවේගය බවට පත්ව ඇති මෙවන් යුගයක සාමුහිකත්වය ගොඩනැගීම, ජීවන තත්ත්වයේ ගුණාත්මක භාවය ඉහළ නැංවීම, ස්වකීය ශක්තින් හා දුර්වලතාවයන් හඳුනා ගැනීම, තමාට ඇති අවස්ථාවන් හා තර්ජන හඳුනාගෙන සංවර්ධන ක්‍රියාවලියේ දී එහි භාවිතාවේ අගය වටහාදිම, විධිමත් මූල්‍යකරණයේ අවශ්‍යතාවය අවබෝධකර දිම ආදි බොහෝ දෑ නව මාධ්‍ය යොදාගනිමින් සාධනීය ලෙස සමාජ ගතකළ හැක. ඒ තුළින් දිළිඳුකම පිටුදැකීම, පෘථිවිය ආරක්ෂා කිරීම හා සැමට සෞභාග්‍ය උදා කිරීම යන මුලික ව්‍යූහයන් යටතේ ගොනු කරන ලද තිරසර සංවර්ධන අභිමතාර්ථයන් මුදුන්පමුණුවා ගැනීමේ දී ඉහතින් සඳහන් කරන ලද විපර්යකාරක වැඩසටහන තුළින් අවධාරණය කරනු ලැබූ කරුණු වර්තමානයට උචිත අයුරින් නවීකරණයකොට භාවිතයට ගත හැකිනම් ඉතා අගනේය.



ද්විතීයික මූලාශ්‍ර ද ඇසුරුකර ගනිමින් ලියන ලද ලිපියකි.................

ඒ.එන්.විතානගේ
සංවර්ධන නිලධාරී,
ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය.

# 05. විපර්යකාරක වැඩසටහන තුළින් ගොඩනැගුණු ආසිරි මානව සංවර්ධන සංවිධානයේ ආරම්භය, විකාශය සහ වර්තමාන තත්වය

**අයි. එන්. වසන්තා ලාලනී වීරසිංහ**

**සංවිධාන ආරම්භය, විකාශය සහ වර්තමාන තත්වය**

1978 වසරේ ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය දිළිඳුකම අවම කර ගැනීම සඳහා සිදු කළ කාර්යබද්ධ පර්යේෂණ වැඩසටහන වන විපර්යකාරක වැඩසටහනට ලංකාවේ දිස්ත්‍රික්ක කිහිපයක ක්‍රියාත්මක වූ අතර එහිදී කුරුණෑගල දිස්ත්‍රික්කයට ද එම අවස්ථාව ලබා ගැනීමට හැකි විය.

ග්‍රාම නිලධාරීන් හා ග්‍රාමසංවර්ධන නිලධාරීන් ඉලක්ක කර ගනිමින් අධියරගත පුහුණු වැඩසටහන්වලට ඔවුන් සහභාගී කර ගනිමින් (සහභාගිත්ව සංවර්ධන ක්‍රමවේදය) ගම්මාන සමීක්ෂණ හා විමර්ශන ක්‍රියාවලියකට ලක් කරන ලදී. එහිදී හඳුනාගත් ගැටළු ඔස්සේ යම් යම් නිෂ්පාදන කණ්ඩායම් ගොනු වූ අතර ඒ වනවිට බලවත්තල ගම කේන්ද්‍ර කර ගනිමින් කුඩා කණ්ඩායම් කීපයක් ගොනු වූ අතර ඒ සඳහා මැදිහත්කරු ලෙස රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම නිලධාරීවරයකු වශයෙන් සේවය කළ සහ පසුවට ඉබ්බාගමුව අධ්‍යාපන කලාපයේ නාමල් අංග මහා විද්‍යාලේ උපාධිධාරී ගුරුවරයකු ලෙස සේවය කල ඒ.පී. තිස්ස කරුණාරත්න මැතිතුමා විසින් දිළිඳුකම සඳහා මිනිසුන් මුහුණ දුන් ගැටළු, ප්‍රශ්න විමර්ශනාත්මකව බලා අරමුදල් ගොඩනැගීම සඳහා අපතේ යන සම්පත් උපයෝගිකරමින් ක්‍රියාවලියන් කීපයක් ආරම්භ කරන ලදී.

එම ක්‍රියාවලියන් ලෙස

- සති සාකච්ඡා
- මාසික සාකච්ඡා
- සාමාජික මුදල් එකතු කිරීම
- පාරිභෝගික ක්‍රියාවලිය
- අඩු පොලියට ක්ෂණික ණය මුදල් ලබා දීම
- ශ්‍රම හුවමාරුව හැඳින්විය හැක.

ඉහත සඳහන් ක්‍රියාකාරකම් තුලින් ඔවුන් මුහුණ දුන් ප්‍රශ්න හා ගැටළුවලට සුළු වශයෙන් සහනයන් ගෙන දුන් අතර අවාසිදායක තත්වයන් මග හරවා ගැනීමටද යම්තාක් දුරට හැකිවිය. තම නිවසට වී හුදෙකලාව කාලය ගත කල අය සාමුහිකව කොන්ත්‍රාත් පදනමට ඉඩම් එළි පෙහෙළි කිරීම, ගොයම් පැල සිටවීම, අස්වැන්න නෙලීම ආදී කටයුතුවල නිරත විය. එහිදී ඔවුන් උපයන ලද සුළු වැටුපෙන් කණ්ඩායම් අරමුදල් වැඩිකර ගැනීම සඳහා යම් දායකත්වයක් ලබා දෙන ලදී. මෙසේ අරමුදල් එකතු කල කණ්ඩායම් 03ක සාමාජික පිරිස 30ක් වූ අතර එක කණ්ඩායමක් රුපියල් 28,000 ඉක්මවා අරමුදල් ගොඩනගන ලද. මේ වනවිට වැඩසටහනේ ව්‍යාප්තිය පිළිබඳ ගරු ඒ.පී. තිස්ස කරුණාරත්න පුහුණු උපදේශක තුමන් අවදානය යොමු කර තිබුණු හෙයින්

| | |
|---|---|
| *බලවත්තල* | *දොඩම්ගහකොටුව* |
| *පරගස්වැව* | *වලිපත්තල* |
| *පේරගහ ඇල* | *සියබලාවැහැර* |
| *රත්විට* | *කොස්වත්ත* |
| *ගොපල්ලව* | *උඩ හොරොම්බුව* |
| *ගල්සේරුගොල්ල* | *බටගොල්ල* |
| *ලිහිනිවැහැර* | |

ආදී වශයෙන් ගම් වළලු වෙතින් වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ආරාධනා ලැබූ නිසා තෝරාගත් ස්වේච්ඡා සේවක පිරිසක් අදියරගත පුහුණුවට සම්බන්ධ කර එම ගම්මානවලට යොමුකළ අතර මාස කීපයකින් ඒ සඳහා අවශ්‍ය මැදිහත් වීම් සිදු කර ඇත. මේ නිසා වැඩසටහනේ ව්‍යාප්තිය වර්ධනය කර ගැනීමට හැකි වූ අතර මේ කාලය වන විට ස්වෙච්ඡා සේවක පිරිස 8 ක් පමණ වූ අතර රුපියල් ලක්ෂ 28ක පමණ අරමුදල් ගොඩනගාගෙන ඉහත ක්‍රියාකාරකම් වල නිරත වෙමින් ඒ ඒ ගම්මාන වලට ඇති වූ පොදු ගැටළුවලට විසඳුම් සෙවීය.

- ඉඩම් උකසින් /බදු වලින් බේරා ගැනීම.
- 20%, 30% වැනි අධි පොළී ප්‍රතිශතවලට ගත් ණය මුදල් පියවා ගැනීම.
- සුළු වශයෙන් හෝ නිවසක් ඉදිකර ගැනීම
- පොල් වගාව ප්‍රතිපෝෂණය කිරීම
- වී වගාව සඳහා තාක්ෂණය ගැලපීම හා බිත්තර වී වගා ආදර්ශ ඇති කිරීම

ආදී ක්‍රියාකාරකම් රැසක් ක්‍රියාත්මක කරන ලදී.

1995 වසරේදී බොරැල්ල ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය විසින් ස්වයං පැවැත්මන් සඳහා දුන් ආදර්ශයන් අපද අභියෝගයට ලක් කරමින් 1995 වසරේදී ආසිරි මානව සංවර්ධන සංවිධානය නමින් ව/රිදී/95/7 සමාජ සුභසාධන වැඩසටහනට සමාජ සේවා දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිය ලබා ගන්නා ලදී. ප්‍රජාමුල සංවිධානයක් ලෙස සංවිධාන ගත වූ පසු ඒ සඳහා අවශ්‍ය ගිණුම් පුහුණු හා ප්‍රජාමූල සංවිධාන ධාරිතාවය වැඩි දියුණු කර ගැනීම සඳහා අවශ්‍ය පුහුණු බොරැල්ල ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය විසින් ලබා දුනි. ආසිරි මානව සංවර්ධන සංවිධානය පළමු සංවත්සරයේදී එක් කුඩා කණ්ඩායමකින් රුපියල් 2500.00 බැගින් කණ්ඩායම් 27කින් කොටස් මුදල් ලබාගෙන ඒකරාශි කරන ලද රුපියල් 67500.00 ක මුදලින් සාමාජිකයින් 17 දෙනෙකු සඳහා ජලමුද්‍රිත වැසිකිලි සාදා ගැනීම සඳහා අනුග්‍රහය ලබා දෙන ලදී. මේ සඳහා අනුග්‍රහය ලෙස

- වැසිකිලි පෝච්චි 1
- කම්බි බාර් 2
- සිමෙන්ති කොට්ට 2
- අවශ්‍ය ප්‍රමාණයට බට සහ මුල්‍ය දායකත්වය වශයෙන් රුපියල් 500ක් ලබා දෙන ලදී.

මෙය අසිරි මානව සංවර්ධන සංවිධානයේ ක්ෂුද්‍ර ණය නිකුත් කිරීමේ ආරම්භය බව සතුටින් ප්‍රකාශ කල හැක. මෙයින් පටන් ගත් ක්ෂුද්‍ර ණය ක්‍රියාවලිය වසරින් වසර ශක්තිමත් වෙමින් ඉදිරියට ශක්‍රියව ක්‍රියාත්මක වූ අතර ග්‍රාමීය සංවිධාන 32 ක් සාමාජික සංඛ්‍යාව 1500 දක්වා වර්ධනය විය.

**ක්ෂුද්‍ර ණය ක්‍රියාවලිය මගින් ක්‍රියාත්මක කර ඇති ව්‍යාපෘති.**

| නිවාස ණය ව්‍යාපෘතිය | උකස් ණය ණය ව්‍යාපෘතිය |
|---|---|
| **වැසිකිලි ණය ව්‍යාපෘතිය** | කෘෂිකාර්මික ණය ණය ව්‍යාපෘතිය |
| **විදුලි ණය ව්‍යාපෘතිය** | විදේශගත /වන්දනා ණය ව්‍යාපෘතිය |
| **ඉඩම් ණය ව්‍යාපෘතිය** | වෛද්‍ය ප්‍රතිකාර ණය ව්‍යාපෘතිය |
| **අධ්‍යාපනික ණය ව්‍යාපෘතිය** | වාහන මිලට ගැනීමේ ණය ව්‍යාපෘතිය |
| **රන් ණය ණය ව්‍යාපෘතිය** | |

2010 වර්ෂය වන විට ආසිරි මානව සංවර්ධන සංවිධානය ඉඩමක් මිලදීගෙන දෙමහල් ගොඩනැගිල්ලක් තම කාර්යාලය වශයෙන් ගොඩනගා ගන්නා ලදී. ඒ සඳහා සම්පූර්ණ දායකත්වය ක්ෂුද්‍ර ණය ක්‍රියාවලිය මගින් ලැබුණි. ඒ වගේම 2015 වර්ෂය වන විට මේ සංවිධානය මේ දක්වා ශක්තිමත්ව ගෙන ඒමට තම කාලය ශ්‍රමය හා බුද්ධිය මෙහෙය වූ ගරු පුහුණු උපදේශක තිස්ස කරුණාරත්න ශූරින් ජීවිතයෙන් සමු ගැනීම සංවිධානයට විශාල පාඩුවකි.

2016 වර්ෂය වන විට සංවිධානය සඳහා ප්‍රජාශක්ති එක්සත් මහා සංගමයේ පූර්ණ මැදිහත් වීම තුල ක්ෂුද්‍ර ණය ක්‍රියාවලිය කරගෙන යාම සඳහා රාජ්‍ය නොවන සංවිධාන පිළිබද ජාතික ලේකම් කර්යාලයේ අනුමත බලපත්‍රය ලබා ගැනීමට අවශ්‍ය ලිපි ලේඛණ සකස් කර MFD 029 යටතේ ලියාපදිංචි බලපත්‍රය ලබා ගැනීමට හැකි විය. මෙතෙක් ආසිරි මානව සංවර්ධන සංවිධානය පාලනය වූ ලේකම්, සභාපති, භාණ්ඩාගාරික ඇතුළු පාලක මණ්ඩලය අධ්‍යක්ෂක බවට පත් කර කටයුතු කරගෙන යන අතරම 1995-2023 වර්ෂය දක්වා සංවත්සර උත්සව පවත්වමින් සාමාජිකයින් අගයමින්, ඉදිරියට පවත්වාගන යනු ලබයි.

මෙම මූලික ක්‍රියාවලියන්ට අමතරව රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන හා සම්බන්ධ කටයුතු සිදුකරමින් සාමාජික හා සාමාජික නොවන ප්‍රජාවට වරප්‍රසාද හා දැනුවත් කිරීම් ලබා දෙමින් කුරුණෑගල දිස්ත්‍රික් රාජ්‍ය නොවන සංවිධාන සංසදයෙහි ක්‍රියාකාරී සංවිධානයක් ලෙස කටයුතු කරගෙන යනු ලැබේ. මෙහි ප්‍රථිපලයක් ලෙස 2019 වර්ෂයේ පළමු වතාවට සංවර්ධන පහසුකම් සැලසීමේ ශ්‍රී ලංකා මධ්‍යස්ථානය විසින් යුරෝපා සංගමයේ මූල්‍ය ආධාර මත ක්‍රියාත්මක වූ ආන්තික කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා සිමාව තීරණය කිරීමට කාන්තාවන්ට ඉඩදෙමු ව්‍යාපෘතිය ලබා දුන් අතර 2023 වර්ෂය වනවිට රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ස්වාමියා හෝ සහකරු විසින් අතහැර ගිය කාන්තාවන් සහ අවුරුදු 40 ට වැඩි අවිවාහක කාන්තා පවුල් 35ක් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම සිදු කල අතර දැනුම කුසලතා ආකල්ප සංවර්ධන වැඩසටහන් රාශියක් සිදු කරන ලදී. එම ව්‍යාපෘතිය ඉතා සාර්ථකව අවසන් කිරීම මත 2024-2026 වර්ෂ සඳහා යුරෝපා සංගමය විසින් මූල්‍ය පහසුකම් සපයන තම ඉරණම තීරණය කිරීමට කාන්තාවන්ට ඉඩ දෙමු ව්‍යාපෘතිය රිදීගම සහ ඉබ්බාගමුව කොට්ඨාශ දෙකෙහිම ක්‍රියාත්මක කිරීමට ඉඩ හසර ලැබී ඇති බවද සතුටින් සිහිපත් කරමු.

මේ වන විට රිදීගම සහ ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ දෙක තුල සංවිධානය පහත පරිදි විහිදී ඇත.

**කුඩා කණ්ඩායම් -205**

**සාමජික පිරිස - 1284**

**ආසිරිමානව සංවිධානයේ වර්තමාන ව්‍යාප්තිය**

| **අ.අ.** | **රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ව්‍යාප්ත ග්‍රාමනිලධාරි වසම්** | **අ.අ** | **ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ව්‍යාප්ත ග්‍රාමනිලධාරි වසම්** |
|---|---|---|---|
| **01** | බලවත්තල | 01 | සියඹලාවැහැර |
| **02** | පරගස්වැව | 02 | දමුණුගොල්ල |
| **03** | ලිහිනිවැහැර | 03 | දඹරගොමුව |
| **04** | ගොරකදොල | 04 | වැලිපත්තල |
| **05** | කොතලවලගම | 05 | ලේනව |
| **06** | ලිහිණි ජනපදය | 06 | කිරිදිගල්ල |
| **07** | දොඩම්ගහකොටුව | 07 | උස්සාව |
| **08** | ගොපල්ලව | 08 | දිග්ගලවත්ත |
| **09** | පේරගහ ඇල | 09 | බන්ඩිපොළ |
| **07** | දොඩම්ගහකොටුව | 07 | උස්සාව |
| **08** | ගොපල්ලව | 08 | දිග්ගලවත්ත |
| **09** | පේරගහ ඇල | 09 | බන්ඩිපොළ |
| **10** | උඩ කැන්දවල | 10 | නිරම්මුල්ල |
| **11** | කොරොස්ස | 11 | කුරුදු අල්ලිය |
| **12** | උස්වත්ත | 12 | මහගම |
| **13** | උඩත්තාපොළ | 13 | පිටපහමුණ |
| **14** | වැව තැන්න | 14 | මුකලන්යාය |
| **15** | නාගොල්ල | | |

2024 වර්ෂය වන විට ආසිරි මානව සංවර්ධන සංවිධානයේ අධ්‍යක්ෂක මණ්ඩලය

I.N. වසන්තා ලාලනී වීරසිංහ - කළමණාකාර අධ්‍යක්ෂක

I.N. යමුනා සමන්තිලකා - අධ්‍යක්ෂක (ලේකම්)

M. මල්ලිකා - අධ්‍යක්ෂක (මුල්‍ය අධ්‍යක්ෂක)

D.M. ශිරෝමලා අයිරාංගනී

G.C. ජයන්තා කුමාරි

B.M. බාලසූරිය

E.D. අනෝමා ප්‍රියශාන්ති

N.G. ධම්මි ප්‍රියදර්ශනී

A.M. ප්‍රියංගනී මානෙල්

B.W.D. තනුජා පතිරණ

S.A. ගීතා රූපසිංහ

2024 වර්ෂය වන විට සංවිධානය සතු මූල්‍ය වත්කම්

| | |
|---|---|
| ක්ෂුද්‍ර ණය ව්‍යාපෘතිය සඳහා | **11,328,642.00** |
| කණ්ඩායම් සුභසාධන ව්‍යාපෘති | 39,792,013.00 |
| ග්‍රාමීය සංවිධාන සුභසාධන ව්‍යාපෘති | 6,206,268.00 |
| පොදු සුභසාධන ව්‍යාපෘති | 4,591,503.00 |
| උපදේශන ආරක්ෂිත ඇප තැම්පත් | 1,109,507.00 |
| සාමාජික සුභසාධන ව්‍යාපෘති | 48,421,863.00 |
| සවිය ව්‍යාපෘති | 7,096,941.00 |
| උපදේශන සභාවේ සුභසාධනය | 2,610,776.00 |
| සමුච්චිත අරමුදල | 11,061,166.00 |
| එකතුව | **132,218,679.00** |

අයි.එන්. වසන්තා ලාලනී වීරසිංහ

කළමණාකාර අධ්‍යක්ෂ,

ආසිරි මානව සංවර්ධන සංවිධානය.

# 06. හික්කඩුව ප්‍රජාශක්ති සහභාගිත්ව සංවර්ධන පදනම

ටී. එච්ලින්ද සිල්වා

බුස්සේදී සිය මංගල රැස්වීම පවත්වා 1987 සිට ක්‍රියාත්මක වන හික්කඩුව ප්‍රජාශක්ති සංවර්ධන පදනම විපර්යකාරක වැඩසටහන මගින් ගොඩනැගුණු සංවිධානයකි. ස්වශක්තිය හා සහභාගිත්වය තුළින් දිළිඳු බවින් එතෙර වීමට ගත් උත්සාහයේ මහඟු ප්‍රතිඵල භුක්ති විඳින සංවිධානයක් වශයෙන් හික්කඩුව සහභාගිත්ව සංවර්ධන පදනම පැමිණි ගමන් මඟ පිළිබඳ මෙම කතාන්දරය දිග හැරෙනුයේ මහත් අභිමානයෙනි.

ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය ගාල්ල දිස්ත්‍රික්කයේ හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ 1987 වර්ෂයේ අත්හදා බැලීමේ පදනම මත ක්‍රියාත්මක කළ කාර්යබද්ධ පර්යේෂණ ක්‍රියාවලියට පදනම්ව බිහි වූ සංවිධානය හික්කඩුව සහභාගිත්ව සංවර්ධන පදනම නම් වේ. ප්‍රාදේශීය කොට්ඨාස බල ප්‍රදේශය තුළ ආන්තික භාවයට පත් අඩු ආදායම්ලාභී දිළිඳු ප්‍රජාව දැනුවත් කරමින්, සංවිධාන ගත කරමින්, ඔවුන් බලගන්වමින් ගොඩනැගූ සංවිධානයක් ලෙස හික්කඩුව සහභාගිත්ව සංවර්ධන පදනම හැඳින්විය හැකිය.

**සංවිධානයෙ දැක්ම**

සංවිධානගත බලප්‍රදේශය තුළ වෙසෙන අඩු ආදායම්ලාභී ජන කොටස් බලමුළු ගැන්වූ පිරිපුන් ජනතාවක් බවට පත් කරලීම.

**මෙහෙවර**

සංවිධානයේ අඩු ආදායම්ලාභීන්ගේ ස්වශක්තිය හා සහභාගිත්වය තුළින් ඔවුන්ගේ සංවර්ධනය සඳහා නව සංවර්ධන ක්‍රියාවලියක් ජනිත කරවීම.

**දැනට ක්‍රියාත්මක වැඩසටහන්................**

- ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන්.
- සුභසාධන වැඩසටහන්
- පාරිභෝගික වැඩසටහන්
- අධ්‍යාත්මික වැඩසටහන්
- පාරසරික වැඩසටහන්
- ණය වැඩසටහන්

**දැනුවත් කිරීමේ වැඩසටහන :-**

සංවිධානයේ නිලධාරීන් දැනුවත් කොට ඔවුන් මගින් ප්‍රජාව දැනුවත් කිරීම හා විවිධ පුහුණුවීම්වලට යොමු කිරීම.

**සුභසාධන වැඩසටහන් :-**

අන්‍යෝන්‍ය සම්බන්ධතා මෙමගින් වර්ධනය වන අතර ශ්‍රම හුවමාරු වැඩසටහන් සඳහා පුමුඛතාවය ලබා දෙයි. මෙහිදී මංගල / අවමංගල කාර්යයන්හිදී කණ්ඩායම් සහභාගිත්වය ඇති කිරීම, පොදු ස්ථානවල ශ්‍රමදාන කටයුතු සිදු කිරීම ආදිය සිදු කරණු ලබයි.

**අධ්‍යාත්මික වැඩසටහන්:-**





මෙහිදී බොහෝවිට වාර්ෂිකව සාංඝික දානමය පින්කමක් සිදු කරයි. ආයතනයේ කාර්යාලය තුළ පිරිත් කියවා මහා සංඝරත්නයට දානයක් ලබා දීම, වැඩසටහනට සම්බන්ධ මියගිය විද්වතුන් හා සාමාජික සාමාජිකාවන් සිහිකිරීම, ලේ දන්දීම සිදු කරනු ලබයි.

**පාරිසරික වැඩසටහන්:-**

පාරසරික වැඩසටහන් සිදු කිරීමේදී ගිං ගඟ පාරිසරික කළමනාකරණ වැඩසටහනට වැඩි මැදිහත්වීමක් සිදු කරයි. මෙම ව්‍යාපෘතිය සංවර්ධන පහසුකම් සැලසීමේ ශ්‍රී ලංකා මධ්‍යස්ථානයේ සහායෙන් ක්‍රියාත්මක කෙරුණි. ඉන් ප්‍රජාව දැනුවත් වූවා පමණක් නොව ප්‍රජාවට විශාල සේවයක් සිදුවුණි. ඉවතලන ද්‍රව්‍ය කළමනාකරණය කිරීම, ඒවා මුදල් බවට පත් කිරීම, මුදල් සොයා ගැනීම, කුණු ප්‍රතිචක්‍රීයකරණය කර නැවත භාවිතය හා කෝම්පොස්ට් සෑදීම, එම පොහොර මගින් ගෙවතු වගා කිරීම, පොලිතින් හා ප්ලාස්ටික් මගින් සමුද්‍රය අපවිත්‍ර වීම අවම කිරීම වැනි කාර්යයන් ක්‍රියාත්මක කෙරේ. මෙම වැඩසටහනේ විශේෂත්වයක් වන්නේ ගම්මාන වල නායිකාවන් තෝරා ඔවුන් පුහුණු කර එම නායකාවන් මගින් ගම්මානවල ප්‍රජාව දැනුවත් කිරීම, අපවිත්‍ර ද්‍රව්‍ය එකතු කොට ඒවා වර්ග කොට ප්‍රාදේශීය සභාවලට යොමු කිරීම සිදු වේ. මෙම වැඩසටහනින් පසු ගිං ගඟ මෝය කට කුණු පිරීමෙන් වැළකිණි. ඒ සඳහා මාධ්‍යයෙන්ද අනුග්‍රහයක් ලැබුණි.

**ආයතනයේ චක්‍රීය ණය වැඩසටහන :-**

ආයතනයෙන් ක්‍රියාත්මක කරන ප්‍රධාන වැඩසටහනකි චක්‍රීය ණය ක්‍රියාවලිය. ඉතිරි කිරීම පදනම් කරගත් සාමූහික අරමුදල







ප්‍රයෝජනයට ගනිමින් කුඩා කණ්ඩායම් ක්‍රියාවලියක් ලෙස ආරම්භ වන ණය වැඩසටහන ප්‍රධාන වශයෙන් නිෂ්පාදනයට අදාළ ගැටළුවලට විසඳුම් වශයෙන් හඳුනාගත් ක්‍රියාකාරකම් ආරම්භ කිරීමට ක්‍රියාත්මක කරන ලදී. ක්‍රමයෙන් සංවිධාන ව්‍යුහය පුළුල්වෙත්ම වැඩිවන සාමාජික සාමාජිකාවන්ගේ අවශ්‍යතා සපුරාලීමට වස් වක්‍රීය ණය වැඩසටහන පුළුල් ලෙස ග්‍රාමීය සංවිධාන හරහා ප්‍රාදේශීය සංවිධානයක් ලෙසින් ක්‍රියාත්මක වේ. සාමාජික සාමාජිකාවන්ගෙන් නිෂ්පාදන දියුණු කිරීම තුළින් පවත්නා ආදායම් මාර්ග සංවර්ධනය කිරීම හා නව ආදායම් උත්පාදනය සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම් සැලසීම තුළින් ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීමේ අරමුණින් ණය වැඩසටහන ක්‍රියාත්මක කරයි.

**සංවිධානය විසින් ලබා දෙන ණය වර්ග**

**1. ආදායම් උත්පාදන ණය**

- ස්වයං රැකියා ණය
- වෙළෙඳාම සඳහා
- කර්මාන්ත (සුළු හා මධ්‍ය පරිමාණ, ගෘහස්ථ කර්මාන්ත) සඳහා

**2. නිවාස ණය**

- නව නිවාස
- නිවාස වැඩිදියුණු කිරීම
- නිවාස අලුත් වැඩියා කිරීම
- විදුලිය හා ජල පහසුකම් ලබාදීම

**3. අධ්‍යාපනය**

4. සෞඛ්‍ය හා සනීපාරක්ෂණ ණය
5. ණයෙන් නිදහස් වීම හා උකස් බේරා ගැනීම
6. වත්කම් හිමිකර ගැනීම
7. උත්සව ණය
8. ක්ෂණික ණය

**සහභාගිත්ව සංවර්ධන පදනමේ ණය ක්‍රියාවලිය ව්‍යවස්ථාව හා ණය කොන්දේසි මාලාවේ නියමයන්ට අනුව ක්‍රියාත්මක වේ. ඒ අනුව සපුරාලිය යුතු කොන්දේසි වන්නේ**

- සහභාගිත්ව සංවර්ධන පදනමේ සාමාජිකයකු වීම. (සාමාජිකත්වය ලබා දෙමසක් කල් පිරීම හා සාර්ථක ගණුදෙනු කරුවෙකු බවට පත්වීම)
- සාමාජිකයාට සාමාන්‍ය ඉතුරුම්, අඛණ්ඩ තැන්පත් ඉතුරුම් ගිණුමක් තිබීම හා ඒවා මසකට වරක්වත් ගනුදෙනු සිදුවීම.
- මුල් කාලයේදී සාමාජිකයාට රු.500, රු.1000, රු.1500 වශයෙන් ණය නිකුත් කරන අතර ණය මුදලින් 1/5 ක් ඉතුරුම් තැන්පත් ශේෂ තිබිය යුතුය. මෙම ණය හිඟ නොමැතිව ගෙවා විශ්වාසය තහවුරු කරගත යුතුය.

- කුඩා කණ්ඩායමේ මෙන්ම අදාළ ග්‍රාමීය සංවිධානයේ ක්‍රියාකාරි සාමාජිකයකු වීම.
  - o යන කරුණු සපුරා තිබිය යුතුය.

**ණය ලබා දීමේදී අනුගමනය කරන වැඩපිළිවෙළ පහත ආකාර වේ.**

- කිසියම් සාමාජිකයෙක් මෙන්ම මැදිහත්කරු විසින් ණය ඉල්ලුම් කරන පුද්ගලයාගේ පාස් පොත් මෙන්ම ලිපියක් ඉදිරිපත් කර නියම කරගත් මුදල ගෙවා ණය ඉල්ලුම්පත් ලබා ගත යුතුය.
- එම ඉල්ලුම්පත්‍රය පුද්ගලිකව ද පුරවා අදාළ ග්‍රාමීය සංවිධානයේ සාමාජිකාවන් හා නිලධාරීන්ගේ අනුමැතියට යටත්ව මැදිහත්කරුගේ නිර්දේශයට යටත්ව ආයතනයට ලබාදිය යුතුය.
- මෙම ණය ඉල්ලුම්පත් පුද්ගලිකවද අදාළ මැදිහත්කරුවා විසින්ද වෙනත් පුද්ගලයෙකු මාර්ගයෙන්ද ආයතනයට ගෙනත් දිය හැකිය.
- පළමුවෙන්ම සාමාජිකයා අයත් ග්‍රාමීය සංවිධානය මගින් ඉල්ලුම්පත ලබාදීම සිදුවිය යුතු අතර මැදිහත්කරු පරීක්ෂා කර නිර්දේශ කිරීමෙන් අනතුරුව කාරක සභාවට ඉදිරිපත් කිරීම කළ යුතුය.
- කාරක සභාවේදී අදාල ණය කොන්දේසි සම්පූර්ණ කර ඇත්නම් කළමනාකරුවන්ගේ හා මැදිහත්කරුගේ තොරතුරු ද සැලකිල්ලට ගනිමින් ප්‍රධාන නිලධාරී තිදෙනා අත්සන් තබමින් අනුමත කිරීම.
- අනුමත කරන ලද ණය ඉල්ලුම්පත් කුඩා ණය සඳහා (රු.15000.00 දක්වා) කණ්ඩායම් ඇප දෙකක්ද, ලොකු ණය සඳහා කණ්ඩායම් ඇප දෙකකට අමතරව පවුලේ සාමාජිකයකුගේ ඇපයක්ද යොදා ගනිමින් ප්‍රධාන කාර්යාලයේදී මෙන්ම ග්‍රාමීය සංවිධානයේදී ණය ලබාදීම සිදුකරයි.
- සංවිධානය විසින් ප්‍රධානය කරන සියලුම ණය සඳහා 20% ක තැන්පතු ශේෂ තිබීම අනිවාර්ය වන අතර පොදු ගිණුම්වල (ග්‍රාමීය සංවිධාන හා කණ්ඩායම්) මුදල්ද ඇප වශයෙන් තබා ගත හැකිය. ණය මුදල සඳහා ඇප අත්සන් කරන දෙදෙනාගේ ගිණුම් ඇපයට තබා ගැනීමද සිදුකරයි.
- සාමාජිකයා විසින් ගන්නා ලද සෑම ණයක් සඳහාම හීන වන ශේෂයට පොලී ගණනය කරනු ලැබේ. මේ තුළින් අඩු ආදායම්ලාභී සාමාජිකයා ආරක්ෂා වේ.
- සාමාජිකයාට ණය ලබාදීමෙන් පසු පසු විපරම සිදුකිරීම කරනු ලබන්නේ මැදිහත්කරුවා විසින්ය. මැදිහත් කරුගේ වැඩි සම්බන්ධතාවයෙන් මෙන්ම නිතර ගමට සම්බන්ධ වීම මෙයට පිටුවහලකි. තවද සමහර අවස්ථාවලදී ආයතනයේ නිලධාරීන් විසින් ද පසු විපරම කරයි.
- ආයතනයට පැමිණ සාමාජිකයා වාරික ලබා දෙනවා මෙන්ම ග්‍රාමීය සංවිධානවල නියෝජිතයින් විසින්ද අදාළ ග්‍රාමීය සංවිධානයේ වාරික සියල්ල එකතු කරගෙන ආයතනයට භාරදීම සිදුවේ. ණය අරමුදලේ නිලධාරීන් (කළමනාකරණයන්) ග්‍රාමීය සංවිධානවලට ගොස් ණය අය කරගෙන ඒමද සිදු කරයි.
- සාමාජිකයින්ගේ ගෙවතු වගා, කැටකාසි, ස්වයං රැකියා ආදී කුඩා ව්‍යාපාර මඟින්, සල්පිල් මගින් එකතු කරගන්නා භාණ්ඩ හා මුදල් කණ්ඩායමේ හෝ ග්‍රාමීය සංවිධානයේදී මුදල් බවට පත් කිරීමෙන් සාමාජිකයාගේ ඉතුරුම් තැන්පත් වශයෙන් ආයතනයට ලබාදෙයි.
- ආයතනයේ සියලුම ලැබීම් සඳහා බිලක් නිකුත් කරන අතර සියළුම ගෙවීම් සඳහා වවුචරයක් මගින් ගෙවීම් කරයි. බිල්පත මුදල් පොතට ද, ණය ලෙජරයට හා ඉතුරුම් ලෙජරයටද, මුදල් සාරාංශයටද ඉන් පසු පොදු ලෙජරයටද, වර්ෂය අවසානයේ අවසාන ගිණුම්වලටද යොදා ගිණුම්කරණ ක්‍රියාවලිය සිදුකරයි.

- වාර්ෂික විගණනය සඳහා සියළුම ගනුදෙනු ඇතුළත් පොත් හා ලේඛන සූදානම් කරගෙන අදාළ වර්ෂ අවසානයේ පිළිගත් විගණන ආයතනයකට භාර දීම සිදු කරයි.
- සුභසාධන වැඩසටහන් සඳහාද අරමුදල් සාමාජිකයා මගින් එකතුකර ගන්නා අතර නියම කරගත් කොන්දේසි මාලාව අනුව සාමාජිකයාට වරප්‍රසාද ලබාදීමද මුදල වර්ධනය කර ගැනීම සඳහා ණය ප්‍රධානය කිරීමද සිදු කරයි.

එමෙන්ම වාර්ෂිකව පවත්වාගෙන යන ලේ දන්දීමේ සමාජ සත්කාර වැඩසටහන සඳහා මුදල් ග්‍රාමීය සංවිධාන නියෝජිතයන්, සංවිධානයේ සියලුම මැදිහත්කරුවන් හා නිලධාරීන්ගේ ප්‍රධානයන් හා සංවිධානයෙන් ගෙවා එම කාර්ය ඉටු කරනු ලබයි.

ගංවතුර/ සුනාමි වැනි ආපදා අවස්ථාවන්වලදී කරන සමාජ සත්කාරක වැඩසටහන් සඳහාද ණය ලබා දෙයි.

දින සැමරුම් වලදී සිදු කරන වැඩසටහන් එනම් වැඩිහිටි දිනය නිමිත්තෙන් වැඩිහිටි නිවාසය සඳහා දානය ලබාදීම, මච්චරුන්ගේ දිනය නිමිති කරගෙන බඩුමල්ලක් දීම ආදියටද ණය ලබාදීම ආදි සුභ සාධන වැඩසටහන් කිරීමටද සංවිධානය ණය සපයයි.

විශිෂ්ට සම්මාන ලබාගෙන අ.පො.ස. (සා.පෙ.), අ.පො.ස. (උ.පෙ.) විභාග සමත්වන සාමාජික දරුවන් සඳහ ශිෂ්‍යත්ව ලබාදීමද සිදු කරයි.

සිංහල හා දෙමළ අවුරුදු උත්සවය සඳහා සාමාජිකයින් සඳහා කරන අවුරුදු චාරිත්‍ර, පාරිභෝගික වැඩසටහන් සඳහා ගෙවීමේ ක්‍රමයට භාණ්ඩ ලබාදීම හා බඩුමළු ලබාදීම සිදු කරයි.

කිසියම් සාමාජිකයෙක් මෙන්ම මැදිහත්කරු විසින් ණය ඉල්ලුම් කරන පුද්ගලයාගේ පාස් පොත් මෙන්ම ලිපියක් ඉදිරිපත් කර නියම කරගත් මුදල ගෙවා ණය ඉල්ලුම්පත් ලබා ගත යුතුය.

එම ඉල්ලුම්පත්‍රය පුද්ගලිකව ද පුරවා අදාළ ග්‍රාමීය සංවිධානයේ සාමාජිකාවන් හා නිලධාරීන්ගේ අනුමැතියට යටත්ව මැදිහත්කරුගේ නිර්දේශයට යටත්ව ආයතනයට ලබාදිය යුතුය.

මෙම ණය ඉල්ලුම්පත් පුද්ගලිකවද අදාළ මැදිහත්කරුවා විසින්ද වෙනත් පුද්ගලයෙකු මාර්ගයෙන්ද ආයතනයට ගෙනත් දිය හැකිය.

පළමුවෙන්ම සාමාජිකයා අයත් ග්‍රාමීය සංවිධානය මගින් ඉල්ලුම්පත ලබාදීම සිදුවිය යුතු අතර මැදිහත්කරු පරීක්ෂා කර නිර්දේශ කිරීමෙන් අනතුරුව කාරක සභාවට ඉදිරිපත් කිරීම කළ යුතුය.

කාරක සභාවේදී අදාල ණය කොන්දේසි සම්පූර්ණ කර ඇත්නම් කළමනාකරුවන්ගේ හා මැදිහත්කරුගේ තොරතුරු ද සැලකිල්ලට ගනිමින් ප්‍රධාන නිලධාරී තිදෙනා අත්සන් තබමින් අනුමත කිරීම.

අනුමත කරන ලද ණය ඉල්ලුම්පත් කුඩා ණය සඳහා (රු.15000.00 දක්වා) කණ්ඩායම් ඇප දෙකක්ද, ලොකු ණය සඳහා කණ්ඩායම් ඇප දෙකකට අමතරව පවුලේ සාමාජිකයකුගේ ඇපයක්ද යොදා ගනිමින් ප්‍රධාන කාර්යාලයේදී මෙන්ම ග්‍රාමීය සංවිධානයේදී ණය ලබාදීම සිදුකරයි.

සංවිධානය විසින් ප්‍රධානය කරන සියලුම ණය සඳහා 20% ක තැන්පතු ශේෂ තිබීම අනිවාර්ය වන අතර පොදු ගිණුම්වල (ග්‍රාමීය සංවිධාන හා කණ්ඩායම්) මුදල්ද ඇප වශයෙන් තබා ගත හැකිය. ණය මුදල සඳහා ඇප අත්සන් කරන දෙදෙනාගේ ගිණුම් ඇපයට තබා ගැනීමද සිදුකරයි.

සාමාජිකයා විසින් ගන්නා ලද සෑම ණයක් සඳහාම හීන වන ශේෂයට පොලී ගණනය කරනු ලැබේ. මේ තුළින් අඩු ආදායම්ලාභී සාමාජිකයා ආරක්ෂා වේ.

සාමාජිකයාට ණය ලබාදීමෙන් පසු පසු විපරම සිදුකිරීම කරනු ලබන්නේ මැදිහත්කරුවා විසින්ය. මැදිහත් කරුගේ වැඩි සම්බන්ධතාවයෙන් මෙන්ම නිතර ගමට සම්බන්ධ වීම මෙයට පිටුවහලකි. තවද සමහර අවස්ථාවලදී ආයතනයේ නිලධාරීන් විසින් ද පසු විපරම කරයි.

ආයතනයට පැමිණ සාමාජිකයා වාරික ලබා දෙනවා මෙන්ම ග්‍රාමීය සංවිධානවල නියෝජිතයින් විසින්ද අදාළ ග්‍රාමීය සංවිධානයේ වාරික සියල්ල එකතු කරගෙන ආයතනයට භාරදීම සිදුවේ. ණය අරමුදලේ නිලධාරීන් (කළමනාකරණයන්) ග්‍රාමීය සංවිධානවලට ගොස් ණය අය කරගෙන ඒමද සිදු කරයි.

සාමාජිකයින්ගේ ගෙවතු වගා, කැටකාසි, ස්වයං රැකියා ආදී කුඩා ව්‍යාපාර මඟින්, සල්පිල් මගින් එකතු කරගන්නා භාණ්ඩ හා මුදල් කණ්ඩායමේ හෝ ග්‍රාමීය සංවිධානයේදී මුදල් බවට පත් කිරීමෙන් සාමාජිකයාගේ ඉතුරුම් තැන්පත් වශයෙන් ආයතනයට ලබාදෙයි.

ආයතනයේ සියලුම ලැබීම් සඳහා බිලක් නිකුත් කරන අතර සියළුම ගෙවීම් සඳහා වවුචරයක් මගින් ගෙවීම් කරයි. බිල්පත මුදල් පොතට ද, ණය ලෙජරයට හා ඉතුරුම් ලෙජරයටද, මුදල් සාරාංශයටද ඉන් පසු පොදු ලෙජරයටද, වර්ෂය අවසානයේ අවසාන ගිණුම්වලටද යොදා ගිණුම්කරණ ක්‍රියාවලිය සිදුකරයි.

වාර්ෂික විගණනය සඳහා සියළුම ගනුදෙනු ඇතුළත් පොත් හා ලේඛන සූදානම් කරගෙන අදාළ වර්ෂ අවසානයේ පිළිගත් විගණන ආයතනයකට භාර දීම සිදු කරයි.

සුභසාධන වැඩසටහන් සඳහාද අරමුදල් සාමාජිකයා මගින් එකතුකර ගන්නා අතර නියම කරගත් කොන්දේසි මාලාව අනුව සාමාජිකයාට වරප්‍රසාද ලබාදීමද මුදල වර්ධනය කර ගැනීම සඳහා ණය ප්‍රධානය කිරීමද සිදු කරයි.

එමෙන්ම වාර්ෂිකව පවත්වාගෙන යන ලේ දන්දීමේ සමාජ සත්කාර වැඩසටහන සඳහා මුදල් ග්‍රාමීය සංවිධාන නියෝජිතයන්, සංවිධානයේ සියලුම මැදිහත්කරුවන් හා නිලධාරීන්ගේ ප්‍රධානයන් හා සංවිධානයෙන් ගෙවා එම කාර්ය ඉටු කරනු ලබයි.

ගංවතුර/ සුනාමි වැනි ආපදා අවස්ථාවන්වලදී කරන සමාජ සත්කාරක වැඩසටහන් සඳහාද ණය ලබා දෙයි.

දින සැමරුම් වලදී සිදු කරන වැඩසටහන් එනම් වැඩිහිටි දිනය නිමිත්තෙන් වැඩිහිටි නිවාසය සඳහා දානය ලබාදීම, මව්වරුන්ගේ දිනය නිමිති කරගෙන බඩුමල්ලක් දීම ආදියටද ණය ලබාදීම ආදි සුභ සාධන වැඩසටහන් කිරීමටද සංවිධානය ණය සපයයි.

විශිෂ්ට සම්මාන ලබාගෙන අ.පො.ස. (සා.පෙ.), අ.පො.ස. (උ.පෙ.) විභාග සමත්වන සාමාජික දරුවන් සඳහා ශිෂ්‍යත්ව ලබාදීමද සිදු කරයි.

සිංහල හා දෙමළ අවුරුදු උත්සවය සඳහා සාමාජිකයින් සඳහා කරන අවුරුදු චාරිත්‍ර, පාරිභෝගික වැඩසටහන් සඳහා ගෙවීමේ ක්‍රමයට භාණ්ඩ ලබාදීම හා බඩුමළු ලබාදීම සිදු කරයි.

**සංවිධානයේ මූල්‍ය ශක්තිය**

| | | |
|---|---|---|
| තැන්පතු | | |
| | ඉතුරුම් තැන්පත් | 48,196,996.00 |
| | අනිවාර්ය තැන්පත් | 2,262,054.00 |
| | ළමා තැන්පත් | 184,127.00 |
| | විශ්‍රාමික තැන්පත් | 63,863.00 |
| | සමරු තිළිණ තැන්පත් | 77,275.00 |
| | කණ්ඩායම් තැන්පත් | 69,214.00 |
| **ලැබිය යුතු සාමාජික ණය** | | |
| | පාරිභෝගික ණය | 1,842,404.00 |
| | දිගුකාලීන ණය | 7,546,786.00 |
| | 2% සංවර්ධන ණය | 646,582.00 |
| | සුභ සාධන ණය | 2,464,110.00 |
| | ග්‍රාමීය සංවිධාන ණය (ක්ෂණික ණය) | 3,598,520.00 |
| **සංවිධානයේ මේ වනවිට මුළු වත්කම** | | **66,951,931.00** |

**සංවිධානයේ විකාශයේ මං සලකුණු**

1. ආරම්භය:- 1987දෙසැම්බර් 20
2. සංවිධානයේ නාමයේ යෙදීම:- 1991 සහභාගිත්ව සංවර්ධන පදනම-හික්කඩුව
3. ලියාපදිංචිය:- 1992.08.27
4. 1993 වසරේ ප්‍රජා ශක්ති ඉතිරි කිරීමේ බැංකුව ආරම්භ කිරීම.
5. 1993 වසරේ ප්‍රථම වතාවට රුපියල් 100,000 ආධාර මුදලක් ශ්‍රී ලංකා කැනඩා සංවර්ධන අරමුදලෙන් ලැබීම.
6. 1995 වසරේ ජාල වැඩසටහන්වලට සම්බන්ධ වීම.
7. 1995 වසරේ ගාල්ල දිස්ත්‍රික් ප්‍රජාශක්ති සංවර්ධන පදනමේ සාමාජික සංවිධාන සමඟ අලුත් අවුරුදු පොළක් පැවැත්වීම.
8. 1996 වසරේ මහා පරිමාණයෙන් අලුත් අවුරුදු පොළ පැවැත්වීම.
9. පළමුවරට පුහුණුකරු එච්.ජී. ඩයස් මහතා ග්‍රාමසංවර්ධන අභ්‍යාස පර්යේෂණ ආයතනයෙන් සම්බන්ධවීම.
10. ප්‍රථම රැස්වීම බූස්සෙදි පැවැත්වීම.
11. 1992 සිට මේ දක්වා සභාපතිවරුන් හතර දෙනෙක්, ලේකම්වරුන් තිදෙනෙක්, භාණ්ඩාගාරිකවරුන් තිදෙනෙක්ද, පුහුණුකරුවන් දෙදෙනෙකුද වගකීම් දැරීම.
12. මුල් අවස්ථාවේ කුඩා කණ්ඩායම් මගින් සාමාජිකයින්ට ආර්ථික වාසි සලසා දෙමින් පාරිභෝගික

වැඩසටහන්වල යෙදීම.

13. ස්ථාන පහක සංවිධාන කාර්යාල පවත්වා ඇත.

14. තරඟකාරී වෙළඳපොළට පිවිසීම- ගාල්ල හේලිස් ආයතනය.

15. 2000 වසරේ සංවිධානයට ගොඩනැගිල්ල සෑදීම සඳහා ඉඩමක් මිලදී ගැනීම.

16. 2002වසරේ සංවිධාන ගොඩනැගිල්ලට මුල්ගල් තැබීම.

17.2004 වසරේ සංවිධාන සාමාජිකයන්ට බලපාන ලෙස සුනාමිය පැමිණීම සාමාජිකාවන් ගත් ණය අහිමිවීම.18. 2005 වසරේ සංවිධානයේ දෙමහල් ගොඩනැගිල්ල විවෘත කිරීම

19. 2006 UNDP ආයතනයෙන් සංවිධානයේ පුස්තකාලයට අවශ්‍ය කබඩ් ලැබීම.

### සංවිධානයේ අනාගත අපේක්ෂාව

සංවිධානයේ ඇති අභියෝග ජය ගනිමින් කුඩා කණ්ඩායම්, ග්‍රාමීය සංවිධාන ශක්තිමත් කර ඒ තුළින් මධ්‍ය සංවිධාන ධාරිතාව වර්ධනය කර ගැනීමත්, සාමාජික ප්‍රජාව බලමුළු ගන්වා ශක්තිමත්ව පවත්වා ගනිමින් හික්කඩුව සහභාගිත්ව සංවර්ධන පදනමින් ගොඩනඟා ගත් දැක්ම මෙහෙවර හා අරමුණු සාක්ෂාත් කරගැනීම තුළ සංවිධානය තව තවත් ශක්තිමත්ව ඉදිරියට පවත්වා ගෙන යෑම සියල්ලන්ගේ ඒකායන අපේක්ෂාවයි

20. 2006 වසරේ සිට මේ දක්වා අලුත් අවුරුදු පාරිභෝගික ණය වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

21. 2007 වෙළෙඳසැල ආරම්භ කිරීම හා එයට අවශ්‍ය උපකරණ මිලදී ගැනීම.

22. ආරම්භයේ සිට මේ දක්වා ග්‍රාමසංවර්ධන හා අභ්‍යාස පර්යේෂණ ආයතනයේ විවිධ පුහුණුවීම් ලබා දීම.

23. 1993 සිට මේ දක්වා සංවර්ධන පහසුකම් සැලසීමේ ශ්‍රී ලංකා මධ්‍යස්ථානයෙන් විවිධ ආධාර ලබා දී ඇත.

24. සාමාජික දරුවන් සඳහා අ.පො.ස.(සා.පෙළ)විශිෂ්ට ප්‍රතිඵල සඳහා ශිෂ්‍යත්වයක් ආරම්භ කිරීම (2008 සිට).

25. තම ගෙවත්ත සංවර්ධනය කරමින් කාබනික ව්‍යාපෘති සඳහා දිරිගැන්වීම.

26. 2009 වර්ෂයේ පැරැලියේ කොහු ආශ්‍රිත නිෂ්පාදන මධ්‍යස්ථානයක් හා කොහු නිෂ්පාදන යන්ත්‍රයක් විවෘත කිරීම (ලක්ෂ 30 වටිනා).

27. කොහු ආශ්‍රිත නිෂ්පාදන මධ්‍යස්ථානයට අත්ට්‍රැක්ටරයක් SLCDF ආයතනයෙන් ලැබීම.

28. 2015 වසරේ පැරැලිය කොහු නිෂ්පාදන කර්මාන්තය අක්‍රිය වීම නිසා එම මධ්‍යස්ථානය මෙහෙණි ආරාමයකට පූජා කිරීම.

29. ප්‍රථම වතාවට සංවිධානයේ සාමාජිකාවක් සම්පත්දායිකාවක් ලෙස තෝරා ගැනීම.

30. 1996 සිට මේ දක්වා හික්කඩුව සහභාගිත්ව සංවර්ධන පදනමේ පුහුණුකරු වශයෙන් ටී. එව්ලින් ද සිල්වා මහත්මිය සේවය කරයි.

31. දෙවැනි පෙළ නායකත්වයක් ද තෝරාගෙන සිටි.

ටී. එව්ලින්ද සිල්වා

සභාපති,

සහභාගිත්ව සංවර්ධන පදනම - හික්කඩුව.

# 07. දුප්පත්කම හා පානීය ජලය.

පියසේන වැල්ලක්කගේ

මෙම මාතෘකාව කොටස් දෙකකින් සමන්විතය.

- දුප්පත්කම හා
- පානීය ජලය

## දුප්පත්කම

අපි පළමුවෙන්ම කෙටියෙන් හෝ දුප්පත්කම පිළිබඳව කථා කරමු. දුප්පත්කමේ ප්‍රභේද කිහිපයකි. ඉන් ප්‍රධාන වශයෙන් සාකච්ඡා වන කොටස් දෙකකි.

1.අන්ත දුගී භාවය 2. සාපේක්ෂ දුගී භාවය

දුප්පත්කම අතිශයින්ම සංකීර්ණ ප්‍රපඤ්චයකි. නැතහොත් සංසිද්ධියකි. දුප්පත්කම පිළිබඳ අර්ථකථන ද රාශියක් ඇත. ඉන් සමහරක් පහත දක්වමි.



ආර්ථිකමය දෘෂ්ඨි කෝණයකින් බලනවිට, ආහාර, ඇඳුම් පැළඳුම්, නිවාස, අධ්‍යාපනය, සෞඛ්‍ය, පිරිසිදු පානීය ජලය ප්‍රමාණවත්ව නොමැතිකම.

අවම මට්ටමින් හෝ ජීවිතය පවත්වා ගැනීම සඳහා අවශ්‍යවන මෙම මූලික අවශ්‍යතා හිඟකම.

සමාජය තුළ බලය හා සම්පත් බෙදීයාමේ විෂමතාවය හා /හෝ දේශපාලන බලය සඳහා ප්‍රවේශවීමේ මාර්ග හිඟකම.

සමාජ තත්ත්වය සෝදායාම, අසමාන සමාජ සම්බන්ධතා, සමාජයෙන් බැහැරකිරීම, යැපීම් මානසිකත්වය සහ සහභාගිවීමට නොහැකි ලෙස හැකියාවන් හීනවී තිබීම.

මෙම තත්ත්වයන් විවිධ ප්‍රදේශවල අඩු වැඩි වශයෙන් පවතී.

අවශ්‍යතා සපුරා ගැනීමට නොහැකිවීම තුළ දුප්පතුන් විශාල ප්‍රතිශතයක් ක්‍රමයෙන් දුප්පත්කමේ අන්ත අගාධය කරා තල්ලුවෙමින් පැවතීම අප කථා කරන දුප්පත්කම විශ්ලේෂණය කර බැලීමේදී දක්නට හැක.

විවිධ වැඩසටහන් හා ව්‍යාපෘති තුළින් "මැදිහත්කරුවකු" ලෙස දීර්ඝ කාලයක් දුප්පතුන් සමග සමීපව කටයුතු කිරීමට මා ලත් අවස්ථාව නිසා මගේ මතකයේ රැඳී පවතින සංසිද්ධි රාශියක් ඇත. ඉන් කිහිපයක් මා විසින් රචිත " සහභාගිත්ව සංවර්ධනය හා සමාජ සජීවීකරණය" යන කෘතියෙහි ඇතුළත්කර ඇත. එහෙත් නොකී කථා නැතහොත් කීමට අවස්ථාවක් නොලද කථා අපමණය.

නොදියුණු ගම්බද ප්‍රදේශවල මා දුටු දර්ශන හද සසල කරවන සුළුය. ඒවා හද කකියවන සිද්ධින්ය. නොමේරූ දෙල් ගැට තම්බාගෙන දවල් ආහාරය ලෙස ගත් පවුල් මා දැක ඇත. ඊට පොල් ටිකක් හෝ සම්බල් ටිකක්වත් තිබුනේ නැත. මෙම දර්ශනය මා නෙත් තෙමාලීමට සමත්විය.

මහත් දුක්විද සොයාගත් දෙයකින් තුන් වේලක් නොව, එක් වේලක් යම් තම් පිරිමහ ගන්නා පවුල් ද අනන්තය. එම ආහාර වේල බොහෝ අය කථා කරන ‘‘සමබර ආහාර වේලක්‘‘ නම් නොවේ. දුප්පතුන් වෑයම් කරන්නේ; සමබර ආහාර වේලක් ගැනීමට ද? නැත. කුස පිරෙන ආහාර වේලක් සොයා ගැනීමටය.

දරුවන් හාමතේ සිටිනවා දරා ගත නොහැකි වූ එක් පියෙකුගේ කථාවක් මෙසේය.

එදා කුලී වැඩක් සොයා ගිය ද එලක් වී නැත. දරුවන් සහ බිරිද කෑමට මුකුත් රැගෙන එනතෙක් මගබලා සිටී. මෙවැනි හිත අවුල් කරන සිතිවිලි සමග ගෙදර එමින් සිටි ඔහුට අසල පොහොසත් නිවසක මිදුලේ වේලෙන්නට අතුරා තිබූ ගම්මිරිස් තොගයක් ඇස ගැටිණ. අදහසක් පහළ විය. ඉන් ටිකක් සොරකම් කරගත් ඔහු නගරයට ගොස් ඒවා විකුණා, දරුවන්ට රෑටවත් කෑම ටිකක් දෙන අදහසින් අවශ්‍ය අඩුම කුඩුම ගෙනවිත් බිරිඳට භාරදී දී ඇත. ඇය මුදල් සොයා ගත්තේ කෙසේදැයි ඔහුගෙන් ඇසුව ද ඔහු ඊට පිළිතුරු දී නැත. සැන්දෑව අවට අඳුර පතුරමින් සිටිද්දී, පොලිස් ජීප් රථයක් ඔහුගේ නිවස ඉදිරිපිට නවත්වනවා ඔහුගේ නෙත ගැටිණ. නිවස පසුපසින් ඔහු කැලෑවට වැදී නොපෙණී ගොස්ය. හෙට උදේම පොලිසියට එන ලෙසත්, නැවත අප මෙහාට නොගෙන්වන ලෙසත් පොලිස් නිලධාරීන් ඔහුගේ බිරිඳට තදින්ම කියා ඇත. රෑ බෝවුන පසු ඔහු ගෙදර ආවේය. බිරිඳ සිදුවූ සියල්ල ඔහුට පවසා ඇත. ඔහු නිහඬව සිට කහට කෝප්පයක් බී එළියේ මැස්සට වී හෙට පොලිසියට ගිය විට ලැබෙන ‘‘සත්කාර’’ ගැන සිතමින් ඉන් ගැලවෙන මගක් ඇත්දැයි සොයන්නට විය. එහෙත්, ඔහුට එවැනි මගක් හමුවී නැත. ඔහු තුළ වූ සන්ත්‍රාසය වඩාත් තීව්‍ර වූයේ; ඔහු කිසිදා පොලිසියකට ගොස් නොතිබූ නිසාය.



පසුදා පාන්දරම තම දරුවන් සිඹ, ගෙදර ඉදිරිපිට තිබූ රුස්ස කොස් ගහකට නැගගත් මේ අසරණ පියා එහි බොහෝ ඉහළට නැග ඇත. සිදුවන්නට යන මහා වින්නැහිය තේරුම් ගත් බිරිඳගේ විලාපය අසා අහල පහල උදවිය එතනට රැස්වී ඔහුට කොස් ගසින් බසින ලෙසත්, පොලිසියේ ප්‍රශ්නය බේරුම් කර දෙන බවටත් කොතෙකුත් පොරොන්දු දී ගසින් බසින ලෙස ඔහුගෙන් ඉල්ලා ඇත. ඒත් සිදුවූයේ කුමක් ද? දරුවන්, බිරිඳ හඬා වැටෙද්දී; සියල්ලන් බලා සිටිද්දී ඔහු වැඩිපුර ගෙනගිය සරමකින් කොස් ගහේ අත්තක එල්ලී සියදිවි නසා ගැනීමයි. දරු පවුලට කුමක් වන්නට ඇද්ද? (මෙය ද සත්‍ය කථාවකි.) මා දන්නා මෙවැනි කඳුළු කඩා හැලෙන දුප්පතුන්ගේ කථා රාශියක් ඇත. මා හා ඔබ නොදන්නා කථා තව කොතෙක් ඇද්ද? තම දුක්බර ජීවිත කථාන්දර තමා තුළම සඟවා ගෙන මියැදෙන මව්වරුන් පියවරුන් සිය දහස් ගණනක් ඇතුවාට සැක නැත.

මෙපමණ ද? ජීවත්වීමට නොහැකිව දරුවන් සමග ගඟට පණින අම්මලා, දරුවන්ට ද වස පොවා තමන් ද වස බී මැරෙන අම්මලා, දරුවන් රැකීමට සුළු සුළු හොරකම් කර හිරේ විලංගුවේ වැටුන තාත්තලා කොපමණක් නම් මේ සමාජයේ ඇද්ද? මැරෙන්න අර අදිමින් සිටින අම්මලා තාත්තලා තව කොතෙක් ඇද්ද? මැරි මැරී ජීවත්වන දෙමාපියන් හා දරුවන් කොතෙක්දැයි කවුරු නම් දනී ද?



ලෙඩ දුක්වලින් පෙළෙන දරුවන්, කුසගින්නේ ඉන්න දරුවන්, පාසැල් නොයන දරුවන්, වැස්සට නොතෙමෙන, අව්වට නොවේලෙන වහලක් නැති දරුවන්, ලෙඩට දුකට බෙහෙතක් නැති ළමයින්, ගමනක් බිමනක් යාමට හරි හමන් ඇඳුමක් නැති ළමයින්, සමාජය බැහැර කරන ළමයින් ඔබට සිටීනම් දෙමව්පියන් ලෙස දැනෙන වේදනාව වචනවලින් කිව හැකිද? දුප්පත් දෙමාපියන් ඒ සියළු දුක් වේදනා හද තුළ දරාගනිමින් එදිනෙදා ජීවිතය ගැට ගසා ගැනීම සඳහා මහත් අරගලයක නිරතව ඇත.



මෙවන් පරිසරයක් තුළ ජීවත්වන හැබෑ දුප්පතුන්, තමන් පත්ව ඇති ශෝචනීය තත්ත්වයට හේතු භූත වී ඇති කරුණු කාරණා ගැන හෝ ඉන් මිදෙන ක්‍රමයක් ගැන නොදනී. සොයා බැලීමක් ද නොකරයි.

දුප්පත්කම හා තදින් බැඳී පවතින ප්‍රධාන සාධක අතරින් පානීය ජලයට හිමිවන්නේ; අද්විතීය ස්ථානයකි. අපිරිසිදු ජලය පානය කිරීමේ ආදීනව ගැන දුප්පතුන්ට අවබෝධයක් ඇති බවක් නොපෙනේ. පානීය ජලයට එහා ගිය ප්‍රශ්න හා ගැටළු රාශියකින් ඔවුන් වෙළී ඇත. ඒතුළම ගැටෙමින් දුක් විඳිමින් ඔවුන් ජීවිතය තල්ලු කරගෙන යන බවකුයි; පෙනෙන්නට ඇත්තේ. අපි ද ඔහේ බලා සිටිමු.

**පානීය ජලය හා දුප්පත්කම**

පිරිසිදු පානීය ජලය, මූලික අවශ්‍යතාවලින් එකක් පමණක් නොව මූලික මිනිස් අයිතිවාසිකමක් ද වේ. එසේ වුවද,



පානීය ජලය හා දුප්පත්කම ඉතා සමීපව එකට ඇඳී ඇත. මින් එකක් අනික වෙත තදින්ම බලපෑම්කරනු පෙනේ.

පිරිසිදු පානීය ජලය ලබාගැනීම ප්‍රශ්නයක් වී ඇත්තේ කාටද? අන් කාටත් වඩා එය බරපතල ප්‍රශ්නයක් වී ඇත්තේ; දුප්පතුන්ටය. දුප්පත්කම නිසා පිරිසිදු පානීය ජලය ලබාගැනීම දුෂ්කර වන අතර, එහි ප්‍රතිඵලය ලෙස දුප්පත්කම උග්‍ර වේ. පිරිසිදු පානීය ජලය නොමැති හැමවිටම වාගේ දුප්පතුන්ගේ විකල්පය වනු ඇත්තේ; අපිරිසිදු ජලය පානය කිරීමයි. ඉන් ඇතිවන ප්‍රතිඵලය කෙබඳුද? ඔවුන් තව තවත් දුප්පත් වීමයි. එය තහවුරු කරන කරුණු කීපයක් පහත දක්වනු කැමැත්තෙමි.



දුප්පත් උදවියට වැළඳෙන රෝගාබාධවලින් 60% කට වඩා වැළඳෙන්නේ; අපිරිසිදු ජලය පානය කිරීමෙනි. (ලෝක සෞඛ්‍ය සංවිධානය)

ජලය නිසා වැළඳෙන රෝගවලට ඉතා පහසුවෙන් ගොදුරුවන්නේ; ළමයින්ය. ඉන් ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු ද අඩාල වේ. අනාගතය අභියෝග රැසකට මැදිවේ.

ජලයෙන් බෝවෙන රෝග පසුපසින් තවත් බොහෝ දේ ගමන්කරයි. ලෙඩදුක් සඳහා වියදම්, ආදායම් නැති වී යාම, මන්දපෝෂණය, ණය ගැතිවීම හා දුප්පත්කම කිඳා බැසීම ඉන් ප්‍රධානයි. මේ සියල්ල නිසා තම අභිමානය හා ආත්ම ගෞරවය සෝදා පාළුවට ලක්වේ.

අපිරිසිදු ජලය පානය කිරීම හේතුවෙන් ලෙඩ රෝගවලට ගොදුරුවීමෙන් සෞඛ්‍ය තත්ත්වය පිරිහීයයි. එහි එක් ප්‍රතිඵලයක් ලෙස ශරීර ශක්තිය පිරිහීයාම නිසා නිෂ්පාදන කාර්යයක නිරතවීමට නොහැකි වේ. කුලී වැඩක්වත් හරියට කිරීමට ශක්තිය නැති වී යයි. ඉන් සිදුවන්නේ; දුප්පතා, දුප්පත්කමේ සිරකරුවකුවීමය.

පානීය ජලය තම ජීවිතවලට මෙතරම් බලපෑමක් කරන බව විශේෂයෙන්ම දුප්පතුන් නොදනී. දන්නේනම්, තම දරුවන්ට එම ජලය බීමට ඔවුන් ඉඩ නොතබනු ඇත. සමහරවිට දැනගත්ත ද විකල්පයක් නැතිවන්නට ද හැකියාව තිබේ

**පානීය ජල ගැටළුවට නව මානයක විසඳුම්**

දුප්පතුන්, දුප්පත්කම තුළ රඳවන හේතු සාධක අතරින්, පානීය ජලයට හිමිවන්නේ; ප්‍රධානම තැනකි. එබැවින්, පිරිසිදු පානීය ජලය සපයන ආයතනවලට පැවරෙන අති මහත් ජාතික වගකීමක් ඇත.



පානීය ජලය සැපයීමට අමතරව, පානීය ජලය හා දුප්පත්කම අතර ඇති ඉතාමත්ම අහිතකර අන්‍යෝන්‍ය සම්බන්ධය පිළිබඳවත්, අපිරිසිදු ජලය පානය කිරීමේ ආදීනව ගැනත්, ජලය අරපරිස්සමින් පරිහරණය කිරීම පිළිබඳව හා ජල මූලාශ්‍ර ආරක්ෂාකර ගැනීම පිළිබඳවත් ජනතාව හොඳින් දැනුවත් කළ යුතුය.



පානීය ජලය හා මූලික සනීපාරක්ෂක පහසුකම් නොමැතිකම/ හිඟකම, දුප්පතුන් දරිද්‍රතාවයේ ආගාධය තුළ හිර කර තබන ප්‍රබල සාධකයක් වුවත්, එම ගැටළුව හුදෙකලාව ගෙන විසඳීමට යාමෙන් අපෙක්ෂිත ප්‍රතිඵල ළඟාකර ගැනීම අපහසු වනු ඇත.

දුප්පතුන්ගේ පානීය ජල ප්‍රශ්නයට විසඳුම් සොයන කුමන හෝ සංවිධානයක් වේනම්; ඒ අයට ප්‍රජා ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතියෙන් බොහෝ පාඩම් ඉගෙන ගත හැක. එම ව්‍යාපෘතිය මගින් නව ආරක් ගත්, සහභාගිත්ව සංවර්ධන සංකල්ප හා උපාය මාර්ග මත පිහිටි, ජාතික මට්ටමේ පානීය ජල හා සනීපාරක්ෂක ව්‍යාපෘති 04 ක් ක්‍රියාත්මක කිරීමෙන් බොහෝ අත්දැකීම් හා පළපුරුද්දක් ලබාගෙන ඇත.

එය ඉගෙනගනිමින් ක්‍රියාත්මක කරන ලද්දකි. ව්‍යාපෘති අවසානයේ කරන ලද ඇගයීමට අනුව, ප්‍රතිලාභීන්, ජල යෝජනා ක්‍රම ඉදිකිරීමේ වියදමින් 31% කින් දායක වී ඇත. රජය ද මහත් බරකින් නිදහස් කරමින්, ගම් මට්ටමේ නිමවූ ජල යෝජනා ක්‍රමවල අයිතිය, නඩත්තුව සහ කළමනාකරණය ද ප්‍රජා මූල සංවිධාන විසින් භාර ගෙන ඇත. පානීය ජලය ලබාදීමට අමතරව, ගමට අවශ්‍ය සමාජ, ආර්ථික, ආගමික හා සංස්කෘතික කටයුතු රාශියක් ද ඔවුන් ක්‍රියාත්මක කරණු දක්නට තිබිණි.

**ඒ පිළිබඳ කෙටි සටහනක් පහත දක්වමි.**

ජාතික මට්ටමේ මෙම දැවැන්ත ව්‍යාපෘති 04 දිස්ත්‍රික්ක 13 ක ක්‍රියාත්මක කළෙමු. එමගින් 3,450,000 කට අධික ප්‍රතිලාභී පිරිසකට ඉතාමත්ම අඩු පිරිවැයකට, පානීය ජලය හා සනීපාරක්ෂක පහසුකම් ලබාදීමට අපට හැකිවිය. ප්‍රජා මූල සංවිධාන 4500 කට වඩා ගොඩ නඟා ගැනීමට ප්‍රතිලාභීන් පෙළඹවූවෙමු. එහිදී, පානීය ජලය, සනීපාරක්ෂාව සමග ආර්ථික, සමාජයීය, සංස්කෘතික, ආගමික වැඩ සටහන් මෙන්ම සමිති කළමනකරණය ද ඔවුන්ට හුරු කළෙමු. එමගින්, ප්‍රජාමූල සංවිධානය, ගමේ සංවර්ධන මධ්‍යස්ථානය බවට පත් කිරීමත්, ජල යෝජනා ක්‍රමවල දීර්ඝකාලීන පැවැත්ම තහවුරු කිරීමත් ප්‍රධාන අරමුණු අතර විය. අපගේ පළමු නියාමක ව්‍යාපෘතිය, ලෝක බැංකු ආධාර යටතේ ලෝකය පුරා ක්‍රියාත්මක කළ නියාමක ව්‍යාපෘති 200 ක් අතුරින්, හොඳම ව්‍යාපෘතිය බවට (Best Practice and Well Managed Project) තේරුණි. අපේ විජයග්‍රහනය, අගය කිරීමක් ලෙස, දෙවන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ලෝක බැංකුවෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 38.9 ක ප්‍රදානයක් ද අප රටට ලැබිණි.

වර්තමාන ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේතුවේ ප්‍රභවය, ප්‍රජා ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය බව ද මෙහිලා සඳහන් කරනු කැමැත්තෙමි.

පානීය ජලයෙන් පීඩා විඳින ජනතාවට ඉන් මිදීමට ඇති මාර්ගය එළි පෙහෙළි කර දියයුතු අතර, ඔවුන් ඒ සඳහා දැනුවත් කර සංවිධාන ගත කළ යුතු වේ. මෙහිදී, සහභාගිත්ව සංවර්ධන ප්‍රවේශය මෙන්ම, විශේෂයෙන්ම සමාජ සජීවිකරන ක්‍රියාවලිය යොදා ගැනීම ඉතා වැදගත් වේ. ජලයෝජනා ක්‍රමයේ අයිතිය ඔවුන් සතුවන බව ආරම්භයේ සිටම ඔවුන්ට ඒත්තු ගැන්විය යුතුය. එසේ අයිතිය පිළිබඳ විශ්වාසය ගොඩ නැගීම, නිමවන ජල යෝජනා ක්‍රමයේ දීර්ඝ කාලීන පැවැත්ම සහතික කරන පදනම වනු ඇත.

පිරිසිදු පානීය ජලය හා මූලික සනීපාරක්ෂක පහසුකම් ලබාදීම හෝ ලබා ගැනීමට මංපෙත් විවර කරදීම, දුප්පතුන් අත්විඳින අප්‍රමාණවූ ද අනේකවිධවූ ද දුක් කම්කටළුවලින් ඔවුන්ට මහත් වූ සැනසිල්ලක් ලබා ගැනීම සඳහා ඉටු කරන ජාතික යුතුකමක් මෙන්ම මහා පුණ්‍යකරමයක් මිස අන් කවරක්ද?

පියසේන වැල්ලක්කගේ
හිටපු ජාතික ව්‍යාපෘති අධ්‍යක්ෂ - ප්‍රජා ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය,
හිටපු අධ්‍යක්ෂ ජනරාල් - නාගරික සංවර්ධන හා ජල සම්පාදන අමාත්‍යාංශය ග්‍රාමීය ජල සම්පාදන හා
සනිපාරක්ෂක අංශයේ හිටපු අධ්‍යක්ෂ ජනරාල්

# 08. නූතන ලෝකයේ ග්‍රාමීය සංවර්ධනය සැලසුම් කිරීමේදී අවධානය යොමු කරන ප්‍රධාන අංශ....

කේ. බී. ධර්මප්‍රිය

හේතු කිහිපයක් නිසා සංවර්ධනය වෙමින් පවතින රටවලට ග්‍රාමීය සංවර්ධනයේ ස්වරූපය ආවේනික වනු ඇත. ග්‍රාමීය ප්‍රදේශයේ හෝ කලාපයේ ස්වරූපය අනුව අවශ්‍ය වන්නා වූ විශේෂිත ඉලක්ක, ප්‍රමුඛතා සහ අභියෝග මත පදනම්ව වෙනස් විය හැක. කෙසේ වෙතත්, විස්තීරණ ග්‍රාමීය සංවර්ධන ක්‍රියාවලියක දී නූතන සමාජය සාමාන්‍යයෙන් ප්‍රධාන සංරචක හෝ අංග කිහිපයක් වෙත ප්‍රමුඛ අවධානය ලක් කරන බව පෙනේ. තාක්ෂණය ඒකාබද්ධ කිරීම, තිරසාර කෘෂිකර්මය, ග්‍රාමීය ආර්ථිකයන් විවිධාංගීකරණය, යටිතල පහසුකම් සංවර්ධනය, අධ්‍යාපනය සහ කුසලතා පුහුණුව, ප්‍රජා මූලික සංවර්ධනය. පාරිසරික සංරක්ෂණය, මූල්‍ය ප්‍රවේශය, වැනි දෑ ඒ අතර ප්‍රධාන වේ.

සංවර්ධනය සහ ග්‍රාමීය සංවර්ධනය යනු ආර්ථික ප්‍රගතිය ඇති කිරීම සහ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා අත්‍යවශ්‍ය වන අන්තර් සම්බන්ධිත සංකල්ප දෙකකි. සංවර්ධනය පුළුල් සමාජීය හා ආර්ථික දියුණුව ආවරණය කරන අතර, ග්‍රාමීය සංවර්ධනය විශේෂයෙන් ග්‍රාමීය ප්‍රදේශවල තත්ත්වයන් වැඩි දියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කරයි. මෙම මානයන් අතර අන්තර් ක්‍රියාකාරිත්වය තේරුම් ගැනීම සාධාරණ සංවර්ධන උපාය මාර්ග සැකසීම සහ ග්‍රාමීය ප්‍රජාවන් මුහුණ දෙන අනන්‍ය අභියෝග සඳහා විසඳුම් සැපයීම සඳහා ඉතා අත්‍යවශ්‍ය වේ. ග්‍රාමීය සංවර්ධන ප්‍රතිපත්තියක දී ග්‍රාමීය ප්‍රදේශවල ආර්ථික, සමාජීය සහ පාරිසරික තත්ත්වයන් වැඩිදියුණු කිරීම අරමුණු කරගත් උපාය මාර්ග, වැඩසටහන් සහ මූල පිරීම් සමූහයක එකතුවකි. මෙම ප්‍රතිපත්ති සාමාන්‍යයෙන් සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලබන්නේ රජයන් විසින්, බොහෝ විට ප්‍රාදේශීය ප්‍රජාවන්, රාජ්‍ය නොවන සංවිධාන (NGOs) සහ අනෙකුත් පාර්ශවකරුවන් සමඟ සහයෝගයෙන් ය. ග්‍රාමීය සංවර්ධන ප්‍රතිපත්තිවල ඉලක්ක ග්‍රාමීය ප්‍රදේශ මුහුණ දෙන විශේෂිත සන්දර්භය සහ අභියෝග මත පුළුල් ලෙස වෙනස් විය හැකි වුවත් පහත පරිදි පොදු අරමුණු හඳුනාගත හැකිය.

### ආර්ථික වර්ධනය සහ දරිද්‍රතාවය අඩු කිරීම:

ග්‍රාමීය ප්‍රදේශවල බොහෝ විට ඉහළ දරිද්‍රතා අනුපාත සහ සීමිත ආර්ථික අවස්ථාවන් පවතී. කේන්ද්‍රගත ග්‍රාමීය සංවර්ධන ප්‍රතිපත්තියක් මගින් කෘෂිකර්මාන්තය වැඩිදියුණු කිරීම, රැකියා උත්පාදනය සහ දේශීය ව්‍යවසායන් නංවාලීම මගින් ආර්ථික වර්ධනය උත්තේජනය කළ හැකිය. මෙමගින් මිනිසුන් දිළිඳුකමින් මුදවා ගැනීමට සහ ආදායම් අසමානතාවය අඩු කිරීමට උපකාරී වේ. ග්‍රාමීය ප්‍රදේශවල ආර්ථික වර්ධනය සහ සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම ඉලක්ක කරගත් උපාය මාර්ග. කෘෂිකර්මාන්තය, කෘෂි ව්‍යාපාර, ග්‍රාමීය කර්මාන්ත, සංචාරක සහ ව්‍යවසායකත්වය සඳහා ආධාර කිරීමේ මූලපිරීම් මෙයට ඇතුළත් විය හැකිය. ආයෝජන ආකර්ෂණය කර ගැනීම, මූල්‍ය සඳහා ප්‍රවේශය වැඩිදියුණු කිරීම සහ ආර්ථික ක්‍රියාකාරකම් සඳහා සහාය වන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම ද එයට ඇතුළත් විය හැකිය. ක්ෂුද්‍ර මූල්‍ය සහ ණය ප්‍රවේශය, කුඩා ගොවීන්ට සහ ග්‍රාමීය ව්‍යවසායකයින්ට මූල්‍ය

සේවා සැපයීම, ග්‍රාමීය ආර්ථිකයන් විවිධාංගීකරණය කිරීම සඳහා කුඩා ව්‍යාපාර සහ ගොවිපල නොවන ක්‍රියාකාරකම් සඳහා සහාය වීම, ග්‍රාමීය ප්‍රජාවන්හි රැකියා උත්පාදනය, ව්‍යවසායකත්වය සහ තිරසාර ආර්ථික වර්ධනය ප්‍රවර්ධනය කිරීම, ආයෝජන ආකර්ෂණය කර ගැනීමට, දේශීය ව්‍යාපාරවලට සහාය වීමට, යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම, (මාර්ග සහ උපයෝගිතා වැනි) සහ වෙළඳපොලවලට ප්‍රවේශය වැඩි කිරීම, වැනි මූල පිරිම් මෙයට ඇතුළත් විය හැකිය.

**කෘෂිකාර්මික ඵලදායිතාව:**

බොහෝ සංවර්ධනය වෙමින් පවතින රටවල කෘෂිකර්මාන්තය ප්‍රධාන ජීවනෝපාය මාර්ගයකි. නවීන කෘෂිකාර්මික ශිල්පීය ක්‍රමවලට අනුග්‍රහය දක්වන, බීජ හා පොහොර වැනි සම්පත් සඳහා ප්‍රවේශය සහ යටිතල පහසුකම් වැඩිදියුණු කරන ප්‍රතිපත්ති මඟින් ආහාර සුරක්ෂිතතාව සහ ආර්ථික ස්ථාවරත්වය සඳහා අත්‍යවශ්‍ය වන කෘෂිකාර්මික ඵලදායිතාව සැලකිය යුතු ලෙස ඉහළ නැංවිය හැකිය. මේ සඳහා කෘෂි නවීකරණ වැඩසටහන් මගින් ග්‍රාමීය ප්‍රදේශවල සුහුරු කෘෂිකර්මාන්තය (Smart Agriculture) ප්‍රවර්ධනය කිරීම දක්නට ඇත.

**යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම:**

ග්‍රාමීය ප්‍රදේශවලට මාර්ග, විදුලිය සහ ජල සැපයුම වැනි අත්‍යවශ්‍ය යටිතල පහසුකම් වල අඩුවක් පවතී. ග්‍රාමීය සංවර්ධන ප්‍රතිපත්තියක් මගින් මෙම ප්‍රදේශවල ආයෝජන සඳහා ප්‍රමුඛත්වය දිය හැකි අතර, ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම සහ ආර්ථික කටයුතු සඳහා පහසුකම් සැලසිය හැක. ග්‍රාමීය ප්‍රදේශවල සම්බන්ධතාවය, මූලික සේවා (ජලය, සනීපාරක්ෂක සහ විදුලිය වැනි), ප්‍රවාහන ජාල (මාර්ග, පාලම්) සහ ඩිජිටල් සම්බන්ධතා (බ්‍රෝඩ්බෑන්ඩ් අන්තර්ජාලය) සඳහා ප්‍රවේශය වැඩි දියුණු කරන යටිතල පහසුකම් ව්‍යාපෘති සඳහා වන සැලසුම් සහ ආයෝජන මෙහිදී බොහෝ ප්‍රයෝජනවත් වේ. ග්‍රාමීය ප්‍රජාවන්ගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම සහ ආර්ථික ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සැලසීම සඳහා ප්‍රවාහන ජාල, සන්නිවේදන පද්ධති, ජල සම්පාදන සහ සනීපාරක්ෂක පහසුකම් වැනි මූලික යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම වැනි දෑ මෙහිදී අත්‍යාවශ්‍ය වනු ඇත.

**අධ්‍යාපනය සහ සෞඛ්‍යය:**

ගුණාත්මක අධ්‍යාපන සහ සෞඛ්‍ය සේවා සඳහා ප්‍රවේශය බොහෝ විට ග්‍රාමීය ප්‍රදේශවල සීමිතය. ඉලක්කගත ප්‍රතිපත්ති මගින් පාසල් ගොඩනැගීමට, සෞඛ්‍ය පහසුකම් වැඩිදියුණු කිරීමට සහ වෘත්තිකයන් පුහුණු කිරීමට උපකාර වන අතර එමඟින් ග්‍රාමීය ජනතාව සඳහා වඩා හොඳ සමස්ත සංවර්ධනයක් සහ ජීවන තත්ත්වයකට මඟ පෑදිය හැකිය. ග්‍රාමීය අධ්‍යාපන වැඩසටහන්, තිරසාර සංවර්ධන වැඩසටහන් සඳහා යුනෙස්කෝ අධ්‍යාපනය වැනි ග්‍රාමීය ප්‍රදේශවල අධ්‍යාපනයට ප්‍රවේශය වැඩිදියුණු කිරීම ඉලක්ක කරගත් මූලපිරීම්, වෘත්තීය පුහුණුව, ග්‍රාමීය තරුණයින් සහ වැඩිහිටියන් සඳහා ප්‍රායෝගික කුසලතා සැපයීම සඳහා සැලසුම් කර ඇති වැඩසටහන්, උදාහරණ ලෙස කෙන්යාවේ නිපුණතා සංවර්ධන අරමුදල මේ සඳහා උදාහරණ වේ.

**සමාජ ඇතුළත් කිරීම/අන්තර්ගතභාවය: (Social Inclusion)**

ග්‍රාමීය සංවර්ධන ප්‍රතිපත්තිවලට සමාජ අසමානතා ආමන්ත්‍රණය කළ හැකි අතර කාන්තාවන්, සුළු ජාතීන් සහ ආදිවාසී ප්‍රජාවන් වැනි ආන්තික කණ්ඩායම්වලට සහාය දීමෙන් සමාජ ඇතුළත් කිරීම ප්‍රවර්ධනය කළ හැකිය.

මෙමගින් සමාජයේ සියලුම කොටස් සංවර්ධන ප්‍රයත්නයන්ගෙන් ප්‍රතිලාභ ලබන බව සහතික කරයි. ස්ත්‍රී පුරුෂ සමානාත්මතා වැඩසටහන්, කාන්තාවන් සවිබල ගැන්වීම සහ ග්‍රාමීය ප්‍රදේශවල ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගත් මුලපිරීම්. උදාහරණ ලෙස එක්සත් ජාතීන්ගේ කාන්තා/ ග්‍රාමීය කාන්තා ආර්ථික සමාජ සංවර්ධන වැඩසටහන්, දරිද්‍රතාවය, අධ්‍යාපනය, සෞඛ්‍ය සේවා, නිවාස සහ ග්‍රාමීය ප්‍රදේශවල සමාජ ඇතුළත් කිරීම් වැනි සමාජ ප්‍රශ්න ආමන්ත්‍රණය කිරීම සිදුකරයි. සෞඛ්‍ය සේවා සඳහා ප්‍රවේශය වැඩි දියුණු කිරීම, පාසල් ගොඩනැගීම, දැරිය හැකි මිලකට නිවාස සැපයීම සහ අවදානමට ලක්විය හැකි ජනගහනයට සහාය වීම සඳහා සවිබල ගැන්වීමේ වැඩසටහන් සහ කාන්තා අයිතිවාසිකම් සහ ආර්ථික සහභාගීත්වය කෙරෙහි අවධානය යොමු කරන ලද විවිධ මුල පිරීම් මෙයට ඇතුළත් විය හැකිය.

### පාරිසරික තිරසාරත්වය:

ග්‍රාමීය සංවර්ධන ප්‍රතිපත්තිවලට ස්වභාවික සම්පත් ආරක්ෂා කිරීම, සංරක්ෂණය ප්‍රවර්ධනය කිරීම සහ ඉඩම් පරිහරණය ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සඳහා තිරසාර භාවිතයන් ඇතුළත් කළ හැකිය. මෙය පාරිසරික හායනය වැලැක්වීමට උපකාරී වන අතර සංවර්ධනයේ දිගුකාලීන තිරසාර බව සහතික කරයි. ස්වභාවික සම්පත් තිරසාර කළමනාකරණය ප්‍රවර්ධනය කිරීම, පාරිසරික සංරක්ෂණය සහ පාරිසරික අවදානම් අවම කිරීම ඉලක්ක කරගත් පියවර. ඉඩම් පරිහරණය සැලසුම් කිරීම, ජෛව විවිධත්ව සංරක්ෂණය, ජල සම්පත් කළමනාකරණය, දේශගුණික විපර්යාස වලට අනුවර්තනය කිරීම සහ පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් ප්‍රවර්ධනය කිරීම පිළිබඳ ප්‍රතිපත්ති මෙයට ඇතුළත් විය හැකිය. ප්‍රජා පාදක ස්වභාවික සම්පත් කළමනාකරණය, තිරසාර බව සහ සංරක්ෂණය සහතික කිරීම සඳහා ස්වභාවික සම්පත් දේශීය කළමනාකරණය දිරිමත් කරන ප්‍රතිපත්ති. උදාහරණ ලෙස නේපාලයේ ප්‍රජා වන කළමනාකරණ වැඩසටහන් සහ විවිධ රටවල සහභාගීත්ව ජල කළමනාකරණය වැනි වැඩසටහන් . දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව, ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO) විසින් ප්‍රවර්ධනය කරන ලද දේශගුණික-ස්මාර්ට් කෘෂිකාර්මික ප්‍රවේශය වැනි දේශගුණික විපර්යාසයන්ට අනුවර්තනය වීමට ග්‍රාමීය ප්‍රජාවන්ට උපකාර කිරීම අරමුණු කරගත් වැඩසටහන්, ග්‍රාමීය ප්‍රදේශවල තිරසාර ඉඩම් පරිහරණ පිළිවෙත්, ස්වභාවික සම්පත් කළමනාකරණය සහ පාරිසරික සංරක්ෂණය ප්‍රවර්ධනය කිරීම. ජෛව විවිධත්වය ආරක්ෂා කිරීම, පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් ප්‍රවර්ධනය කිරීම සහ දේශගුණික විපර්යාසවල බලපෑම අවම කිරීම සඳහා මුල පිරීම් මෙයට ඇතුළත් වේ.

### සංක්‍රමණය සහ නාගරීකරණය:

ග්‍රාමීය ප්‍රදේශවල තත්ත්වයන් වැඩිදියුණු කිරීමෙන් හා එවැනි ප්‍රතිපත්ති මගින් ග්‍රාමීය ප්‍රෙද්ශ වල සිට නාගරික ප්‍රෙද්ශ වලට සංක්‍රමණය හේතුවෙන් නාගරික මධ්‍යස්ථාන මත ඇති වන පීඩනය අඩු කළ හැකිය. මෙමගින් වඩාත් සමබර ප්‍රාදේශීය සංවර්ධනයක් ඇති කිරීමටත් නගරවල තදබදය අවම කිරීමටත් හැකි වේ.

### ප්‍රජා සවිබල ගැන්වීම:

ඵලදායී ග්‍රාමීය සංවර්ධන ප්‍රතිපත්ති මගින් ප්‍රාදේශීය ප්‍රජාවන් තීරණ ගැනීමේ ක්‍රියාවලීන්ට සම්බන්ධ කර ගැනීමෙන් සහ බිම් මට්ටමේ මුල පිරීම්වලට සහාය වීමෙන් ඔවුන් සවිබල ගැන්විය හැකිය. මෙය ප්‍රාදේශීය හිමිකාරිත්වය පෝෂණය කරන අතර සංවර්ධන ප්‍රයත්නයන් ප්‍රජාවගේ අවශ්‍යතා සහ අභිලාෂයන් සමඟ සමපාත වන බව සහතික

කරයි. ග්‍රාමීය සංවර්ධනයට අදාළ තීරණ ගැනීමේ ක්‍රියාවලීන්හි ප්‍රජා සහභාගීත්වය, සම්බන්ධවීම සහ බලගැන්වීම ප්‍රවර්ධනය කරන ප්‍රතිපත්ති සහ වැඩසටහන් මගින් ප්‍රාදේශීය නායකත්වයට සහාය වීම, ප්‍රජා මූලික සංවිධාන සමඟ හවුල්කාරිත්වයන් වර්ධනය කිරීම සහ බිම් මට්ටමේ මුල පිරීම් ප්‍රවර්ධනය කිරීම සිදු වේ. ප්‍රාදේශීය ප්‍රජාවන් සවිබල ගැන්වීම, ප්‍රජා සහභාගීත්වය දිරිමත් කිරීම, ප්‍රාදේශීය නායකත්වය පෝෂණය කිරීම සහ ඔවුන්ගේ ජීවිතවලට බලපාන සංවර්ධන ක්‍රියාවලීන් සහ තීරණ වල හිමිකාරිත්වය ගැනීමට නිවැසියන් බල ගැන්වීම මෙහිදී සිදුවනු ඇත.

**පාලනය සහ ආයතනික ශක්තිමත් කිරීම:**

ප්‍රාදේශීය පාලන ව්‍යුහයන් ශක්තිමත් කිරීම, රාජ්‍ය පරිපාලන හැකියාවන් වැඩි දියුණු කිරීම සහ ග්‍රාමීය සංවර්ධනයට සම්බන්ධ විවිධ මට්ටමේ රජයේ සහ පාර්ශ්වකරුවන් අතර සම්බන්ධීකරණය වැඩිදියුණු කිරීමේ උපාය මාර්ග, රාජ්‍ය පරිපාලනය වැඩිදියුණු කිරීම සහ සංවර්ධන මුලපිරීම් ඵලදායි ලෙස සැලසුම් කිරීමට, ක්‍රියාත්මක කිරීමට සහ අධීක්ෂණය කිරීමට ප්‍රාදේශීය ආයතනවල හැකියාව වැඩි දියුණු කිරීම මෙයට ඇතුළත් විය හැකිය.

**අධීක්ෂණ සහ ඇගයුම් යාන්ත්‍රණ:**

ප්‍රගතිය අධීක්ෂණය කිරීම, මැදිහත්වීම්වල බලපෑම ඇගයීම සහ ප්‍රතිපෝෂණ සහ ක්‍රියාත්මක කිරීමෙන් උගත් පාඩම් මත පදනම්ව ප්‍රතිපත්ති සහ උපාය මාර්ග සකස් කිරීම සඳහා යාන්ත්‍රණ අවශ්‍ය වේ.

**අරමුදල් සහ සම්පත් වෙන් කිරීම:**

අරමුදල් ප්‍රභවයන් හඳුනා ගැනීම, රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් උත්තේජනය කිරීම සහ සම්පත් කාර්යක්ෂමව භාවිතා කිරීම සහතික කිරීම ඇතුළුව ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට සහාය වීම සඳහා අරමුදල් සහ සම්පත් වෙන් කිරීම සඳහා සැලසුම් මෙහිදී ප්‍රයෝජනවත් වනු ඇත.

සංවර්ධනය වෙමින් පවතින රටවල ග්‍රාමීය ප්‍රදේශ මුහුණ දෙන විශේෂිත අභියෝගවලට මුහුණ දීම සඳහා සහ සියලු කාරණා ආවරණය වන සමබර සහ තිරසාර සංවර්ධනයක් ප්‍රවර්ධනය කිරීම සඳහා වන ග්‍රාමීය සංවර්ධන ප්‍රතිපත්තියක් හා සැලසුම් අත්‍යවශ්‍ය වේ. සමස්තයක් වශයෙන්, හොඳින් සංවර්ධිත ග්‍රාමීය සංවර්ධන ප්‍රතිපත්තියක් ග්‍රාමීය ප්‍රජාවන්ගේ නිශ්චිත අවශ්‍යතා සහ සන්දර්භයන්ට විස්තීර්ණ සහ ඒකාබද්ධ ප්‍රතිචාර දැක්විය යුතු අතර, තිරසාර සංවර්ධනයක් ළඟා කර ගැනීම සහ ග්‍රාමීය ජනතාවගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම අරමුණු කර ගැනීම වැදගත් වේ. නවීන ග්‍රාමීය සංවර්ධනය අරමුණු කරන්නේ ඔවුන්ගේ අනන්‍ය සංස්කෘතික උරුමයන් සහ ස්වභාවික පරිසරයන් සංරක්ෂණය කරමින් වැඩි වැඩියෙන් අන්තර් සම්බන්ධිත ලෝකයක සශ්‍රීකව පැවතිය හැකි ඔරොත්තු දෙන, ස්වයංපෝෂිත ප්‍රජාවන් නිර්මාණය කිරීමයි. නාගරික සහ ග්‍රාමීය ප්‍රදේශ අතර විෂමතා අවම කිරීම, සමතුලිත ප්‍රාදේශීය සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සහ ග්‍රාමීය ජනතාවගේ සමස්ත ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා කටයුතු කලයුතු වේ. මෙම ප්‍රතිපත්ති හා සැලසුම් වලට බොහෝ විට අර්ථවත් සහ කල් පවත්නා බලපෑම් සාක්ෂාත් කර ගැනීම සඳහා බහු-ආංශික ප්‍රවේශයක් සහ දිගු කාලීන වූ තිරසාර ආයෝජනයක් අවශ්‍ය වේ.

කේ.බී. ධර්මප්‍රිය,

සංවර්ධන නිලධාරී,

ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය.

# 09. ග්‍රාමීය සංවර්ධනය සහ ආහාර සුරක්ෂිතතාව ප්‍රවර්ධනය කිරීම

ප්‍රදීප් ලංකාපෙල

ආහාර සුරක්ෂිතතාවය සහජයෙන්ම නිරීක්ෂණය කළ නොහැකි අතර නිර්වචනය කිරීමට අපහසුය, නමුත් සහජයෙන්ම සහ උපකරණ වශයෙන් වැදගත් වේ. මිනිසුන්ට ආහාර මගින් සපයනු ලබන පෝෂ්‍ය පදාර්ථ සඳහා භෞතික විද්‍යාත්මක අවශ්‍යතාවයක් ඇත. එබැවින් කාර්ය සාධනය සහ යහපැවැත්ම සඳහා ආහාර තීරණාත්මක ආදානයකි. එබැවින් බොහෝ සංවර්ධන වැඩසටහන්, ව්‍යාපෘති සහ ප්‍රතිපත්තිවලට ආහාර සුරක්ෂිතතා අරමුණු ඇතුළත් වේ. නමුත් ආහාර එහි භෞතික විද්‍යාත්මක අවශ්‍යතාවයට අමතරව සතුට ගෙන දෙන ප්‍රභවයකි. ආහාර සඳහා ජීව විද්‍යාත්මක අවශ්‍යතා සහ ආහාරවලින් මානසික තෘප්තිය යන දෙකම ජනගහනය අතර සහ ඇතුළත කැපී පෙනෙන ලෙස වෙනස් වන බැවින්, ආහාර සුරක්ෂිතතාව පිළිබඳ නිශ්චිත, ක්‍රියාත්මක කළ හැකි පියවරයන් හඳුනා ගැනීම අපහසුය. එපමනක් නොව, ආහාර සුරක්ෂිතතාවය පිළිබඳ සංකල්පය වර්තමාන පෝෂණ තත්ත්වයට වඩා වැඩි යමක් ඇතුළත් වන අතර, ප්‍රමාණවත් සහ සුදුසු ආහාර සඳහා කෙනෙකුගේ ප්‍රවේශයේ අනාගත බාධාවන්ට ගොදුරු වීමේ අවදානම ග්‍රහණය කර ගනී (Barrett 2002). ආහාර සුරක්ෂිතතාවයේ මෙම ඉදිරි දැක්ම, අවිනිශ්චිතභාවය පදනම් කරගත් මානයක් සංකල්පයට තවත් සංකීර්ණත්වයක් එක් කරයි.

ආසියා සහ පැසිෆික් කලාපයේ දරිද්‍රතාවය පැතිරී ඇත, විශේෂයෙන් දුප්පතුන් කෘෂිකර්මාන්තය මත විශාල වශයෙන් යැපෙන ග්‍රාමීය ප්‍රදේශවල. මෙම කලාපය ලොව විශාලතම කුසගින්නෙන් පෙළෙන සහ මන්දපෝෂණයෙන් පෙළෙන පුද්ගලයින්ගේ නිවහන වේ-ලෝකයේ කුසගින්නෙන් තුනෙන් දෙකක් ජීවත් වන්නේ ADB හි සංවර්ධනය වෙමින් පවතින සාමාජික රටවල (DMC) ය.

විශේෂයෙන්ම ශීඝ්‍ර ජනගහන වර්ධනය, අඩුවන ජල සැපයුම සහ නරක අතට හැරෙන පරිසරය වැනි විවිධ සාධක ඒවා උග්‍ර කරන සහ සංයෝග කරන බැවින් මෙම උත්සුකයන් සඳහා ප්‍රතිචාර වහා අවශ්‍ය වේ. මීට අමතරව, නව තාක්ෂණයන් රැකියා අංශයෙන් ඉවතට මාරු කරමින්, රටවල් 36 න් 34 ක සමස්ත රැකියාවලින් කෘෂිකර්මාන්තයේ කොටස අඩු කරයි. ADB, එහි හවුල්කරුවන් සමඟ ග්‍රාමීය සංවර්ධනය සහ ආහාර සුරක්ෂිතතාව ප්‍රවර්ධනය කරන ව්‍යාපෘති හරහා මෙම ගැටළු වලට විසඳුම් ලබා දුන්නේය.

ADB හි උපායමාර්ගය 2030 ග්‍රාමීය සංවර්ධනය සහ ආහාර සුරක්ෂිතතාව වර්ධනයේ ධාවකයක් ලෙස අවධාරණය කරන අතර ගොවිපල නිෂ්පාදනය වැඩි කරන සහ ප්‍රමාණවත් ආහාර සැපයුමක් සහතික කරන ව්‍යාපෘති හරහා ඒවා පුළුල් ලෙස ප්‍රවර්ධනය කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කරයි. හවුල්කාරිත්වයන්ට තිරසාර කෘෂිකර්මාන්තයට සහ ආහාර සුරක්ෂිතතාවයට ඇති බාධක බිඳ දමන ව්‍යාපෘති උත්ප්‍රේරණය කිරීමට, පුළුල් කිරීමට සහ වේගවත් කිරීමට හැකිය.

**කෘෂිකාර්මික අංශය සඳහා සම මූල්‍යකරණය**

2018 දී, සහයෝගීතා හවුල්කාරිත්වයන් හරහා ග්‍රාමීය සංවර්ධනය සහ ආහාර සුරක්ෂිතතාව පිළිබඳ ව්‍යාපෘති පුළුල් කිරීමට ADB සමත් විය. කෘෂිකර්මාන්තයේ 2018 සඳහා ස්වෛරී ණය සහ ප්‍රදාන ව්‍යාපෘති 14ක් සඳහා ඩොලර් මිලියන 170 දක්වා ළඟා විය. 2018 දී අංශය සඳහා ඉහළම සහයෝගිතාකරුවන් වූයේ හරිත දේශගුණික අරමුදල වන අතර එය ටජිකිස්තානයේ එක් ව්‍යාපෘතියක් සඳහා ඩොලර් මිලියන 45 ක් සහ කාම්බෝජයේ තවත් ව්‍යාපෘතියක් සඳහා මුදල් යෙදවීය. ඉන් පසුව මියන්මාරයේ ව්‍යාපෘති දෙකක් සඳහා ඩොලර් මිලියන 22 ක සහනාධාරයක් ලබා දුන් ගෝලීය කෘෂිකර්ම සහ ආහාර සුරක්ෂිතතා වැඩසටහන. තෙවනුව, 2018 දී ව්‍යාපෘති පහක් සඳහා සම මූල්‍යකරණය කළ දරිද්‍රතාවය අඩු කිරීම සඳහා වූ ජපන් අරමුදල (JFPR).

ග්‍රාමීය සංවර්ධනය සහ ආහාර සුරක්ෂිතතාව ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රමුඛත්වය දෙන ADB හි උපාය මාර්ග 2030 ඔවුන්ගේ මුලපිරීම් ඉහළ නැංවීය. කෘෂිකර්මාන්තයේ 2018 හි සහයෝගීතා ව්‍යාපෘති, ගොවිපළ ඔරොත්තු දෙන සහ ඵලදායී කරන ව්‍යාපෘති හරහා ග්‍රාමීය දරිද්‍රතාවය සහ ආහාර අනාරක්ෂිත බව අවසන් කිරීමේ එහි මෙහෙවර සෙමෙන් සාක්ෂාත් කර ගැනීමට ADB හට උපකාර කර ඇත.

**හවුල් ව්‍යාපාර මගින් ග්‍රාමීය දරිද්‍රතාවය තුරන් කළ හැක**

සමුපකාර හවුල්කාරිත්වයන් ගොවිපල සිට වෙළඳපොළ මාර්ග, වාරිමාර්ග, ගංවතුර පාලනය, අලෙවිකරණය, සැකසුම් සහ ගබඩා පහසුකම් වැනි ඇතුළත් යටිතල පහසුකම් ආයෝජන උත්තේජනය කිරීමට සහ පරිමාණය කිරීමට හැකිය. මෙම ආයෝජන කෘෂිකාර්මික අංශය කාර්යක්ෂම හා නවීන බවට පත් කරනවා පමණක් නොවේ; ව්‍යාපෘති ප්‍රතිලාභ සහ බලපෑම ග්‍රාමීය දුප්පතුන් වෙත ළඟා වන බව ද ඔවුහු සහතික කරති. ආහාර හා කෘෂිකර්ම සංවිධානය විසින් කරන ලද අධ්‍යයනයකට අනුව, කෘෂිකර්මාන්තයේ ආයෝජන විශේෂයෙන් දුප්පත්ම ජනතාව අතර දරිද්‍රතාවය අවම කිරීමට ඵලදායී ක්‍රමයකි.

2018 දී, ADB, මහා මීකොං උප කලාපයේ සහ අනෙකුත් විශේෂිත ආසියානු රටවල ව්‍යාපෘති සකස් කිරීම සඳහා සහයෝගිතා අරමුදල සමඟ එක්ව, ගංගා ද්‍රෝණි හයක ගංවතුර අවදානම අවම කිරීමට පිලිපීනයට උපකාර කිරීම අරමුණු කරගත් ඒකාබද්ධ ගංවතුර අවදානම් කළමනාකරණ අංශයේ ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. ගංවතුර රඳවා තබා ගැනීම, හැරවුම් නාලිකා සහ ගංගා නාලිකා පෙළගැස්වීම් වැනි යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සහ ගොඩනැගීම ව්‍යාපෘතියේ අරමුණයි. මෙවැනි ව්‍යාපෘති ගංවතුර ආරක්ෂණ ව්‍යුහයන් ඉදි කිරීම තුළින් ගංවතුර කළමනාකරණය වැඩිදියුණු කිරීම පමණක් නොවේ; ඔවුන් ග්‍රාමීය ජනතාවගේ ජීවනෝපාය ද ආරක්ෂා කරයි.

**හවුල්කාරිත්වයන් ආහාර සුරක්ෂිතතාව සහතික කිරීමට උපකාරී වේ**

ආසියාවේ බොහෝ ග්‍රාමීය ප්‍රදේශවල ඵලදායිතාව අඩු වීමට ප්‍රධාන හේතුවක් වන්නේ වාරිමාර්ග හිඟයයි. කලාපයේ මිරිදිය ජලයෙන් 80%ක් වාරි කෘෂිකර්මාන්තය සඳහා භාවිතා වුවද, වාරි කාර්යක්ෂමතාව තවමත් 37% ක අඩු සාමාන්‍ය මට්ටමක පවතී. එපමණක් නොව, තරඟකාරී ඉල්ලීම් සහ නියාමනය නොකළ භාවිතය හේතුවෙන් භූගත ජලධර වේගයෙන් ක්ෂය වෙමින් පවතී.

ADB, එහි හවුල්කරුවන්ගේ සහාය ඇතිව, ඵලදායිතාව වැඩි දියුණු කිරීම සහ ආහාර සැපයීම සහතික කිරීම සඳහා 2018 දී වාරිමාර්ග ව්‍යාපෘති කිහිපයක් ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපෘති වලින් එකක් වන්නේ පකිස්ථානයේ බලුකිස්තාන් ජල සම්පත් සංවර්ධන අංශයේ ව්‍යාපෘතිය වන අතර එය රටේ හදිසි ග්‍රාමීය ගැටළු වලට විසඳුම් සපයයි:

ජල හිඟය, නිරන්තර නියඟය සහ දුර්වල කෘෂිකාර්මික භාවිතයන්. ව්‍යාපෘතිය අවසන් වූ පසු, රට තුළ ගොවිපල පහසුකම් ශක්තිමත් කිරීමට, වාරිමාර්ග වැඩිදියුණු කිරීමට සහ කෘෂිකාර්මික නිෂ්පාදනය වැඩි කිරීමට උපකාරී වේ.

**හවුල්කාරිත්වයන් ගොවිපල ඔරොත්තු දීමට උපකාරී වේ**

දේශගුණික විපර්යාස කෘෂිකර්මාන්තයට සහ ආහාර සැපයුමට දැඩි ලෙස බලපායි. 2050 වන විට දේශගුණික විපර්යාස හේතුවෙන් වාරි සහල් නිෂ්පාදනය 45% කින් අඩු වනු ඇතැයි පුරෝකථනය කර ඇත. උෂ්ණත්වය ඉහළ යාම තිරිඟු සහ සෝයා බෝංචි වැනි භෝග වලට සෘණාත්මක ලෙස බලපානු ඇති බව ඇස්තමේන්තු පෙන්වා දෙයි, එය පිළිවෙලින් 32%-44% සහ 9%-18% කින් ඒවායේ නිමැවුම්වල දැඩි පහත වැටීමක් ඇති කරයි. කුඩා ගොවීන් දේශගුණික විපර්යාස සහ ආන්තික කාලගුණික සිදුවීම්වල ප්‍රහාරයට විශේෂයෙන් ගොදුරු වනු ඇත.

ගොවීන් සහ ඔවුන්ගේ ගොවිපල ප්‍රත්‍යස්ථ බවට පත් කිරීම ADB හි ප්‍රධාන ඉලක්කයක් වන අතර, එහි 2030 උපායමාර්ගයේ අවධාරණය කර ඇත. 2018 දී, තාක්ෂණික සහාය හරහා, ඉන්දුනීසියාවේ, ඉන්දුනීසියාවේ, ටිමෝර්-ලෙස්ටේ හරහා කුඩා තේ වතු හිමියන් 20,000 කට ධාරිතා ගොඩනැගීමේ සහාය ලබා දීමට ADB සමත් විය. නම්, සහ පැපුවා නිව් ගිනියාව. ඔලම් ඉන්ටර්නැෂනල් ලිමිටඩ්: ඇතුළත්, තිරසාර, සහ සම්බන්ධිත කෝපි වටිනාකම් දාමයේ තාක්ෂණික සහාය ගොවීන්ට ජාත්‍යන්තර සහතික කිරීමේ ප්‍රමිතීන් සපුරාලීමට සහ ඔවුන්ගේ බෝගවල ඵලදායිතාව සහ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමට උපකාරී වේ. දේශගුණික විපර්යාසවල අහිතකර ප්‍රතිවිපාකවලට සාර්ථකව මුහුණ දීමට වඩා හොඳින් සූදානම් වීමට මෙම ගොවීන්ට සහාය වේ.

**හවුල්කාරිත්වය ඵලදායිතාව වැඩි කිරීමට උපකාරී වේ**

ග්‍රාමීය සංවර්ධනය සහ ආහාර සුරක්ෂිතතාව ප්‍රවර්ධනය කිරීම සඳහා ගොවිපල සහ ගොවි නොවන ආදායම් ඉහළ නැංවීම සහ උසස් තාක්ෂණික ක්‍රම සහ දේශගුණික බුද්ධිමත් කෘෂිකාර්මික භාවිතයන් ප්‍රවර්ධනය කිරීම ද ඇතුළත් වේ. කාම්බෝජයේ දේශගුණික හිතකාමී කෘෂි ව්‍යාපාර අගය දාම අංශයේ ව්‍යාපෘතිය හරහා මේවා කිරීමට ADB සමත් විය. මෙම ව්‍යාපෘතිය මඟින් රටෙහි තීරණාත්මක කෘෂිකාර්මික යටිතල පහසුකම්වල දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීම අරමුණු කර ඇති අතර ගොවීන්ට සහල්, බඩ ඉරිඟු, මඤ්ඤොක්කා සහ අඹ නිෂ්පාදනය වාණිජකරණය කිරීමට සමගාමීව උපකාර කරයි. ව්‍යාපෘතියේ අරමුණ වන්නේ රට තුළ දේශගුණික ස්මාර්ට් කෘෂිකර්මාන්තය ආරම්භ කිරීමයි. මෙමගින් බෝග ඵලදායිතාව සහ විවිධාංගීකරණය විශාල ලෙස වැඩි වන අතර සූර්ය හා ජෛව බලශක්ති භාවිතය ප්‍රවර්ධනය කරනු ඇත. මෙම මුලපිරීම ආහාර සුරක්ෂිතතාව සහතික කිරීමට පමණක් නොව, ගොවීන්ගේ ආදායම් ඉහළ නැංවීමට ද උපකාරී වනු ඇත.

**නිදන්ගත ගැටලුවක් විසඳීම**

කලාපයේ ග්‍රාමීය දරිද්‍රතාවය නිරන්තර ගැටලුවක් වී ඇත. ආසියාවේ ප්‍රගතිය කරා යන ගමනේදී ග්‍රාමීය දිළිඳු ජනතාව පසුබැස නොයෑම සහතික කිරීම සඳහා පුළුල් ප්‍රවේශයක් අවශ්‍ය වේ. ග්‍රාමීය ගැටලු සඳහා විසඳුම් සඳහා හවුල්කාරිත්වයන් අවශ්‍ය වේ - ජනගහනය වැඩි වන විට සහ ආදායම් අසමානතාවය පුළුල් වන විට අවශ්‍යතාවය විශාල වන අතර එය දිගටම වර්ධනය වේ. ADB, එහි හවුල්කරුවන් සමඟ එක්ව, ගොවීන්ගේ සම්බන්ධතාවය වැඩිදියුණු කරන, ආදායම් වැඩි කරන සහ ආසියා සහ පැසිෆික් කලාපයේ ආහාර සුරක්ෂිතතාව සහ ප්‍රමාණවත් බව

වැඩි දියුණු කරන ව්‍යාපෘති හරහා ග්‍රාමීය ප්‍රගතිය සහ ආහාර සුරක්ෂිතතාව සඳහා වැඩ කිරීමෙන් මෙම හිඩැස පිරවීමට අදහස් කරයි.

පරිවර්තනය :

ආසියානු සංවර්ධන බැංකු ව්‍යාපෘති ඇසුරෙන් ( Boosting Strategy 2030 - උපාය මාර්ග වැඩි කිරීම )

ප්‍රදීප් ලංකාපෙල,

සංවර්ධන නිලධාරි ( පුහුණු නිලධාරි),

ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය.

# 10. ලංකාවේ ග්‍රාමීය පුනරුදය (Rural Renaissance)සඳහා කෘෂිකර්මාන්තය කෙසේ දායක කරගත හැකිද

එස්. එම්. යූ. බී. සමරකෝන්

*දහසක් මහා වැව් බැන්දේ නුඹයි පුතේ - සිගිරි ගලේ කවිලීවේ නුඹයි පුතේ*

*නඟුලෙන් එදා රජ කෙරුවේ නුඹයි පුතේ - පැදුරේ මෙදා නිදියන්නේ නුඹයි පුතේ...*

විශාරද වික්ටර් රත්නායක මහතා ගායනා කරන මේ ගී පදවැල දෙසවනෙහි වැකෙත්ම සිතට නැගෙන අභිමානය පැරකුම්බා රජ දවස අප රටේ පැවති අතීත ශ්‍රී විභූතිය කරා ඇදියයි.

වැවයි - දාගැබයි, ගමයි - පංසලයි අතර තිබූ සුසංයෝගය එදා පැවති ආහාරවලින් ස්වයංපෝෂිත වූ සදාචාරාත්මක සංවර්ධනය කියාපෑහ.

මෙහිදී අප පුනරුදය ( Renaissance) යන වචනයෙහි අර්ථය තේරුම් ගත යුතුවේ.පුනරුදය යන්නෙහි නැවත ඉපදීම (Rebirth ) යන අරුත ඇතතේය. මෙය පළමුව ඉතාලියෙන් ඇරඹී බටහිර යුරෝපය පුරා පැතිරිණි. මෙය පළමුව සංස්කෘතික ප්‍රවාහයක් ලෙස 14 වන ශතවර්ෂයේ දී ඇරඹිණි. මෙය පසුව සමාජ තලයේ වෙනස්කම් රැසක් ඇති කරන ලදි.

'පුනරුද මිනිසුන්' යන නාමය ලියනාඩෝ ඩාවින්චි හා මයිකල් ආන්ජලෝ යන කලාකරුවන් විසින් පට බැඳිනි. සංස්කෘතික පුනර්ජීවයේ කැපී පෙනෙන මං සලකුණු ලෙස නැවතත් දාර්ශනික මූලාශ්‍ර ඉගෙනීමට යෑම චිත්‍ර කලාව, අධ්‍යාපන පුනරුදය දැක්විය හැකිය. පසුව මෙය කලාකාමී පුනරුදයක සිට බුද්ධිමය පුනරුදයකට තාක්ෂණික විප්ලවයකට කෘෂිකර්මාන්තයේ දැවැන්ත පෙර උයනට හේතු විය. බොහෝ මිනිසුන් තම ඉඩම් හැර නගරයේ පදිංචි වූහ.

පුනරුදයේ උච්චතම අවස්ථාව උදාවූයේ 15 වන ශතවර්ෂයේ සිදු වූ සංසිද්ධියත් සමඟය. එනම් ඔටෝමාන් තුර්කිවරුන් විසින් කොන්ස්තන්තිනෝපලය බිඳ දැමීම හා විශ්වවිද්‍යාලය වසා දැමීම නිසා දහස් ගණන් ග්‍රීක උගතුන් ඉතාලියට පලා ගියෝය. ඔවුන් ඒ සමග ම විශාල වශයෙන් ග්‍රීක රෝම සාහිත්‍ය නීති පොත් ඉතාලියට ගෙන ගියහ.

මධ්‍යකාලීන චින්තනයට හා ක්‍රියාමාර්ගයන්ට දැඩි පහරක් පුනරුදය හේතුවෙන් එල්ල විණි. ඒ සමගම නව යුගය උදාවිණි.

මේ අනුව ග්‍රාමීය පුනරුදය මඟින් ගමෙහි විප්ලවීය වෙනසක් සිදුවිය යුතු වේ.නව මාවතක් සොයාගැනීම වෙනුවෙන් පිබිදෙන ජන නැගිටීමක් විප්ලවයක් ලෙස සරලව හැඳින්විය හැකිය.මානව ඉතිහාසය පුරා නොයෙක් ආකාරයේ විප්ලව ගැන අප අසා ඇති අතර ප්‍රධාන වශයෙන් ප්‍රංශ විප්ලවය(1789-1799),රුසියානු විප්ලවය(1917) සහ

ඇමරිකානු විප්ලවය(1775) මේ අතරින් වැදගත් වේ.මේ අනුව ග්‍රාමීය සංවර්ධනය උදෙසා ග්‍රාමීය ජනතාවගේ අවධිවීම /නැගිටීම ග්‍රාමීය පුනරුදය තුළින් සිදුවිය යුතුය.

එසේම කෘෂිකර්මාන්තය යනු කුමක්දැයි අප අවබෝධ කරගතයුතු අතර එය අපේ දිවිපැවැත්මට වඩාත් සමීප ගැමිදිවිය හා වඩාත් බැදි ඇති දෙයකි.

ඔක්ස්ෆර්ඩ් ඉංග්‍රීසි ශබ්දකෝෂයට අනුව කෘෂිකර්මාන්තය යනු,

“The practice of cultivating the soil, growing crops, or raising livestock for human use, including the production of food, feed, fiber, fuel, or other useful products. Also known as farming.”

එනම් පසේ බෝග වගාකිරීමත්,මානවයාගේ ප්‍රයෝජනය සඳහා ආහාර, කෑම, කෙදි වර්ග, ඉන්ධන හෝ අනෙකුත් ප්‍රයෝජනවත් දෑ නිෂ්පාදනය සඳහා සත්ත්වපාලන කටයුතු කිරීමත්, ගොවිතැන් කිරීම නැතහොත් කෘෂිකර්මාන්තය ලෙසට විග්‍රහකර ඇත.

"කෘෂිකර්මාන්තය" යන්නෙහි නිවැරදි වූ අර්ථකථනයට අනුව, භූමි වගා කිරීම, අස්වනු නෙළීම, සැලසුම් සහගත ජල සම්පාදනය යනාදි සියළු දෑ එයින් අර්ථ ගැන්වේ.

"කෘෂිකාර්මික නිෂ්පාදකයා"යන වදන මුලින්ම යොදාගෙන ඇත්තේ ක්‍රි.පූ 5,500 දී පමණ විසූ "සුමේරියානු" ජන කොටස්වලටයි. මේ ආකාරයෙන් ඔවුහු ගොවිතැන් කටයුතුවල නියැළීම නිසා අහරින් ස්වයංපෝෂිත විය.

කෘෂිකර්මය, සත්ව පාලනය, උද්‍යාන විද්‍යාව, පස සහ කෘෂි නිෂ්පාදන විද්‍යාව යනාදී බොහෝ විෂයයන් ‘කෘෂිකර්මය’ යන්නට ඇතුළත් වේ. මෙම සෑම අංගයක්ම තව දුරටත් කොටස් කළ හැක. උදාහරණයක් වශයෙන් සත්ව පාලනය යන්නට ගව පට්ටි, එඬේර වෘත්තිය ඇතුළත් වේ. කෘෂි නිෂ්පාදනවලට ආහාර (එළවළු, පලතුරු, ධාන්‍යය වර්ග), කෙඳි වර්ග (කපු, ලොම්, සිල්ක්, හණ), ඉන්ධන (මීතේන්, එතනෝල්, ජෛව ඩීසල්), කැපූ මල්, විසිතුරු පැළෑටි, මල්, නිවර්තන කලාපීය මසුන් සහ සුරතල්ව ඇති කරන පක්ෂීන් නීත්‍යානුකූල හෝ නීත්‍යානුකූල නොවන මත්ද්‍රව්‍යය (drugs) සහ තවත් වැදගත් ද්‍රව්‍යයක් වූ දුම්මලද ඇතුළත් වේ. මෑතදී ප්ලාස්ටික් මෙන්ම ඖෂධ වර්ග නිපදවීම සඳහා ද වගාවන් කිරීමේ සැලසුම් සකස් කර ඇත.

කෘෂිකර්මාන්තයේ දියුණුව ලෝක ව්‍යාප්ත සමාජ - ආර්ථික වෙනස්වීම් කෙරෙහි වැදගත් සාධකයක් වී තිබීම හේතුවෙන් කෘෂිකර්මයෙහි ඉතිහාසය මානව ඉතිහාසයේ ප්‍රධාන පැති කඩකි. මිනිසා දඩයම් කරමින් ආහාර ද්‍රව්‍යය එක් රැස්කරමින් ගත කළ යුගයේ මහා පරිමාණ ලෙස ධනය එකතු කිරීම හෝ යුධ කටයුතු සඳහා විශේෂ දැනුමක් අවශ්‍යය නොවීම. එහෙත් ගොවියා තම පවුලට අවශ්‍යය ප්‍රමාණයට වඩා වැඩියෙන් ආහාර නිපදවීමට පටන් ගත් කල්හි අනිකුත් ගෝත්‍ර/ ගම්/ නගර/ රාජ්‍යයන්/ ජාතීන්/ අධි රාජ්‍යයන් වැනි අනෙකුත් කොටස්වලට ආහාර ඉපැයීමට වඩා වෙනස් කාර්යයන් කිරීමට නිදහස ලැබුනේය. ශිෂ්ඨාචාරයේ දියුණුව සඳහා කෘෂි කර්මාන්තය අවශ්‍යය බව ජරේඩ් ඩයමන්ඩ් කිවූහ.

2006 වන විට ලෝකයේ කම්කරුවන්ගෙන් 36% කෘෂිකර්මාන්තයේ නියැලී ඇති බව ඇස්තමේන්තු කර තිබුණි.කාර්මීකරණය ඇරඹීමත් සමග කෘෂිකර්මාන්තයෙහි වැදගත්කම අඩු විය. 2006 වර්ෂය වන විට ආර්ථික අංශය ලෝක ජනගහනයෙන් වැඩි ප්‍රමාණයක් සේවයට ගැනීම නිසා ඉතිහාසයේ ප්‍රථම වතාවට සේවා අංශය

කෘෂිකර්මය අභිබවා ගියේය. ලෝක ජනගහනයෙන් තුනෙන් එකක් කෘෂිකර්මාන්ත අංශයෙහි සේවය කළා වුවද ලෝක දළ නිෂ්පාදනයේ කෘෂි නිෂ්පාදනවලට ඇත්තේ 5% ට අඩු ප්‍රතිශතයකි.

ලෝකයේ පුරාණ කෘෂිකර්මාන්තය පිළිබඳ විමසා බැලීමේදී ලෝකඩ යුගය වන විට, එදිනෙදා ආහාර වේලේ අංගයක් ලෙස වනාන්තරයෙන් සපයාගත් ආහාරවලට හිමිවූයේ අඩු වැදගත්කමකි. "කෘෂිකර්මාන්තය" යන්නෙහි නිවැරදි වූ අර්ථකථනයට අනුව, භූමි වගා කිරීම, අස්වනු නෙළීම, සැලසුම් සහගත ජල සම්පාදනය යනාදි සියළු දෑ එයින් අර්ථ ගැන්වේ. "කෘෂිකාර්මික නිෂ්පාදකයා" යන වදන මුලින්ම යොදාගෙන ඇත්තේ ක්‍රි.පූ 5,500 දී පමණ විසූ "සුමේරියානු" ජන කොටස්වලයි. මේ ආකාරයෙන් ඔවුහු ගොවිතැන් කටයුතුවල නියැළීම නිසා අහරින් ස්වයංපෝෂිත විය. දඩයමින් සහ සමූහ ඒක රාශී වීම් මඟින් ලද ආහාර ප්‍රමාණයට වඩා වැඩි ජනගහණයකට පමණට ගොවිතැනින් ආහාර නිපදවිණි. මෙහිදී නිෂ්පාදන අතිරික්තයක් ඇතිවිය. එම අස්වැන්න අවාර සමයේදී පරිභෝජනය, විකිණීම හෝ හුවමාරුව ආදියට ද යෙදවිණි. කෘෂිකාර්මික කටයුතුවලින් වඩා වැඩි ජනගහනයක් පෝෂණය කිරීමට ගොවීන්ට හැකිවිය.



ආදි සුමේරියානු ගොවිතැනේ චිත්‍රයක්

ශ්‍රී ලංකාව ගත් කළ අතීතයේ සිටම දියුණු කෘෂි ආර්ථිකයකට හිමිකම් කියන රටකි.ශ්‍රී ලංකාවේ අතීතයේ පැවතියේ යැපුම් කෘෂිකර්මාන්තයකි. නමුත් වර්තමානය වන විට කෘෂිකර්මය ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදිය හැකි ය.එනම්,

1.යැපුම් කෘෂිකර්මාන්තය ( Subsistence Agriculture)

2 .වාණිජ කෘෂිකර්මාන්තය ( Commercial Agriculture)

අතීතයේ පැවති ස්වයංපෝෂිත ගැමි ආර්ථිකය යැපුම් කෘෂිකර්මාන්තය ලෙස හැඳින්වේ. එදා පවුලේ සියලුම අහාර අවශ්‍යතා කුඹුරෙන් හා ගෙවත්තෙන් සපයාගත් අතර තමනට නැති අනිකුත් දෑ අසල්වාසීන්ගෙන් හා ඒවා නිපදවන්නන්ගෙන් හුවමාරු කරගෙන ජීවත් වූහ. මෙය භාණ්ඩ හුවමාරු ක්‍රමය (Barter system)ලෙස හැඳින්වේ. වර්තමානය වනවිට අවශ්‍යතා සංකීර්ණ වීමත්, කෘෂිකර්මාන්තයේ දියුණුවත් සමග මෙම යැපුම් කෘෂිකර්මාන්තය සමාජයෙන් වියැකී ගොස් වාණිජ කෘෂිකර්මාන්තය බිහි වූ අතර මෙය විවිධ ක්ෂේත්‍ර ඔස්සේ පැතිර පවතී. මිරිදිය හා කරදිය ධීවර කර්මාන්තය,ගොවිපොළ සත්ව පාලනය,බෝග වගාව එම ක්ෂේත්‍ර අතර මුල් තැන ගනී. ශ්‍රී ලංකාව විශාල පරාසයක ව්‍යාප්තව පවත්නා විවිධාකාර වූ බෝග වගා කිරීම සඳහා යෝග්‍ය වූ පාරිසරික තත්ත්වයන්ගෙන් සමන්විත වෙයි. ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තයේ ප්‍රධානතම බෝගය වන්නේ වී වගාවයි.

අප රටේ ජන ව්‍යාප්තිය නාගරික, ග්‍රාමීය හා වතු ලෙස අංශ තුනක් යටතේ බෙදා දැක්විය දැක්විය හැකි අතර රටේ බහුතර ජනතාවක් ජීවත් වනුයේ ග්‍රාමීය අංශයේය. 2012 වර්ෂයේ සිදුකරන ලද ජන සංගණනයට අනුව ග්‍රාමීය ජනගහනය 77.4% ක් වන බව ශ්‍රී ලංකා මහ බැංකුවේ 2023 සමාජ ආර්ථික දත්ත වාර්තාව පෙන්වා දෙයි.

අතීතයේ සිට අප රට හැදින්වූයේ කෘෂිකාර්මික රටක් වශයෙන් වුවත්, වර්තමානයේ එසේ හැදින්වීම නිවැරදි නොවන බව ආර්ථික විශ්ලෙෂණය අනුව පෙනේ.1978 හඳුන්වා දුන් විවෘත ආර්ථික ප්‍රතිපත්තියත් සමග විදේශ රටවලින් විශාල ලෙස කෘෂිකාර්මික භාණ්ඩ ආනයනය කිරීමත් සමග දේශීය කෘෂිකර්මාන්තයට විශාල අහිතකර බලපෑමක් එල්ලවිය. ශ්‍රී ලංකා මහබැංකු වාර්තාව පෙන්වන පරිදි 2023 වර්ෂය වනවිට දළදේශීය නිෂ්පාදිතයට (Gross Domestic Production-GDP) කෘෂිකර්මාන්තයේ දායකත්වය 7.9% කි. මෙම අගය 2010 වර්ෂයේදී 8.5% ක් වූ අතර 1970 වර්ෂයේ දළදේශීය නිෂ්පාදිතයට කෘෂි අංශයේ දායකත්වය 28% ක් තරම් ඉහල අගයක පැවතිණි. ඒ අනුව පෙනෙනුයේ අප රටේ ආර්ථිකයට කෘෂි අංශයේ දායකත්වය ක්‍රමිකව අඩුවන බවයි.එසේ වුවත් අප රටේ ආර්ථිකය කෘෂිකාර්මික, කර්මික හා සේවා වශයෙන් ප්‍රධාන අංශ තුනක් නියෝජනය කරනු ලබන අතර ග්‍රාමීය ජනතාවගේ ආර්ථිකයට සැලකිය යුතු දායකත්වයක් කෘෂිකාර්මික අංශය විසින් ලබාදේ. වර්තමානයේදී රටේ දළ දේශීය නිෂ්පාදිතයෙන් වැඩිම දායකත්වය ලබාදෙනුයේ සේවා අංශය වන අතර කාර්මික අංශය හා කෘෂිකාර්මික අංශය සඳහා පිළිවෙලින් දෙවන හා තෙවන තැන හිමිවේ. ඒ අනුව අප රට වර්තමානයේ සේවා ආර්ථිකයක් බවට පත්වී ඇත. සේවා නියුක්ති අනුපාතය ගෙන බැලීමේදී 1970 වසරේ රටේ සමස්ථ සේවා නියුක්තියෙන් 53% ක් කෘෂි කේෂත්‍රෙය් රැකියාවල නියුක්ත වී සිටි අතර 2010 වන විට එය 33% දක්වාද, 2023 වර්ෂය වනවිට එය 26.1% දක්වාද පහලට වැටී ඇති බවයි. එම වසරේ වැඩිම සේවා නියුක්තියක් එනම් 48.4% ක් සේවා අංශයේ රැකියාවල නියුතුව සිටින අතර කර්මාන්ත අංශයේ 25.5% ක් නියෝජනය කරන බව 2023 ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව පෙන්වා දෙයි.

2022 මහ බැංකු වාර්තාව පෙන්වා දෙන පරිදි එම වසරේ කෘෂිකාර්මික නිෂ්පාදන පරිමා දර්ශකය 19.4% ක පහල යාමක් දක්නට ලැබෙන නමුත් 2021 වසරේ දක්නට ඇත්තේ එම දර්ශකයේ 2.1% ක වැඩි වීමකී.මේ අනුව අපට පැහැදිලි වන්නේ කෘෂි කේෂත්‍රයේ කඩාවැටීමකි. 2022 වර්ෂයේ පොහොර හා අනෙකුත් කෘෂිකාර්මික යෙදවුම්වල පැවති උග්‍ර හිඟය, නිෂ්පාදන පිරිවැය ඉහලයාම, ඉන්ධන සැපයුමේ පැවති දුර්වලතා ආදී කරුණු නිසා එකී කඩාවැටීම සිදු වූ බව එම වාර්තාව පෙන්වා දෙයි.

මේ අනුව ජාතික නිෂ්පාදිතයට කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ දායකත්වය ක්‍රමික පහළයාමක් දක්නට ලැබුනත් වර්තමානයේදීත් අප රටේ ජනතාවගෙන් සැලකිය යුතු ප්‍රමාණයක් කෘෂිකර්මාන්තය තම ප්‍රධාන ජීවනෝපාය ලෙස තෝරාගෙන ඇති අතර එහිදි වී ගොවිතැන, එළවළු වගාව හා ගෙවතු වගාව වැදගත් වේ. ශ්‍රී ලාංකිකයින්ගේ ප්‍රධාන ආහාරය බත් වන්නා සේ ප්‍රධාන කෘෂිබෝගය වී වගාවයි. බත් ආහාරයට ගන්නේ එලවළු සමග වන හෙයින් එලවළු වගාවද වී වගාව මෙන්ම ගහට පොත්ත සේ වැදගත් තැනක් උසුලයි. ආර්ථික විද්‍යා විෂයේදී විග්‍රහ කරනු ලබන අනුපූරක භාණ්ඩ යටතට බත්-එලවළු සුසංයෝගය හඳුන්වාදිය හැකිය.

සංවර්ධනය යනු ආර්ථිකමය (ආදායම) අතින් ඉහළයාම පමණක් නොවේ. මේ සඳහා පුද්ගලයාගේ මෙන්ම සමස්ථ සමාජයේ මානව, සදාචාරාත්මක, දේශපාලනික, සංස්කෘතිකමය මෙන්ම ආකල්පය වශයෙන් ධනාත්මක වෙනසක්/ පරිවර්ථනයක් ඇතිවිය යුතුයි.එසේම සේවා නියුක්තිය, ආදායම් විෂමතාවය පහළයාම සිදුවිය යුතුය.

මේ අනුව ග්‍රාමීය පුනරුදය (Rural Renaissance) තිරණය කරනු ලබන ප්‍රධාන කාරණා කිහිපයකි. යටතල පහසුකම් (ප්‍රවාහනය, ජලය, විදුලිය හා සන්නිවේදනය), පාසැල්(නගරයට හා සමාන පහසුකම් ඇති), ආදායම් උත්පාදන (ආර්ථික), අවස්ථා (හොඳින් ජීවත් වීමට සෑහෙන ආදායමක් ඉපයීමට හැකි) හා නව තාක්ෂණය යන ඒවා ප්‍රධාන වේ. එසේම පරිසර සංවර්ධනය කෙරෙහිද මෙහිදී විශේෂයෙන් අවධානය යොමුකල යුතුය. මේ කරුණු මත ග්‍රාමීය ජනතාව ගමතුළ රැදෙනවාද නැතහොත් ගම අත්හැර නගරයට සංක්‍රමණය වනවාද තීරණය කරයි. දියුණු පහසුකම් ඇති නගරය හා සසඳන කල ගමතුළ විශාල රික්තයක් දක්නට ලැබෙන අතර ඒ නිසාම විශේෂයෙන් විධිමත් අධ්‍යාපනය ලැබූ නව තරුණ පරපුර ගමෙන් එළියට එයි.

මේ අනුව මා විසින් 2024 වසරේ දී ගමේ සංවර්ධනය තිරණය කරන්නා වූ ගැමියාගේ ආර්ථික බලගැන්වීමට ප්‍රබල ලෙස දායක කරගත හැකි ගොවිතැනේ ප්‍රධාන ක්ෂේත්‍ර තුනක් පිළිබඳව ගැඹුරු විග්‍රහයක් සිදු කරනලදි. ඒ අනුව ග්‍රාමීය කෘෂිකර්මාන්තයේ වර්තමාන තත්වය ( වී වගාව, එළවළු වගාව හා ගෙවතු වගා) හා එය ගමේ සංවර්ධනය උදෙසා දායක කරගත හැකි ආකාරය පිළිබඳ මධ්‍යම පළාතේ මහනුවර, නුවරඑළිය හා මාතලේ යන දිස්ත්‍රික්ක වල ගොවි කණ්ඩායම් තුනක් හා කරනු ලැබූ එක්දින වැඩමුළුවකදී කරනු ලැබූ ගැඹුරු විග්‍රහයක් තුළින් පහත ප්‍රධාන නිගමන හා යෝජනා ප්‍රමුඛතාගත කොට ඉදිරිපත් කරමි.

**නිගමන**

1. වන සත්ව හානි (ඌරා, රිලවා, වඳුරා,අලියා, ඉත්තෑයා, දඬුලේනා, මොනරා, මුවා ආදී සතුන්) නිසා වගාවට විශාල ලෙස හානි සිදුවේ.
2. ප්‍රමාණවත් තරම් ජලය නොමැතිවීම නිසා වගාකිරීමට අපහසු වේ.
3. ප්‍රවාහන හා මාර්ග පහසුකම් දුර්වල වීම.
4. ඉහල ගුණාත්වයෙන් යුතු බීජ නිසි කලට ලබාගැනීමේ අපහසුතාවය
5. ගොවිතැන සඳහා සහය සේවා සපයනු ලබන ආයතන වන ගොවිජන සේවා දෙපාර්තමේන්තුව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, විදුලිබල මණ්ඩලය, ෂිකර්ම දෙපාර්තමේන්තුව ආදී ආයතන ඒකාබද්ධ නොවී ගොවින්ට අවශ්‍ය සේවාවන් ලබා දීම.
6. කෘෂි ද්‍රව්‍ය පිළිබඳව හා ඒවා භාවිතය ( බීජ , පොහොර හා කෘමිනාශක ද්‍රව්‍ය) පිළිබඳව ඇති නොදැනුවත්කම
7. නිෂ්පාදන විකුණාගැනීමෙදී නිසි මිළක් නොලැබේ. (මේ නිසා ගමට පැමිණෙන අතරමැදියන් අඩු මුදලට නිෂ්පාදන මිළදී ගෙන ප්‍රවාහන වියදම ලෙස විශාල මුදලක් එකතු කරන නිසාම ගමේ සිට ප්‍රධාන මාර්ගයට පිවිසීමේදීම මිළ දෙගුණ වන බව ගොවීන් පවසයි)
8. කෘෂිද්‍රව්‍ය මිලදී ගැනීමෙදී නිසි තැනක් නොමැති නිසා අතරමැදියන්ගේ ගසාකෑම් වලට ලක්වේ.
9. පසේ ගුණාත්මකභාවය මැණීමට ක්‍රමයක් නොමැතිවීම හා පස සංරක්ෂණය කිරීමට වැඩපිළිවෙලක් නොමැතිවීම නිසා වගාකටයුතු වලදී සරුපස සෝදායාම විශාල ලෙස සිදුවේ.
10. නිෂ්පාදන වියදම අධික වීම.
11. ( බීජ, පොහොර හා කෘමිනාශක ද්‍රව්‍ය වියදම්, ප්‍රවාහන කුලී,ශ්‍ර මය ආදීය සඳහා)

12. ඉහත කාරණා නිසා මහත් වූ අපහසුතා හා ගැටළු මැද මෙම ජීවිකා වෘත්තිය කරගෙන බවත් මේවාට විසඳුම් ලබාදීමෙන් තම පවුලේ ආර්ථික කටයුතු වලට මහත් පිටිවහලක් ලැබෙන බවත් එය තමා ජීවත් වන ගම් ප්‍රදේශයේ දියුණුවට විශාල රුකුලක් බවත් ගොවිසංවිධාන නියෝජිතයින් පෙන්වා දෙනු ලැබීය.

මෙහිදී ගොවීන් තම වගාවන් දියුණුකර ගැනීමටත් තම ගම් ප්‍රදේශයේ සංවර්ධනය ඇතිකර ලීම සඳහාත් පහත විසඳුම් යෝජනා ඉදිරිපත් කරයි.

**යෝජනා**

1. වන සතුන්ගෙන් වගාව ආරක්ෂා කරගැනීම සඳහා ස්ථිරසාර වැඩපිළිවෙලක් රජය විසින් හඳුන්වාදීම.
2. ගොවිතැන සඳහා ජල පහසුකම් ලබාදීම හා ජලය බෙදාහැරීමේ දී නිසි ක්‍රමවේදයකට අනුව ජලය බෙදා දීම.
3. ප්‍රමිතියෙන් උසස් පලිබෝධනාශක,පොහොර හා අනෙකුත් කෘෂි උපකරණ හා ද්‍රව්‍ය මිළදී ගැනීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙලක් සකස් කරදීම.
4. රජයෙන් ලබාදෙන සහනාධාර නිසි ක්‍රමයකට ලබාදීම.
5. පොහොර භාවිතය හා කෘෂි රසායන ද්‍රව්‍යය හා භාවිතය පිළිබඳ ගොවීන් දැණුවත් කිරීම.
6. ගොවි නිෂ්පාදන අලෙවි කරගැනීමට ආර්ථික මධ්‍යස්ථානයක් ඉදිකරදීම.
7. රජය මැදිහත් වී ප්‍රවාහන පහසුකම් දියුණු කිරීම හා අනෙකුත් යටිතල පහසුකම් සංවර්ධනය කරලීම.
8. ඉහල ජලධාරා, ජල පෝෂක ප්‍රදේශ හා පස සංරක්ෂණය කර දීම.
9. මේ සඳහා රක්ෂිත කැලෑ ආරක්ෂා කිරීම, ස්වභාවික වන වගා ඇති කිරීම හා අක්කර දහස් ගණනින් වවා ඇති පස හා ජල පෝෂක ප්‍රදේශ විනාශ කරන ෆයිනස්,ටර්පන්ටයින්, යුකැලිප්ටස් වැනි වගාවන් වහාම ඉවත් කිරීම හා දේශීය ශාක වර්ග වගාකිරීමේ දීපව්‍යාප්ත වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.
10. සං චාරක පැමිණීම ප්‍රවර්ධනය කිරීම.
11. ගොවීන්ට කෘෂි තාක්ෂණය පහසුවෙන් ලබාගැනීමේ වැඩසටහන් ගම තුළ ක්‍රියාත්මක කිරීම.
12. වගාබිම්වල වාර්ෂිකව පස් පරීක්ෂා කිරීම හා පස ජීවානුහරණය කරගැනීම සඳහා පහසුකම් ඇති කිරීම.
13. ගොවි නිෂ්පාදන රැස්කර අලෙවිකිරීමේ ක්‍රමයක් ගම තුළ ඇති කිරීම (ගොවිසංවිධානය හරහා) හා ගමේ වාහනවලින්ම නිෂ්පාදන ප්‍රවාහණය කිරීමේ වැඩපිළිවෙලක් සැකසීම.
14. හරිතාගාර ඉදිකිරීම/සුළං වැටි ඉදිකිරීම.
15. ජලය රැස් කරගැනීමට පහසුකම් ඇති කිරීම.( ජල ටැංකි/පොකුණු/පතහ වැනි)
16. අතරමැදියන්ගේ ග්‍රහණය වැලැක්වීමට වැඩපිළිවෙලක් ඇති කිරීම.
17. ප්‍රමාණවත් ඉඩකඩ නොමැතිවීමඅය සඳහා නව වගා ක්‍රම හඳුන්වාදීම. ( බඳුන්වල වගා කිරීම, ජලයේ වගා කිරීම, ගා කුළුනු සෑදීම, වගා රාක්ක සැකසීම)

ආදී වශයෙන් වූ ඉතා වටිනා යෝජනා රාශියක් ගොවි නියෝජිතයින් විසින් ඉදිරිපත් කරන ලදි.

මේ අනුව අවසාන වශයෙන් කිව හැක්කේ කෘෂිකර්මාන්තයේ දියුණුව ඇතිකරලීම තුළින් ග්‍රාමීය පුනරුදයක් කරා යන ගමනේදී ගැමි ආර්ථිකයේ ආදායම් උත්පාදන මාර්ගයක් ලෙසත්,ආහාර සම්පාදනයේ ආ ආහාර සුරක්ෂිතභාවයේ (Food Security ) මූලෝපායක් ලෙසත්,ග්‍රාමීය ක්ෂේත්‍රයේ තිරසර සංවර්ධනයේ එක් උපායමාර්ගයක් ලෙසත් ගොවිතැන දායක කරගත යුතුය.

**ආශ්‍රිත ග්‍රන්ථ:**


ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව,2022,2023

ගෙවතුවගාව, ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාවය තුරන්කිරීම සඳහා වනජනාධිපති කාර්යසාධන බලකාය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම අමාත්‍යාංශය,2020.

රාජපක්ෂ නිමල්,ගෙවතු වගාවෙන් ආහාර අර්බුදය ජයගනිමු.2011

වෛද්‍ය සමන් පාලිත ජයකොඩි,තුන්වේලටම සුදුසු අති විශිෂ්ඨ ආහාරය බත්

සංඛ්‍යාන දෙපාර්තමේන්තුව,කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,පේරාදෙණිය

අන්තර්ජාල වෙබ් අඩවි



**එස්.එම්.යූ.බී.සමරකෝන්**

**පුහුණු හා පර්යේෂණ නිලධාරී,**

**ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය.**

# 11. ව්‍යවසායකත්වය මගින් ග්‍රාමීය දිළිඳුකම දුරලමු

කේ. එම්. ජී. සමරසේන

*ඉන්දීය ජාතික අරුනාවලම් මුරුගනාදම්ගේ අඩු වියදම් සනීපාරක්ෂක තුවා නිෂ්පාදන ව්‍යාපෘතියේ අත්දැකීම, අන්තර්ජාලයේ ඉංග්‍රීසි බසින් පලවූ වීඩියෝවක් ඇසුරෙන් උපුටා ගන්නා ලදී .................*

මම ආවේ දුප්පත් පවුලකින් මගේ පියා අත්යන්ත්‍ර රෙදිපිලි වියන්නෙක් මගේ මව ගොවිපොලක කම්කරු රැකියාව කළේ මම ඉගෙන ගත්තේ නවවන ශ්‍රේණිය දක්වා පමණයි. 1998 දක්වා මම ගෙදරට සීමාවූ ස්වාමිපුරුෂයෙක් එච්චරයි. මගේ වත්කම මගේ බිරිඳ ශාන්ති, මගේ අම්මා හා මම අත්උදව්කරුවෙක් ලෙස වැඩකළ මගේ කුඩා වැඩපල

1998 අවුරුද්දේ එක දවසක් මම දිවා ආහාරය අරගෙන ගෙදර විවේකයෙන් වාඩිවෙලා ඉන්නකොට මම දැක්කා මගේ බිරිඳ මොනවා හරි මගෙන් හංගාගෙන අරන් යනවා. ඉතින් මම ඇහුවා සාම්ප්‍රදායික ස්වාමිපුරුෂයා විදියට ඒ මොකක්ද ඒ කියලා . ඇය මගෙ කනට ගැහුවා වගේ කිව්වා ඒක ඔයාට වැඩක් නෑ කියලා .මම දකිනවා ඒක දුර්වර්ණ, අපිරිසිදු රෙදි කැල්ලක් බව අඩුතරමේ එහෙම එකක් මම මගේ බයිසිකලය පිහ දාන්න ගන්නේවත් නෑ මම තේරුම් ගත්තා ඒක එයාගේ ඔසප්වීම් කළමනාකරණය කර ගන්න භාවිතා කරණ අනාරක්ෂිත සනීපාරක්ෂක ක්‍රමයක් බව. මම ඇහුවා මගේ බිරිඳගෙන් ඇයි සනීපාරක්ෂක තුවා (නැප්කින්) තියෙනවනේ කියලා. ඇයි මේ වගේ අනාරක්ෂිත ක්‍රම භාවිතා කරනනේ කියලා. ඒ ගමන්ම ඇය කියනවා,මම දන්නවා සනීපාරක්ෂක තුවා තියෙනවා කියලා. ඒක රූපවාහිනියේ දකිනවා. නමුත් ,මමත් මගේ පවුලේ අනෙක් කාන්තාවනුත් සනීපාරක්ෂක තුවා පාවිච්චි කරන්න පටන් ගත්තොත් අපේ පවුලේ කිරි සඳහා යන වියදම කපාහරින්න වෙයි. මම තිගැස්සුනා. නැප්කින් භාවිතා කිරීම සහ කිරිවලට යන වියදම කපාහරින එක අතර තියෙන සම්බන්ධය මොකක්ද කියලා මම තේරුම් ගත්තා. ඒ ඒකට යන වියදම නිසා කියලා. එදාම මම කඩයකට ගියා, මම සනීපාරක්ෂක තුවා පැකට්ටුවක් ගන්න උත්සාහ කළා. මුදලාලි අහනවා,මොන වෙළඳනාමයේ එකක් ද ඕනි කියලා. කවුද වෙළඳනාම දන්නේ. මම ඇඟිල්ල දික්කරලා පැකට්ටුවක් පෙන්නුවා. රාක්කය ඇතුලේ ලස්සන පැකට්ටුවක් තිබුණා. මම ඒක මිලදීගෙන පර්යේෂණය ආරම්භ කළා.

මගේ අතට මොකක් ලැබුණත් කම්හලක අත්උදව්කරුවෙක් විදියට මගේ මොලේ ඒකේ බර කියනවා මගේ අතට ගත්ත සනීපාරක්ෂක තුවායේ බර මම හිතන්නේ ග්‍රෑම් 10 කටත් අඩුයි. දකුණු ඉන්දියාවේ මේ රෙදිපිළි නගරයේ රෙදිමෝල් 500 ක් විතර තියනවා. ඒ දවස්වල ග්‍රෑම් 10 ක කපු ටිකක් වුනේ ශත 10ක් විතර බහුජාතික සමාගම් ශත 10 ක අමුද්‍රව්‍ය වලින් හදන මේක රුපියල් 4කට විකුණනවා. ඔබ නිකමට හිතන්න, ඔවුන්ගේ ලාභය.. මට ලොකු විස්වාසයක් ඇති වුණා, මට අඩු පිරිවැයකින් සනීපාරක්ෂක තුවායක් හදන්න පුළුවන් කියලා ප්‍රධානම දේ තමයි මේකට කැමැත්තෙන් ඉදිරිපත්වන කාන්තාවක් අවශ්‍ය වීම. ඒකට මම කොහේද යන්නේ තිබුණ එකම තෝරා ගැනීම මගේ බිරිඳ. ඊට පස්සේ පිළිගත් රෙදි කර්මාන්ත ශාලාවකින් කපු මිලදීගෙන මම සනීපාරක්ෂක තුවායක් හදලා මගේ

බිරිඳ ශාන්තිට දුන්නා . දීලා කිව්වා මට ඉක්මනටම මේකේ හොඳ නරක දැන ගන්න ඕනි කියලා ඔබ හිතන්න.. මම මොකක් වෙනස් විදියට හැදුවත් මම මුලින්ම කියනවා ශාන්තිට ඇස් වහගන්න කියලා මම ඒක ඇගේ අත උඩින් තියනවා. මේ වෙලාවෙත් මම ඒකම කළා. ශාන්ති ඇස් ඇරලා බැලුවා.. ඇගේ අත උඩ සනීපාරක්ෂක තුවායක් ඇය තිගැස්සුනා, ඔයා දැන් මේවත් හදන්න පටන් ගත්තද කියලා කිව්වා. ඔව් මට මේකේ හොඳ නරක දැන ගන්න ඕනි. ඇය කියනවා.. ඒක දැන්මම කරන්න බෑ ඒකට ටික කාලයක් ඔයාට බලාගෙන ඉන්න වෙයි කියලා ඊට පස්සේ තමයි මට තේරුම් ගියේ මේක මාසෙකට වතාවක් වෙන දෙයක්නේ කියලා ..අදට පවා සමහර වැඩිහිටියෝත් දන්නේනෑ ඒ දිනවලට කාන්තාවන් මුහුණ දෙන ගැටලු ගැන. ඊට පස්සේ මම මගේ කම්හලේ වැඩට ගියා. දවස් 15 කට පස්සේ මට ලැබෙනවා විස්තරයක් මගේ සනීපාරක්ෂක තුවාය ගැන මොකක්ද ඔයා මට දුන්නේ,.. ඒක කිසිම වැඩක් නෑ. මම මගේ පරණ ක්‍රමයටම ආයේ යනවා කියලා ඇය කියනවා.. ඊට පස්සේ මට ඕනෑ වෙනවා මේ පර්යේෂණය සඳහා සිය කැමැත්තෙන් ඉදිරිපත්වන කාන්තාවක් මෙහෙම මාසයක් බලාගෙන හිටියොත් හොඳ නරක දැන ගන්න මේක හදන එක ප්‍රායෝගික නෑ,,එහෙම උනොත් මේක හදලා ඉවර කරගන්න දශක දෙකක්වත් යයි... ඉතින් මට තව කාන්තාවක් ඕනි වුණා. ඊළගට මේක අත්හදා බලන්න හිටියේ මගේ සහෝදරියෝ හා මගේ බිරිඳ සහෝදරියෝ ඔවුන් පවා මේ ගැන කතා කරන්න සූදානම් නෑ...මම මේකට සහෝදරියගේ ගෙදරට ගියාම ඔවුන් ඉක්මනටම මගේ බිරිඳට කතා කරලා කියනවා, මේ ගැන කතා කරන්න අයියට මෙහෙ එන්න එපා කියන්න කියලා.

ඊළගට මට අදහසක් ආවා ඇයි මන් වෛද්‍ය විද්‍යාලයේ ශිෂ්‍යාවන් මේකට සම්බන්ධ කරගන්නේ නැත්තේ කියලා. නමුත් කම්හලක අත්උදව්කරුවෙක් කොහොමද වෛද්‍ය ශිෂ්‍යාවන් සම්බන්ධ කරගන්නේ වෛද්‍ය විද්‍යාලයේ පිරිමි ළමයින්ටවත් ශිෂ්‍යාවන් ළඟට ගිහින් මේ ගැන කතා කරන්න පුළුවන් කමක් නෑ. කම්හලක අත්උදව්කරුවෙක් කොහොමද ගිහින් මේක අහන්නේ. කොහොම උනත් යමක් කර ගන්න මම ඒක කළමනාකරණය කර ගත්තා. සුපුරුදු විදියටම එක එක විදියේ නැප්කින් හදලා දීලා දවස් හතරක් පහක් බලාගෙන ඉන්න මම හිතුවා .ඊට පස්සේ ඔවුන්ගේ අදහස් ලබා ගත්තා. මම තේරුම් ගත්තා අනාගත වෛද්‍යවරුන්වන මෙම ශිෂ්‍යාවන් පවා වැඩිහිටියෙක් එක්ක මේ ගැන කතා කරන්න සූදානම් නෑ,,

ඊළඟට මට අදහසක් ආවා ඔවුන්ගේ අදහස් ලියලා ගන්න ඇයි මම ෆීඩ්බැක් ෂීට් එකක් නොදෙන්නේ කියලා දැන්මේ වචන කතා කරන මම , මීට අවුරුදු 10 කට කලින් දන්නේ නෑ. ෆීඩ්බැක් ෂීට්. මම දන්න එකම ෂීට් එක බයිසිකල් ෂීට් එක ඊට පස්සේ මට දැනගන්න ඕනි ටික දාලා හැදුවා පොඩි පොඩි ප්‍රශ්න ටිකක් ඔවුන් ඒ ටික පුරවන්න ඕනි..ඒ දවස්වල තරුණ ශිෂ්‍යාවන් 20ක් මට උදව් කලා. මම නැප්කින් දුන්නා. සතියක් බලාගෙන හිටියා. එක දවසක... මම ගියා ෆීඩ්බැක් ෂීට් එකතු කරගෙන එන්න මම දැක්කා ශිෂ්‍යාවන් තුන්දෙනෙක් විතරක් හොස්ටල් එක ඉස්සරහා මගේ ෆීඩ්බැක් ෂීට් පුරවනවා අනෙක් අය වෙනුත්.. එතකොට ඒවා වැරදි තොරතුරු.. වැරදි තොරතුරක් එක්ක මට මොනවද කරන්න පුළුවන් තව දුරටත් කොහොමද මම වැරදි ෆීඩ්බැක් ෂීට් එක්ක මේක කරන්නේ..මම හොස්ටල් එක ඉස්සරහා කඩේකින් තේ එකකුත් බීලා, මේ ගැන කල්පනා කළා. මම කල්පනා කළ.. මීට පස්සේ මේ තරුණියන් මත පමණක් යැපෙන එක හොඳ නෑ කියලා මම හිතුවා,

ඇයි මම විසින්ම මේක පරීක්ෂා කරන්නේ නැත්තේ කියලා... අන්තිමට ඒක කරන්න වුණා. ඊළඟට කතාව එළියට යයි... පිරිමියෙක් නැප්කින් අඳිනවා කියලා. සමහරු ඉංග්‍රීසි පත්තරේක පිටු භාගයක් විතර ලියයි. ඒත් මම කෙටි යට ඇඳුමක් භාවිතා කළා. මම ඒ දවස්වල ත්‍රිකෝණාකාර යට ඇඳුමක් මිලට ගත්තා. මම නැප්කින් එක ඇන්දා පාපන්දු ටියුබ් එකකට සත්තුන්ගේ ලේ දැම්මා.. ටියුබ් එක ඇතුළේ ඒ ටික හොඳට කවලම් කළා මම ඇවිදිනකොට, බයිසිකල්

පදිනකොට ටියුබ් එක ඔබනවා එක පාරක් ලේ ටිකක් නැප්කින් එකට යන්න..එහෙම තමයි ඒක පරීක්ෂා කළේ. නමුත් ඒ පරීක්ෂා කිරීම ගැනත් මම සෑහිමකට පත්වුනේ නෑ..මෙහෙම වුනා.. දින ගෙවිලා ගියා.. මාසයක් ගෙවිලා ගියා.. මාස 6,7,8,9..ඔහොම අවුරුද්දක්ම ගෙවිලා ගියා නමුත් මගේ නැප්කින් එක ඇයි කාන්තාවන්ට හරි යන්නේ නැත්තේ ... සමාගම්වල ඒවා හරියනවා... දෙකම කපු..මේ කාලෙම මම සමාගම්වල හදන නැප්කින්වල තියෙන අමුද්‍රව්‍ය ඉන්දියාව පුරා තියෙන විවිධ විද්‍යාගාරවලට යැව්වා..ඔවුනුත් කීව්වා මේකේ කපු කොටසක් හා සෙලියුලෝස් ආවරණයක් තියෙන්නේ කියලා ඒවත් කපුවලට කියන වෙන නම්.. මම පාවිච්චි කරන්නේත් කපු ඇයි ඒක හරියන්නේ නැත්තේ.. ඒක තමයි මට තිබුණ ප්‍රශ්නේ.. මෙන්න මේ කාලයේ මොකක්ද උනේ කියලා ඔබ දන්නවද මිනිස්සු සැක කරන්න ගත්තා මම මානසික ලෙඩෙක්,මට පිස්සු හැදිලා කියලා ඉස්සෙල්ලම මගේ බිරිඳ මගෙන් ඈත් වුණා. ඇය මට දික්කසාද වෙන්න දැන්වීමක් එව්වා.

ඊළඟට මගේ නැප්කින් එකේ හොඳ නරක හොයා ගන්න අමුතු අදහසක් ආවා. අවදානම් සහිත ක්‍රමයක්. මම හදන නැප්කින් හොඳද නරකද කියලා අහනවට වඩා. ඇයි මම කාන්තාවකගෙන් පාවිච්චි කරපු නැප්කින් එකක් ඉල්ලා ගන්නේ නැත්තේ ඇයි කියලා. ඔබ හිතන්න ඒකේ අවදානම...... මම කාන්තාවකගෙන් කෙස් ගහක් ඉල්ලුවොත් ඇය සැක කරනවා මේ එන්නේ මොකක් හරි විජ්ජාවක් කරලා ඇය වශී කර ගන්න කියලා. ඉන්දියාවේ පයට පෑගුන පස් ටිකක්වත් ඒ වෙලාවේ ගන්න දෙන්නේ නෑ.. කොහොම උනත් කාන්තාවන්ගේ පාවිච්චි කරපු නැප්කින් ගන්න මම ක්‍රමයක් හදා ගත්තා... මගේ අඩි 10 යේ 10 යේ කාමරයේ පිටිපස්සේ මේ පාවිච්චි කරපු නැප්කින් ගෙනත් දැම්මා මම මගේ පර්යේෂණය කරනවා දැන්. මේ දවස්වල මගේ අම්මා ආපහු මෙහෙ ආවා..මම හිතන්නේ එදා ඉරිදාවක්... මේ වෙනකොටත් බිරිඳ මාව දාලා ගිහිල්ලා.. මේ පර්යේෂණය නිසා.... මගේ අම්මා හිතනවා.. ඇගේ පුතා ඉරිදා දවසේ කුකුල්මස් සුද්ද කරනවා කියලා.... ඒ වෙලාවේ ඇය ආවට පස්සේ මේසෙ උඩ තිබුණ දේවල් දැක්කා. ඇය මොනවාවත් නොකර හොඳටම ඇඬුවා. මගේ පුතාට කවුරු හරි මොනවාද කරලා.. තනිකරම දැන් පිස්සු වැටිලා කියලා . මහා ලක්ෂ්මිය මේ ගෙදරින් යන්න ගිහින් කියලා.. මොකද දකුණු ඉන්දියාවේ බිම හැමතැනම හා ගෙදර මුලුවල ගොම තියලා පිරිසිදු කරනවා. ඔවුන් සුවඳ දුම්, සුවඳ කූඩු අල්ලනවා.. හැම තැනම ඒ සුවඳින් දුම් ගස්සනවා.. ඒක හරියට මහා ලක්ෂ්මියගේ මන්දිරය වගේ.. එහෙම තිබුණ ගෙදර දැන් පාවිච්චි කරපු නැපිකින් හැමතැනම දාලා.. අන්තිමට ඇයත් මාව අතෑරලා ගියා.

ඊළඟට කෑම ප්‍රශ්නේ ආවා.. මම තනියම කෑම උයා ගත්තා.. කොහොම උනත් අන්තිමට මම සාර්ථක වුනා.. මම හොයා ගත්තා ඒක ඇතුළේ තියෙන දේ ඒ මල් වලින් ගන්න කපු, ගස්වල සුඹුලුවලින් හදන කපු.. ඒක බොහොම සරලයි. සෙලියුලෝස් ආවරණය හදලා තිබුනේ ගසේ සුඹුලුවලින් ඒක දැව පල්පයකින්.. මේක හදන අමුද්‍රව්‍ය සොයා ගත්තට ඒක හදන්න ලොකු යන්ත්‍රයක් ඕනි වුණා. නැප්කින් හදන යන්ත්‍රය ඇමරිකානු ඩොලර් ලක්ෂ 5ක් විතර වෙනවා. ඒක තමයි දෙවන ලෝක යුද්දෙන් පස්සේ ඉදන් මේ බිස්නස් එක බහු ජාතික සමාගම් අතේ විතරක් තියෙන්නේ... මේ යන්ත්‍රය ගැන දැනගත්තත් මම කවදාවත් අධෛර්යයට පත් වුණේ නෑ. මම තවත් අවුරුදු හතර හමාරක් විතර පර්යේෂණ කළා.. අන්තිමට මෙන්න මේ වගේ ඉතා කුඩා යන්ත්‍රයක් මම හැදුවා නැප්කින් හදන්න.



ලෝකයේ තිබෙන හොඳම නැප්කින්වල ප්‍රමිතියට නැප්කින් ඒකක් මමත් මගේ ගෙදර හැදුවා.. මේක තමයි මගේ නවෝත්පාදනය ඊට පස්සේ ඒක ඉන්දියානු තාක්ෂණ ආයතනයට ඉදිරිපත් කළා ඇගයීම සඳහා ඒ දවස්වලම මම පේටන්ට් ගන්නත් උත්සාහ කළා .දිගටම ඉගෙනගෙන... ඉගෙනගෙන... ඉගෙනගෙන කුසලතා හදාගත්තට පස්සේ මම තේරුම් ගත්තා පේටන්ට් හිමිකම් ආදිය ගැන, මම ගොඩාක් මේකට වියදම් කළා..මුදල් පමණක් නොවෙයි,මගේ පවුල හැමදේම... ඒ දවස්වල පොඩි තරහයක් තිබුණා. ඉන්දියානු තාක්ෂණ ආයතනය මෙහෙයවපු එකක් මදුරාසියේ. ඒක නම් කරලා තිබුනේ, සමාජයේ යහපැවැත්ම සඳහා වූ හොඳම නවෝත්පාදනය විදියට

මට කියන්නේ නැතිව ඒ අය මේ නවෝත්පාදනය ඒ තරඟයට දාලා තිබුණා.. නවෝත්පාදන 943 ක් පහුකරලා මගේ මේ නවෝත්පාදනය හොඳම එක වුණා. හදිසියේම මම ප්‍රභාමත් වුණා..... ඊළඟට හැමෝම මේ ගැන ලිව්වා.. කම්හලක අත්උදව්කරුවෙක් මේක කළා කියලා. මම පේටන්ට් හිමිකමත් ගත්තා. නැප්කින් එකක් අඩු පිරිවැයකට හදාගන්න ලෝකේ තියෙන එකම අඩු පිරිවැය යන්ත්‍රය මේක. ඔබ හිතන්න මේක උණු කැවුම් වගේ විකුණන්න පුළුවන් යන්ත්‍රයක්. ඔබ හිතන්න මේ වගේ හිමිකමක් ඔබේ අතේ තිබුණානම් මම මේක අහන්නේ මෙතන ඉන්න පශ්චාත් උපාධි ශිෂ්‍යයන්ගෙන් සහ ව්‍යාපාරිකයන්ගෙන්. ඔබ උත්සාහ කරයි මේ පේටන්ට් හිමිකම මගින් පුළුවන් තරම් මහා ධනයක් එකතුකර ගන්න.

නමුත් මම ඒක කවදාවත් කළේ නෑ. ඇයි?... මගේ පොඩිකාලේ ඉඳන්ම මම දන්නවා දුප්පත්කම හන්දා මිනිස්සු මැරුණේ නෑ. හැමදේම වෙන්නේ නූගත්කම හන්දා. නූගත්කම ගැන මොනවද ඔබ දන්නේ.. මේ මුදල් පසු පස එලවීම හැම කෙනාම මුදල් පසුපස යමින් සිටිනවා. මම කවදාවත් ව්‍යාපාර පාසලක හෝ කොහේවත් ඉගෙනගෙන නෑ. මම නිරීක්ෂණය කරනවා. මිනිසුන් මොනවද කරමින් ඉන්නේ කියලා. මම මෙතන ඉන්න අයගෙන් ඇහුවොත් මොනවද ඔබ කරමින් ඉන්නේ කියලා... අනිවාර්යෙන්ම මම දන්නවා... ඔබ උත්සාහ කරනවා නොමැරී ඉන්න. කෝට් ඇඳගෙන, මේ බිස්නස්.. අර බිස්නස් කරමින්...අරවා මේවා... මන්දිර, රෝයිස්, බෙන්ස්....අවසානයේ..ඔබ සුළු විදියට කුඩා ගෙයක. අමතර නිදන කාමරයක් තියන ගෙයක. බංගලාවක ආදී ලෙස සරලව පණ ටික රැකගන්නවා.....එච්චරයි..... ඊට වඩා දෙයක් නෑ මම හරිද වැරදිද ..ඔබට එකඟ වෙන්න වනවා...ඊට වඩා දෙයක් නෑ.. ප්‍රශ්නය තමයි ඔබේ දත් මදින්න ඕනි උනාම ඔබට ඒකට ප්ලාස්ටික් මිටක් තියෙන, නයිලෝන් කෙඳි තියෙන බුරුසුවක් ප්‍රමාණවත්... ඔබේ ජීවිතය දියුණු වෙද්දී මොකක්ද ඔබේ ඔළුවට එන්නේ... ඔබට අවශ්‍ය වෙනවා රත්තරනින් හදපු දියමන්ති ඔබ්බවූ දත් බුරුසුවක්... හා එකඟද...නැද්ද.. ලෝකේ පුරාම තියෙන මෝඩකම මේකයි..මම කවදාවත් එහෙම කළේ නෑ.. මට එහෙම බිස්නස් කරන්න ඕනි වුනේ නෑ... ලාභ..ලාභ..විතරක්..මිලියන..බිලියන ශේෂ තියන ඉතුරුම් මම සමාජ සේවයක් කළා.. මම මේ යන්ත්‍ර ඉන්දියාවේ ග්‍රාමීය ප්‍රදේශවලට දුන්නා.... කුඩා කර්මාන්ත ශාලාවක පිටුපස මේ කාන්තාවෝ නැප්කින්ස් හදනවා. මගේ මෙහෙවර තමයි දුප්පත් කාන්තාවන් මිලියනයකට රස්සාවල් හදලා දෙන එක ඒ හරහා ඉන්දියාවේ නැප්කින් පාවිච්චි කරන්නේ 7% යි. කාන්තාවන්ගෙන් 93% නැප්කින් පාවිච්චි කරන්නේ නෑ මෙහෙ.. මම මේ සංඛ්‍යාව සියයට 100

කරන්නයි හදන්නේ.... රැකියා මිලියනයක් මම දෙනවා මේ හරහා.... ඒක තමයි මගේ දැක්ම . ඒක තමයි මම කරන්න යන්නේ. බොහොම ස්තුතියි ඔබට....



මෙම ලිපිය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර කරන සහ ව්‍යාපාර කිරීමට සිහින දකින ශ්‍රී ලාංකික සුවහසක් ව්‍යවසායක ප්‍රජාවට ආදර්ශයක් ලෙස ඉදිරිපත් කරමි.

**කේ.එම්.ජී සමරසේන**

**පුහුණු හා පර්යේෂණ නිලධාරී,**

**ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය.**

# 12. සහභාගිත්ව සංවර්ධන ක්‍රමවේදය හා එහි භාවිතය

ඩබ්. ආර්. එන්. පී. විජේවර්ධන

දිළිඳුකම පිටුදැකීම සඳහා සංවර්ධන ආකෘතිය තුළ පැවති දුර්වලතා අවම කර ගැනීමෙ අරමුණ සහිත ජනතා සහභාගිත්වය සහ පුරෝගාමිත්වය සහිත වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සඳහා 1970 දශකයෙන් පසු ආරම්භ වූ විකල්ප සංවර්ධන ප්‍රවේශය සහභාගිත්ව සංවර්ධනය වේ. මෙම සංවර්ධන ප්‍රවේශය නූතන සංවර්ධන වැඩසටහන්වල ප්‍රධාන දර්ශනය බවට පත්ව තිබේ. සාම්ප්‍රදායික සංවර්ධන ක්‍රමෝපායන් මඟින් ප්‍රජා සංවර්ධනය සඳහා වූ සේවය අවම වීම හේතුවෙන් දිළිඳුකම පිටු දැකීම සඳහා ප්‍රමුඛ සංවර්ධන ප්‍රවේශයක් ලෙස සහභාගිත්ව සංවර්ධනය සංවර්ධනය වෙමින් පවතින රටවල භාවිතා වේ.Participatory Rural Appraisal (PRA)

දශක ගණනාවක් තුළ තුන්වන ලෝකයේ රටවල ක්‍රියාත්මක වූ සාම්ප්‍රදායික සංවර්ධන උපාය මාර්ග මඟින් ඇති වූ ග්‍රාමීය සංවර්ධනය බලාපොරොත්තු වූ ඉලක්ක සපුරා ගෙන නොමැත. සාම්ප්‍රදායික සංවර්ධන ක්‍රමවේදයේ දී රජය විසින් සැලසුම් සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ඇගයීම් සිදු කළ අතර ඉලක්ක ජනතාව සහභාගි වූයේ ප්‍රතිලාභීන් ලෙස පමණි. මෙම සංවර්ධන ක්‍රමවේදය ඌණ සංවර්ධිත රටවල දිළිඳුකම අවම කර ගැනීම සඳහා දායක නොවී ය.

මේ අතරතුර 1970 දශකයේ දී ලෝක ආර්ථිකය විශ්වකරණය (Globalization) වීමේ ප්‍රතිඵලයක් ලෙස බොහෝ රටවල් එම ආර්ථික ක්‍රියාවලියට ගැළපෙන පරිදි තම රටවල රාජ්‍ය තන්ත්‍රයේ ව්‍යුහගත වෙනස්කම් සිදු කරන ලදි. මෙම ව්‍යුහගත වෙනස්කම්වල ප්‍රතිඵල වූයේ රජයේ සුබසාධන වියදම් කපා හැරීම, පෞද්ගලීකරණය යනාදී ක්‍රියාවලින් ය. සුබසාධන වියදම් කපා හැරීම තුළින් දිළිඳුභාවය උග්‍ර විය. එබැවින් මෙම අභියෝගය ජය ගැනීම සඳහා දිළිඳු පිරිස උදෙසා විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය මතු විය . සීමිත සම්පත් වලින් වැඩි පිරිසකට ප්‍රතිලාභ සැලසීමට හැකිවන පරිදි විකල්ප සංවර්ධන ක්‍රමවේදයන් සොයා බැලීමට සංවර්ධනවේදීන් උත්සුක වීමෙහි ප්‍රතිඵලයක් ලෙස 1970 දශකයේ සිට තුන් වන ලොව රටවල් සහභාගිත්ව සංවර්ධන ක්‍රමවේදය අනුගමනය කිරීමට පෙළඹුණි.

සහභාගිත්ව පර්යේෂකයින් විසින් සහභාගිත්ව සංවර්ධනය අර්ථ දක්වා ඇත්තේ පහත පරිදි ය.

පොන්න විග්නරාජා (Ponna Wignaraja):- "සංවර්ධන සැලසුම් සකස් කිරීමේ දී ප්‍රතිලාභීන්ගේ උපරිම සහභාගිත්වය ලබාගන්නා වූත් සංවර්ධන ක්‍රියාවලියේ කේන්ද්‍රස්ථානයක් ලෙස ගම සලකන්නා වූත් ඉලක්ක ගත කණ්ඩායම්වල සවිබලකරණය හා ප්‍රාදේශීය මට්ටමේ සම්පත් හා තාක්ෂණය භාවිතය යන උපාය මාර්ගස මත පදනම් වූ සංවර්ධන ක්‍රියාවලිය සහභාගිත්ව සංවර්ධනය වේ."

බෙන්ජමින් ඩගොදින් (Benjemin Dagodin):- "කිසියම් ව්‍යාපෘතියක් සැලසුම් කිරීම, කළමනාකරණය කිරීම යන අවස්ථාවල දී වගකීම සහ කාර්යයන් අර්ථවත් පරිදි බෙදා ගැනීම සහභාගිත්ව සංවර්ධනය වේ."

විල්ෆ්‍රඩ් කරුණාරත්න (Wilfred Karunarathne):- "විවිධ බලවේගයන් විසින් කාලයක් තිස්සේ යටපත් කරනු ලැබ තිබූ බෙලහීන ජනතාවගේ සැඟවුණ නිර්මාණාත්මක කුසලතාවයන් සාමූහික ප්‍රයත්නයන් මඟින් ඉස්මතු කර

ගනිමින් ඔවුන්ට වාසිදායක වන අයුරින් පවත්නා තත්ත්වයේ යහපත් වෙනසක් ඇති කරමින් ඔවුන්ගේ ම කතෘත්වයෙන් බිහි වන සංවර්ධන ක්‍රියාවලිය සහභාගිත්ව සංවර්ධනය වේ."

සංවර්ධන ක්‍රියාවලියේ දී සැලසුම් කිරීම පිළිබඳ ව තීරණ ගැනීමේ අවධියේ සිට ඇගයීමේ අවධිය දක්වා වූ සියලු ම කාර්යයන්ට සංවර්ධනයේ ප්‍රතිලාභීන්ගේ ක්‍රියාකාරී සහභාගිත්වය මෙන්ම සංවර්ධනයට දායක වන්නා වූ රජය, බාහිර ආයතන සහ ආධාරක ආයතන වැනි ආයතන වලින් සංවර්ධන ක්‍රියාවලියට අවශ්‍ය වූ සහාය සැපයීම සහභාගිත්ව සංවර්ධනය ලෙස සරල ව හැඳින්විය හැකි ය.

**සහභාගිත්ව සංවර්ධනයේ මූලික ලක්ෂණ**

සහභාගිත්ව සංවර්ධන ක්‍රමවේදය සහ ධනේෂ්වර සංවර්ධන ක්‍රමවේදය අතර මූලික වෙනස්කම් කීපයකක් හඳුනා ගත හැකිය.

1. සහභාගිත්ව සංවර්ධන ක්‍රියාවලියේ මූලික ඉලක්කය වන්නේ දිළිඳු ජනතාවගේ මූලික අවශ්‍යතා සපුරා ලීමයි .ඒ අනුව වැඩසටහන් හඳුනා ගැනීම, සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ප්‍රතිලාභ භුක්ති විඳීමත් ඇගයීමත් මෙම ජන කොටස් විසින් සිදු කෙරේ. ධනේෂ්වර සංවර්ධන ආදර්ශයේ කේන්ද්‍රීය අවශ්‍යතාව වන්නේ ලාභය යි . ඒ සඳහා ආර්ථිකය මෙහෙය වනු ලබන අතර මිනිස් ශ්‍රමය වෙනුවට ලාභදායී තාක්ෂණික ක්‍රම පිළිබඳ විශේෂ අවධානයක් යොමු කරයි.

2. පහළ සිට ඉහළට විහිද යන සන්නිවේදන රටාවකට සහ නියෝග මාලාවක් අනුව වැඩසටහන් ක්‍රියාවට නඟනු ලබයි. (Up-Bottom planning) මෙහි දී අඩු ආදායම්ලාභී ජන කොටස්වල සක්‍රීය සහභාගිත්වය මූලික ක්‍රියාමාර්ගයක් ලෙස සලකයි. ඒ අනුව අදාළ වැඩසටහන් ආරම්භයේ සිට අවසානය දක්වා වූ සෑම අදියරකදී ම මෙම සහභාගිත්වය අපේක්ෂා කරයි.

3. සහභාගිත්ව සංවර්ධන ක්‍රමවේදය තුළ ප්‍රතිලාභීන්ගේ නිර්මාණාත්මක හැකියාවන්, ප්‍රජාතාන්ත්‍රීය ක්‍රියාවලීන්, දේශීය සම්පත් සහ තාක්ෂණය උපයෝගී කර ගනී .මෙහි දී අපේක්ෂා කරනුයේ දිළිඳු ජනතාව සවිබල ගැන්වීම යි . ධනේෂ්වර සංවර්ධන ආදර්ශය අනුව ප්‍රතිලාභීන් සහ ප්‍රතිලාභය අතර මානුෂික බැඳීමක් දක්නට නැත. ප්‍රතිලාභීන් ප්‍රතිලාභ ලබන්නන් පමණක් බවට පත් වේ.

**සහභාගිත්ව සංවර්ධනයේ අරමුණු**

දිළිඳු ප්‍රජාව සවිබල ගැන්වීම සඳහා වූ විකල්ප සංවර්ධන ප්‍රවේශය සහභාගිත්ව සංවර්ධන ක්‍රමවේදය වේ .මෙම ක්‍රමවේදය තුළින් බලාපොරොත්තු වන අරමුණු පහත පරිදි දැක්විය හැකිය.




සහභාගිත්ව සංවර්ධනය සඳහා පදනම් වන  මූලධර්ම කිහිපයකි . එනම්

- ප්‍රජාව මූලිකත්වය ගැනීම.
- සහභාගිතත්වය
- කුඩා කණ්ඩායම් ක්‍රියාවලිය

සහභාගිත්ව සංවර්ධන ක්‍රියාවලිය මඟින් ග්‍රාමීය ජනතාව ඉලක්ක කොට ගෙන සිදු කරන සංවර්ධනයේ විෂය ක්ෂේත්‍රයක් වේ. මෙහි මුල් අදියර වන්නේ දිළිඳු ජනතාව විසින්. ඔවුන් වටා ඇති සමාජ යථාර්ථය තේරුම් ගැනීම පිණිස කරනු ලබන සහභාගීත්ව විමර්ශනය යි. දිළිඳුකම ඇති වීමට හේතු, ඔවුන් දිළිඳුකමේ ම රඳවා තැබීමට හේතු වන කරුණු සහ ඒ සඳහා තුඩු දුන් සමස්ත ක්‍රියාවලිය තේරුම් ගැනීමත් ඔවුන්ට වාසි දායක වන අයුරින් වෙනස් කිරීමට හේතු වන ආකාරයේ සංවර්ධන වැඩසටහන් ආරම්භ කළ යුතු වේ.

සංවර්ධන වැඩසටහන් සැලසුම් කරණයේ සිට අවසන් කිරීම දක්වා ක්‍රියාවලිය තුළ සිදුවන සහභාගිත්වය ප්‍රමාණාත්මකව සහ ගුණාත්මකව වැඩි දියුණු කිරීමට විමධ්‍ය ගතකරණ ආයතන ඍජු ව සම්බන්ධ වේ. සහභාගිත්ව සංවර්ධනය ප්‍රජාතන්ත්‍රීය ක්‍රියාවලියකි. ඒ අනුව සංවර්ධනයේ සෑම අදියරකදීම මෙම ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම ක්‍රියාත්මක කළ හැකි අතර විමද්‍යගත කරණය වැනි උපක්‍රම ඒ සඳහා ප්‍රබල ශක්තියක් සපය යි.

කිසියම් ප්‍රජාවක් තුළ සමාජ සජීවිකරණ ක්‍රියාවලියක් ඇරඹීමට ඒ සඳහා විශේෂිත පුහුණුවක් ලත් ක්ෂේත්‍ර ක්‍රියාකාරකයින්ගේ මැදිහත්වීමක් අවශ්‍ය වේ. සහාය අවශ්‍ය කරනු ලබන ජනතාවට තම සංවර්ධනය සැලසුම් කිරීමට උපකාරී වීම සහ බාහිර වශයෙන් සපයා ගත යුතු වන මූල්‍යමය, ද්‍රව්‍යමය සපයා ගැනීමට සහාය වීම බාහිර

සභිකයින්ගේ කාර්ය වේ.මෙබඳු සහායකයින් විපර්යකාරකයින් ලෙස හැඳින්වේ. මෙම නියෝජිතයන් මඟින් ඉටු වන කාර්ය පහත දැක්වේ.

- ❖ සංවර්ධන විඥානය ගොඩ නැඟීම
- ❖ කණ්ඩායම් සංවිධානය සහ ආයතන ගොඩ නැඟීම
- ❖ බාහිර සම්පත් ග්‍රහණය
- ❖ කුඩා ව්‍යාපාර සංවර්ධනය

ග්‍රාමීය සංවර්ධන ව්‍යායාමය සාර්ථක කර ගැනීම සඳහා අනුගමනය කරන ක්‍රමවේදයක් ලෙස කුඩා කණ්ඩායම් ක්‍රමය දැක්විය හැකිය. මෙම කණ්ඩායමක සාමාජිකයන් සාමාන්‍යයෙන් 5-15 ත් අතර ප්‍රමාණයකින් සැදුම්ලත් වේ. ස්වයං සංවර්ධනාත්මක ක්‍රියාවන් ශක්තිමත් කරලීමට අවශ්‍ය සම්පත් පදනමක් ලොඩ නැගීමේ ක්‍රියාවලියේ මූලික පියවර වන්නේ සංවිධානය වූ කණ්ඩායම් ඔවුන්ගේ ම සම්පත් එක්රැස් කොට යෙදවීමට උත්සහ දැරීම යි . මෙම කණ්ඩායම් තුළ ගොඩ නැගෙනඅරමුදල ජනතා ජීවිත උසස් කිරීමේ ක්‍රියාවලියේ ආරම්භක පියවර වේ. එය මූල්‍ය කළමනාකරණය, මූල්‍ය භාවිතය හා ඉතුරුම් සංස්කෘතියක් ගොඩ නැගීමට ලබා දෙන පුහුණුවකි.

ජාතික මට්ටමේ වැඩසටහන් වශයෙන් දියත් කළ ජනසවිය වැඩසටහන, සමෘද්ධි ව්‍යාපාරය වැනි වැඩසටහන් වලදී සහභාගිත්ව සංවර්ධන ක්‍රමවේදය යොදා ගන්නා ලදි. ඊට අමතරව සහභාගීත්ව ග්‍රාමීය සංවර්ධන වැඩසටහන, නිවාස දශ ලක්ෂයේ වැඩසටහන ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන් වලදී යොදා ගන්නා ලදි.

**මූලාශ්‍ර**

කරුණාරත්න,විල්ෆ්‍රඩ් .(1998) සහභාගිත්ව සංවර්ධනය පීඩා ආයතන හා අන්තර් ජාලය

ඩබ්. ආර්. එන්. පී. විජේවර්ධන

සංවර්ධන නිලධාරි,

**ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය.**

# 13. ග්‍රාමීය කුඩා පරිමාණ ව්‍යවසායකත්වය නඟා සිටුවීම සඳහා අත්දැකීම් හුවමාරුවේ වැදගත්කම

**සුභානි පියසිංහ**

ග්‍රාමීය කුඩා පරිමාණ ව්‍යවසායකත්වය නිසා ව්‍යවසායකයාට, පාරිභෝගිකයාට, ප්‍රදේශයට මෙන්ම රටට බොහෝ ප්‍රතිලාභ හිමිවන අතර ඒ තුළින් ආර්ථික සංවර්ධනය පෝෂණය කිරීම, දරිද්‍රතාවය අඩු කිරීම සහ ග්‍රාමීය ප්‍රජාවන් තුළ ස්වයං විශ්වාසය ප්‍රවර්ධනය කිරීම සඳහා තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරනු ලබයි. කෙසේ වෙතත්, ග්‍රාමීය කුඩා පරිමාණ ව්‍යවසායකයින් බොහෝ විට වෙළඳපොළට සීමිත ප්‍රවේශය, මූල්‍ය සම්පත් හිඟකම සහ ප්‍රමාණවත් පුහුණුවක් නොමැතිකම වැනි අභියෝගවලට මුහුණ දෙයි. මෙම අභියෝගවලට මුහුණ දීමට හා ඒවා ජයගැනීමට යොදාගත හැකි එක් ප්‍රබල ක්‍රමයක් වන්නේ ව්‍යවසායකයින් අතර අත්දැකීම් හුවමාරු කර ගැනීමයි. එය නවෝත්පාදනය, නිර්මාණශීලිත්වය, අවදානම් භාරගැනීම, අත්හදා බැලීම් පිළිබඳ අවබෝධයක් ලබාගැනීම සහ අන්‍යෝන්‍ය වර්ධනයට හේතු විය හැකිය.

අත්දැකීම් හුවමාරුව යනු පුද්ගලයන් හෝ කණ්ඩායම් අතර දැනුම, කුසලතා සහ හොඳම භාවිතයන් බෙදා ගැනීමේ ක්‍රියාවලියයි. ග්‍රාමීය කුඩා පරිමාණ ව්‍යවසායකත්වයේ සන්දර්භය තුළ, මෙයට පළපුරුදු ව්‍යවසායකයින් ඔවුන්ගේ සාර්ථක කතා, අභියෝග සහ ඉගෙන ගත් පාඩම් අන් අය සමඟ බෙදා ගැනීම ඇතුළත් විය හැකිය. එයට ව්‍යවසායකයින් සඳහා පවත්වනු ලබන ව්‍යුහගත උපදේශක වැඩසටහන්, පුහුණු වැඩසටහන්, සම වයසේ මිතුරන් අතර ඉගෙනුම් ජාල, ප්‍රජාව විසින් මෙහෙයවනු ලබන වැඩමුළු සහ අන්තර්ජාලය ඔස්සේ ලබාගන්නා තොරතුරු ද ඇතුළත් විය හැකිය.

**අත්දැකීම් හුවමාරුව තුළින් ග්‍රාමීය කුඩා පරිමාණ ව්‍යවසායකයන් හට ප්‍රතිලාභ රැසක් අත්පත් කරගත හැකිය.**

**1. දැනුම බෙදාගැනීම**

අත්දැකීම් හුවමාරුව හරහා, ව්‍යවසායකයින්හට ඵලදායී ව්‍යාපාර උපාය මාර්ග හඳුනා ගැනීම, පිරිවැය කළමනාකරණය සහ අලෙවි කළමනාකරණ ශිල්පීය ක්‍රම පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට හැකිවේ. නිදසුනක් වශයෙන්, රස කැවිලි නිෂ්පාදය සාර්ථකව සිදුකරන නිෂ්පාදකයෙකුට මෙම දැනුම අන් අය සමඟ බෙදා ගත හැකි අතර, එමඟින් ඔවුන්ගේ ආදායම් මාර්ග විවිධාංගීකරණය කිරීමට හැකි වේ.

**2. කුසලතා සංවර්ධනය**

ප්‍රායෝගික ආදර්ශයන් සහ බෙදාගත් අත්දැකීම් තුළින් ව්‍යවසායකයින්ට නිෂ්පාදන සංවර්ධනය, තාක්ෂණ ඒකාබද්ධ කිරීම හෝ පාරිභෝගික සම්බන්ධතා කළමනාකරණය වැනි නව කුසලතා ලබා ගැනීමට ඉඩ සලසයි. මෙම ප්‍රායෝගික ඉගෙනීම බොහෝ විට න්‍යායාත්මක පුහුණුවට වඩා ඵලදායී බව සහතික කළ හැකි වේ.

**3. නවෝත්පාදනය දිරිමත් කිරීම**

අන් අයගේ සාර්ථකත්වය ගැන ඇසීම ග්‍රාමීය ව්‍යවසායකයින්ට නිර්මාණශීලීව සිතීමට සහ ඔවුන්ගේ දේශීය සන්දර්භයන්ට විසඳුම් අනුවර්තනය කිරීමට පෙළඹවිය හැකිය. නිදසුනක් වශයෙන්, විදුලිය ලබාගැනීම සඳහා සූර්ය ශක්තිය භාවිතා කරන ව්‍යවසායකයෙකුට ඔවුන්ගේ නිෂ්පාදන කාර්යය සඳහා විකල්ප පුනර්ජනනීය බලශක්ති පිළිබඳ ගවේෂණය කිරීමට හා එහි වාසි අවබෝධ කර ගැනීමට අවස්ථාව සලසා දීම තුළින් අන් අයවද ඒ සඳහා පෙළඹවිය හැකිය.

**4. විශ්වාසය ගොඩනැගීම සහ හුදකලා බව අඩු කිරීම**

ග්‍රාමීය ව්‍යවසායකයින් බොහෝ විට හුදකලාව තම ව්‍යාපාරය ක්‍රියාත්මක කරන අතර, එයින් ස්වයං අභිප්‍රේරණයක් ඇති නොවී අධෛර්යමත් හැඟීම් ඇති කළ හැකිය. අත්දැකීම් බෙදා ගැනීම ප්‍රජාව තුළ ව්‍යවසාය පිළිබඳ නව හැඟීමක් ඇති කරයි, අභියෝගවලට මුහුණ දීමේදී තමන් තනිවම නොවන බව පුද්ගලයන්ට අවබෝධ කර ගැනීමට උපකාරී වේ. මෙම සාමූහික බව ස්වශක්තිය කෙරෙහි විශ්වාසය සහ ඔරොත්තු දීමේ හැකියාව ගොඩනගයි.

**5. සම්පත් වෙත ප්‍රවේශය පහසු කිරීම**

සම්පත් සීමාවන් සාර්ථකව ජයගත් ව්‍යවසායකයින්ට අරමුදල්, රජයේ වැඩසටහන් හෝ තාක්ෂණික සහාය ලබා ගන්නේ කෙසේද යන්න පිළිබඳව අන් අයට මඟ පෙන්විය හැකිය. සම වයසේ මිතුරන්ගේ නිර්දේශ බොහෝ විට විධිමත් උපදේශනවලට වඩා වැඩි බරක් දරන අතර, මෙය අත්දැකීම් හුවමාරුවේ තීරණාත්මක අංගයක් බවට පත් කරයි.

**6. ජාල ගත වීම සහ ඒකාබද්ධතාව ශක්තිමත් කිරීම**

අත්දැකීම් බෙදා ගැනීමේ ක්‍රියාවලිය සහයෝගීතාවයන් සහ ඒකාබද්ධතාවයට මඟ පෑදිය හැකි ජාල නිර්මාණය කරයි (සංවිධානගත වීම). නිදසුනක් වශයෙන්, එකම කලාපයේ ව්‍යවසායකයින් දෙදෙනෙකු තොග වශයෙන් සැපයුම් මිලදී ගැනීම හා සම්පත් රැස් කිරීමට තීරණය කළ හැකිය. ඉන් පිරිවැය අඩු කිරීම සහ කාර්යක්ෂමතාව වැඩි කරගත හැකි වේ.

බොහෝ සංවර්ධනය වෙමින් පවතින රටවල, ප්‍රජාව විසින් මෙහෙයවනු ලබන ජාලගත ප්‍රජා සංවිධාන අත්දැකීම් හුවමාරුවේ වටිනාකම ඔප්පු කර ඇත. නිදසුනක් වශයෙන්, ඉන්දියාවේ කාන්තා ස්වයං නිෂ්පාදන කණ්ඩායම් අතින් සාදන ලද භාණ්ඩ අලෙවි කිරීම සඳහා සමුපකාර නිර්මාණය කිරීම වැනි ක්ෂුද්‍ර ව්‍යවසාය උපාය මාර්ග සාර්ථකව ක්‍රියාත්මක වේ. මෙයින් කණ්ඩායම් ආදායම් වැඩි දියුණු කර ඇතිවා පමණක් නොව, ප්‍රජාවගේ නායකත්ව භූමිකාවන් භාර ගැනීමටද කාන්තාවන්ට බලය ලබා දී ඇත.

මේ ආකාරයෙන් ප්‍රතිලාභ පැහැදිලිව පෙනෙන්නට තිබුණත්, ග්‍රාමීය ප්‍රදේශවල පවතින දුර්වල යටිතල පහසුකම් සහ තාක්ෂණ ප්‍රවේශයට හා සන්නිවේදනයට ඇති බාධා සමාජ සම්මතයන් හෝ තරඟකාරිත්වයට ඇති බිය නිසා අත්දැකීම් බෙදා ගැනීමට ඇති අකමැත්ත මෙන්ම දැනුම බෙදා ගැනීමට පහසුකම් සැලසීම සඳහා විධිමත් යාන්ත්‍රණයක් නොමැතිකම වැනි අභියෝගයන් ද අත්දැකීම් හුවමාරුව තුළ දක්නට ලැබේ.

එබැවින්,

1. අත්දැකීම් බෙදා ගැනීමට ව්‍යවසායකයින් සඳහා ග්‍රාමීය ව්‍යවසායකයින් සංවිධාන ගත කිරීම.
2. ව්‍යවසායකයින් සම්බන්ධ කිරීම සඳහා ජංගම යෙදුම් සහ මාර්ගගත වේදිකා වැනි ඩිජිටල් තාක්ෂණය භාවිතා කිරීම.
3. උපදේශන වැඩසටහන් සහ සම වයසේ මිතුරන් අතර ඉගෙනුම් හා අත්දැකීම් හුවමාරුව සඳහා මුලපිරීමට රජයේ සහ රාජ්‍ය නොවන සංවිධානවල සහාය දිරිමත් කිරීම.
4. නවෝත්පාදන සහ සාර්ථක අත්දැකීම් ප්‍රදර්ශනය කිරීම සඳහා නිතිපතා වැඩමුළු, ප්‍රදර්ශන ආදිය පැවැත්වීම.
5. කාන්තාවන්, තරුණයින් සහ ආන්තික කණ්ඩායම් ඇතුළු සවිබලගැන්වීම් අවැසි විවිධ පිරිස් සඳහා ඔවුන්ගේ සහභාගීත්වය සහතික කිරීම හා ප්‍රවර්ධනය කිරීම වැනි ක්‍රම මඟින් ග්‍රාමීය කුඩා පරිමාණ ව්‍යවසායකයින් අතර අත්දැකීම් හුවමාරුව වැඩි දියුණු කිරීම සඳහා කටයුතු කිරීම.

ඒ අනුව ග්‍රාමීය කුඩා පරිමාණ ව්‍යවසායකයින් අතර අත්දැකීම් හුවමාරුව වර්ධනය කිරීම, නවෝත්පාදනය සහ ඔරොත්තු දීමේ හැකියාව දියුණු කිරීම සඳහා ප්‍රබල මෙවලමක් වේ. එකිනෙකාගේ අත්දැකීම් හුවමාරුව තුළින් ඔවුන්ගේ දැනුම ව්‍යසායකයින්ට ඉක්මනින් උකහා ගැඅනීමටත්, ව්‍යවසායකයින්ට අභියෝග ජය ගැනීමටත්, වසායකයින්ගේ ඇගයුම් මෙහෙයුම් වැඩිදියුණු කිරීමටත් තිරසාර සංවර්ධනයට දායකත්වය ලබා ගැනීමටත් හැකිවේ.

සුභානි පියසිංහ

සංවර්ධන නිලධාරි,

**ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය.**

# 14. පහළ බිලියනය

## දුප්පත්ට රටවල් අසාර්ථක වන්නේ ඇයි සහ ඒ ගැන කළ හැක්කේ කුමක්ද

ආනන්ද ප්‍රේමසිරි

PAUL COLLIER THE BOTTOM BOLLION පොත ඉදිරිපත් කරමින් දුප්පත් රටවල් අසාර්ථක වන අතර ඒ ගැන කළ හැක්කේ කුමක්ද ලෝක බැංකුවේ හිටපු සංවර්ධන පර්යේෂන අධ්‍යක්ෂ සහ බ්‍රිතාන්‍ය රජයේ අප්‍රිකාවේ කොමිෂන් සභාවේ උපදේශක ලෙස කටයුතු කරමින් දුප්පත් බිලියනය පුද්ගලයින් සිටින රටවල් පනස් අටේ අන්ත දරිද්‍රතාවය කරන්නේ උගුල් හතරක එකතුවය

### 1 ගැටුම් උගුල

නොනවතින සහ ලේවැකි ගැටුම් වලින් පීඩා විඳින දුප්පත්ම ජාතීන්ට දරිද්‍රතාවයෙන් මිදීමේ දුෂ්කර කාලයක් ඇත.

රටක ආර්ථිකයට යුද්ධය තරම් විනාශයක් වෙන කිසිවක් නැත. ප්‍රචණ්ඩ ගැටුම්වල විශාල පිරිවැය - සාමාන්‍යයෙන් ඩොලර් බිලියන 64 ක විශ්මයජනක - සහ සමස්ථ කලාපයටම බලපාන මානුෂීය අර්බුද යුද්ධය අතිශයින් වියදම් අධික කටයුත්තක් බවට පත් කරයි.

අවාසනාවකට මෙන්, ලෝකයේ දුප්පත්ම රටවල් සඳහා, ඔවුන් ධනවත් ජාතීන්ට වඩා එවැනි අඛණ්ඩ, මිල අධික ගැටුම් අත්විඳීමට බොහෝ දුරට ඉඩ ඇත. ඇත්ත වශයෙන්ම, අන්ත දිළිඳු රටක් වසර පහක කාලයක් තුළ ගැටුමකට වැටීමේ අවපාත 1/6 අවස්ථාවක් තිබේ.

මෙයට හේතුව දුප්පත්කම, වර්ධනය සහ යුද්ධය අතර ඇති දැඩි සහසම්බන්ධයයි.

බොහෝ විට ගැටුම් ඇති වන්නේ ආර්ථික එකතැන පල්වීම හේතුවෙනි. මෙයට හේතුව ආර්ථික එකතැන පල්වීම ආදායමට හානියක් වන අතර එය සිවිල් නොසන්සුන්තාවයට සහ මංමුලා සහගත ජනගහනයකට මග පාදයි. අවාසනාවන්ත ලෙස, දරිද්‍රතාවය විසින් ගෙන එන ලද යුද්ධ ආර්ථිකය තවදුරටත් විනාශ කරන අතර, එය තවත් ගැටුම් සඳහා කොන්දේසි ප්‍රතිනිෂ්පාදනය කරයි.

මේ දුක්ඛිත ලේ වැගිරීමේ චක්‍රය නිසා යන්තම් ගැටුමකට මුහුණ දී ඇති දුප්පත් රටවලට පළමු දශකය තුළ සාමය පවත්වා ගැනීමට සියයට 50ක ඉඩක් නැත.

එවැනි නොනවතින ගැටුම් දුප්පත් ජාතීන්ගේ ආර්ථිකයට මෙතරම් හානිකර වීමට එක් හේතුවක් නම්, ප්‍රචණ්ඩ ගැටුම් ආදායම් උත්පාදනය කිරීමේ සියලු නීත්‍යානුකූල මාධ්‍යයන් කඩාකප්පල් කිරීමයි. යුද්ධයට සහාය වීම සඳහා, සියලු නිෂ්පාදන මාධ්‍යයන් මිලිටරි අවශ්‍යතා සඳහා අණ දෙනු ලබන අතර, එමඟින් භාණ්ඩ වෙළඳපොළට දැකීම වළක්වන අතර එමඟින් වර්ධනයට තවදුරටත් හානි වේ.

නිදසුනක් වශයෙන්, යුද්ධය පවතින කාලවලදී, ආහාර ද්‍රව්‍ය එක්කෝ පරිත්‍යාග කරනු ලබන්නේ හෝ සොරකම් කරන ලද ගොවීන් විසින් එම භාණ්ඩ වෙළඳපොළට ගෙන ගොස් ජාතියේ ආර්ථික වර්ධනයට උපකාර කළ අය විසිනි. ප්‍රචණ්ඩත්වය. ආර්ථික වර්ධනයට යුද්ධයේ විනාශකාරී බලපෑම් දුප්පත්ම ජාතීන් දුප්පත් කරයි.

## 2 ස්වාභාවික සම්පත් උගුල

අලුතින් සොයාගත් ස්වභාවික සම්පත්වලින් ලැබෙන ආදායමෙන් ලෝකයේ දුප්පත්ම ජාතීන්ට යහපතට වඩා හානියක් කළ හැකිය.

විශේෂයෙන්ම තෙල් හෝ දියමන්ති වැනි වැඩි ඉල්ලුමක් ඇති සම්පතකින් ලැබෙන අතිරේක ආදායම රටකට ආර්ථික ස්වයං නිර්ණය ලබාගැනීමට පමණක් උපකාර කළ හැකි යැයි අපට බුද්ධිමය වශයෙන් සිතිය හැකි වුවද, යථාර්ථය සැලකිය යුතු ලෙස වඩාත් සංකීර්ණ වේ - මානසික අවපීඩනය ගැන සඳහන් නොකළ යුතුය.

ඇත්ත වශයෙන්ම, ඉහළ වටිනාකමක් ඇති ස්වභාවික සම්පත් සොයා ගැනීම ඇත්තෙන්ම රටකට ආර්ථික හා දේශපාලනික වශයෙන් හානි කළ හැකිය.

ස්වභාවික සම්පත් සොයා ගැනීම ලන්දේසි රෝගය ලෙස හැඳින්වෙන සංසිද්ධියක් හරහා දුප්පත් රටක ආර්ථිකයට බලපෑම් කළ හැකිය . ලන්දේසි රෝගය ඇතිවන්නේ රටක අලුතින් සොයාගත් සම්පත සඳහා ඇති ඉහළ ඉල්ලුම එහි අනෙකුත් අපනයනවලට හානියක් වන විටය.

උදාහරණයක් වශයෙන්, රටක් විශාල දියමන්ති නිධියක් සොයා ගන්නා බවත්, එය පතල් කැණීම සහ ජාත්‍යන්තර වෙළඳපොලේ විකුණන බවත් කියන්න. මෙම සම්පත සඳහා ප්‍රවේශය ලබා ගැනීමට ගැනුම්කරුවන් කැඟසද්දී, වැඩි වැඩියෙන් විදේශ මුදල් ඔවුන්ගේ ආර්ථිකයට ගලා එන අතර, ඔවුන්ගේ මුදල් මිල අධික වන අතර මිල ඉහළ යයි.

මෙය ඔවුන්ගේ ආර්ථිකය විනාශ කරයි, මන්ද යත් අඩු ඉල්ලුමක් ඇති අපනයනවලට ජාත්‍යන්තර වෙළඳපොලේ තරඟකාරීව සිටීමට නොහැකි වන නිසා ඒවායේ මිල ඉහළ ය. දියමන්ති කැණීමෙන් මේ රට පුදුමාකාර ආදායමක් අත්විඳිමින් සිටියද, පුළුල් ආර්ථිකය එකතැන පල් වනු ඇත.

ස්වභාවික සම්පත්වලින් විශාල ආදායමක් ලැබීමෙන් ආර්ථිකයට වඩා හානි සිදු වේ; මෙම ධනය දූෂිත දේශපාලකයන්ගේ බලය වැඩි කිරීමටද හේතු විය හැක.

ප්‍රමාණවත් විනිවිද භාවයක් නොමැති ආණ්ඩු තුළ, මෙම අතිරික්ත ආදායම පුද්ගලික අනුග්‍රහය සඳහා මුදල් සපයන අතර, අපේක්ෂා කරන - සහ දූෂිත - දේශපාලනඥයන් බලය ලබා ගැනීම සඳහා පුරවැසියන්ට හෝ මත නායකයින්ට අල්ලස් ලබා දෙයි.

මෙම දූෂිත දේශපාලකයන් බලය ලබා ගත් පසු, ඔවුන්ට වාසිදායක ක්‍රමයක් නිර්මාණය කිරීමට ඔවුන්ට නිදහස තිබේ.

දුප්පත්ම ජාතීන්ට බොහෝ විට අඩු අයවැය විනිවිදභාවයක් ඇත, එයින් අදහස් කරන්නේ දූෂිත දේශපාලකයන්ට අරමුදල් සුළු පිරිසක් අතට හරවා යැවීම පහසුය. මෙම දූෂණ සංස්කෘතිය ස්ථාපිත වූ පසු, එය සමස්ත පද්ධතියම

ආසාදනය කළ හැකි අතර, භාණ්ඩ ආදායම සොරකම් කිරීමෙන් ආයුධ කර්මාන්තය හෝ ඉදිකිරීම් වැනි වෙනත් අංශ වෙත ගමන් කරයි.

## 3 නරක අසල්වැසියන් සමග ගොඩබිමෙන් වටවී සිටීමේ උගුල

දුප්පත් ගොඩබිම් සහිත ජාතීන් ආර්ථික වර්ධනය සඳහා තම අසල්වැසියන් මත දැඩි ලෙස රඳා පවතී.

මෙම ගෝලීය වෙළඳපොළ තුළ ආර්ථිකයන් එකිනෙකට සමීපව සම්බන්ධ වී ඇති අතර, එක් රටක සාර්ථකත්වය අසල්වැසි දේශසීමා හරහා ගලා යයි. ගොඩබිම් සහිත රටවල් සඳහා මෙය විශේෂයෙන්ම සත්‍ය වේ; නිදසුනක් වශයෙන්, රටක වර්ධනය සියයට 1 කින් වැඩි වුවහොත්, සාමාන්‍යයෙන් එහි ගොඩබිම් සහිත අසල්වැසියන්ගේ ආර්ථිකය සියයට 0.7 කින් වර්ධනය වේ.

කෙසේ වෙතත්, මේවා ගෝලීය සංඛ්‍යාලේඛන; ඔවුන් ලෝකයේ දුප්පත්ම ජාතීන් සඳහා යථාර්ථයන් පිළිබිඹු නොකරයි. මෙම ජාතීන් තම අසල්වැසියන් විසින් ලබා ගන්නා සෑම සියයට 1 කටම සියයට 0.2 ක වර්ධනයක් පමණක් භුක්ති විඳිති.

දුප්පත් ගොඩබිම් සහිත ජාතීන් මෙහි මෙතරම් අවාසි සහගත බව පෙනෙන්නේ ඇයි?

එක් හේතුවක් වන්නේ කුඩා කර්මාන්ත සහිත දුප්පත් ගොඩබිම් සහිත රටවල් තම අසල්වැසියන්ගේ ප්‍රවාහන යටිතල පහසුකම් මත අතිශයින් රඳා පැවතීමයි. එපමණක් නොව, ඔවුන්ගේ අසල්වාසීන්ට ක්‍රියාකාරී ප්‍රවාහන කොරිඩෝව සම්බන්ධයෙන් ලබා දීමට ඇත්තේ අල්ප වශයෙනි, මන්ද ඔවුන් ද බොහෝ විට අන්ත දරිද්‍රතාවයෙන් පෙළෙන බැවිනි. මුහුදට ප්‍රවේශය ඇති අනෙකුත් ජාතීන්ට, අසල්වැසි දුප්පත් මාර්ග ඇති ගොඩබිම් සහිත ජාතීන්ට පහසුවෙන් භාණ්ඩ සැපයිය නොහැක, එබැවින් නැව්ගත කිරීමේ පිරිවැය වැඩි වන අතර වර්ධනය මන්දගාමී වේ.

ඔවුන්ගේ බොහෝ විට දුප්පත් අසල්වැසියන්ගේ සාර්ථකත්වය මත ඔවුන් රඳා සිටීම නිසා, දුප්පත්කමෙන් මිදීමේ උපාය මාර්ග ගොඩබිම් සහිත ජාතීන් සඳහා සීමා වේ.

එක් හැකියාවක් නම් තම රට වෙත ප්‍රවාහන කොරිඩෝව වැඩිදියුණු කිරීම සඳහා තම අසල්වැසියන් සඳහා ආධාර ඉල්ලා සිටීමයි. එබැවින් රට තුළට සහ ඉන් පිටතට භාණ්ඩ ප්‍රවාහනය කිරීමේ පිරිවැය අඩු කරන අතර, ගෝලීය වෙළඳපොළට වැඩි ප්‍රවේශයක් ලබා දෙන අතර වර්ධනය උත්තේජනය කිරීමට උපකාරී වේ.

තවත් හැකියාවක් වන්නේ උසස් තත්ත්වයේ ගුවන් තොටුපළවල් සංවර්ධනය කිරීමෙන් "වාතය අගුලු දැමීම" වළක්වා ගැනීමයි. මෙමගින් ඔවුන්ගේ අක්‍රිය අසල්වැසියන්ගේ ප්‍රවාහන යටිතල ව්‍යුහයන් මුළුමනින්ම මග හැරීමට ඔවුන්ට ඉඩ සලසයි, එමඟින් භාණ්ඩ ආනයනය කිරීම පහසු කිරීම මගින් ගෝලීය වෙළඳපොළට වැඩි ප්‍රවේශයක් ලබා දෙනු ඇත.

ගොඩබිම් සහිත වීම ජාතියක් දරිද්‍රතාවයට පත් නොකරන අතර, එය කිසිදු වාසියක් ලබා නොදෙන අතර ජාතියක ඉරණම එහි අසල්වැසියන්ගේ ඉරණම සමඟ සම්බන්ධ කරයි.

## 4 දුර්වල පාලක උගුල

දූෂිත දේශපාලන ක්‍රමයක් රජයන්ට වටිනා සම්පත් නාස්ති කිරීමට හේතු වන අතර ප්‍රතිසංස්කරණ සඳහා දරන උත්සාහයන් අඩාල කරයි.

චෙක්පත් සහ තුලන පද්ධති, රජයේ විනිවිදභාවය සහ සාධාරණ මැතිවරණ ක්‍රියාකාරී ප්‍රජාතන්ත්‍රවාදය සඳහා ප්‍රමිතීන් වේ, මන්ද ඒවා රජයේ දූෂණය සමාජවලට බලපෑ හැකි මාර්ගවලට සීමාවන් පනවා ඇත.

නමුත් සමහර සමාජවල මෙම චෙක්පත් සහ ශේෂයන් නොපවතී - සහ රජයේ දූෂණ සඳහා ඇති අවස්ථාව ඉතා ඉහළ ය.

අවම හෝ අක්‍රිය රජයක් ඇති රටවල දූෂණය සඳහා මෙම දිරිගැන්වීම විශේෂයෙන් ඉහළ මට්ටමක පවතින්නේ අන්ත දරිද්‍රතාවය ද පවතින රටවල ය. මෙයට එක් හේතුවක් නම්, මෙම රටවල අවම රාජ්‍ය විනිවිදභාවය ඉහළ සම්පත් ආදායමක් හෝ විශාල ජාත්‍යන්තර ආධාර සඳහා පරීක්ෂා නොකළ ප්‍රවේශයක් සමඟ ඒකාබද්ධ වීමයි. එබැවින් මෙම රටවල දූෂණය සාපේක්ෂව පහසු සහ ලාභදායී වේ.

එවැනි රටකට කදිම නිදසුනක් වන්නේ චැඩ් රාජ්‍යය, රජය පිළිබඳ දුර්වල පරීක්ෂාවන් සහ රාජ්‍ය මූල්‍ය පිළිබඳ විමර්ශනය අවම මට්ටමක පවතින රටකි. 2004 දී, මුදල් අමාත්‍යාංශය විසින් මුදා හරින ලද මුදලින් සියයට 1 ක් පමණක් මුදල් වෙන් කරන ලද ග්‍රාමීය ආධාර සායනවලට ඇත්ත වශයෙන්ම ලැබුණි. මෙම නඩුවේ නාස්තිය සාමාන්‍ය නිලධාරිවාදී අකාර්යක්ෂමතාවයට හුණු ගැසීමට නොහැකි තරම් ආන්තික ය - මුදල් පැහැදිලිවම සොරකම් කර ඇත.

අවාසනාවකට, දූෂණ චක්‍රය ආරම්භ වූ පසු එය බිඳ දැමීම ඉතා අපහසුය. දැනුවත් පුරවැසියන්ට වෙනසක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වුවද, එය උඩු යටිකුරු සටනකි. දූෂණයේ මුල් බැසගත් දේශපාලකයන්ට ප්‍රතිසංස්කරණවලින් ලැබෙන ප්‍රයෝජනය අල්ප බැවින් ඒ සඳහා ප්‍රචාරණය කිරීමට ඇති පෙළඹවීම් අල්පය. මන්ද යත්, ඌන රජයෙන් ඔවුන් සෘජුවම ප්‍රතිලාභ ලබන බැවිනි. ඔවුන්ට ප්‍රතිසංස්කරණ යනු හුදෙක් වැටුප් කප්පාදුවකි.

මෙය සංඛ්‍යාලේඛනවලින් ද පිළිබිඹු වේ. නායකයෙකු අසාර්ථක රාජ්‍යයක වැඩි කාලයක් බලයේ සිටින තරමට රට ආර්ථික පෙරළියක් කිරීමට ඇති ඉඩකඩ අඩුය. මෙහි තර්කය පාහේ පැහැදිලිව පෙනේ:

**රන් බිත්තරය දමන පාත්තයා මරා දමන්නේ ඇයි?**

මේ හේතුවෙන් ලෝකයේ අනෙකුත් රටවල්වලින් දුප්පතුන්ට ජාතින් අපසරනය කිරිමට හේතු වන අතර ඔවුන්ගේ අභිමතය පරිදි අත්හැර දැමීම මෙම රටවල් බොහෝ විට දුක්ඛිත හා අතෘප්තියේ ගර්මෝචකින් අවසන් වනු ඇත. මෙම රටවල් ඔවුන්ගේ උගුල්වලින් මිදීමට අවශ්‍යය විවිධ උපකරණ සඳහා කෙලින් මෙම පොත යොදා ගනී.

ඉහත උගුල් හතරෙන් එකක් හෝ එහි කිසියම් සංයෝජනයක් පහල බිලියනයේ තත්වය පිරිහීමට වගකිව යුතු බවත් ඒත්තු ගැන්වූ කොලින් උගුල් බිඳ දැමීමට සහ ආර්ථික සංවර්ධනය උත්තේජනය කිරිමට අවශ්‍යය පියවර ගෙන හැර දක්වයි.

1 ආධාර

2 හමුදාමය මැදිහත්වීම

3 නිතිමය ප්‍රඥප්ති

4 වෙළඳ ප්‍රතිපක්තිය

ඔහු විසින් පෙන්වා දෙන්නේ එක් එක් රටේ විශේෂිත උගුල හෝ උගුල මත රදා පවතින අතර එම නිසා එක් එක් රටේ සන්දර්භය පිළිබඳ ප්‍රවේශමෙන් සලකා බැලීම අවශ්‍යය වේ.

කොලින් විසින් ලියනලද මෙම THE BOTTOM BOLLION පොත මාක්ෂ්වාදය ප්‍රතිපක්ෂ වන අතර ලෝක බැංකු දෘෂ්ටිවාදයෙන් ලෝකයේ රටවල ආර්ථික නගා සිදුවීම සිදුකරන්නේ කේද්‍රය යන්නේ මෙම පොත පරිශීලනය කරන්නන් සිතේ තබාගත යුතුය.

**ආනන්ද ප්‍රේමසිරි**

සංවර්ධන නිලධාරි,

**ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය.**